මෙවර කවරය

ආගමන සමය තුළ අපි ක්‍රිස්තුස් වහන්සේගේ දෙයාකාර පැමිණීම සිහිපත් කරන්නෙමු. මෙවර කවරයේ පින්තූර තුළ අපට පෙන්වන්නේ දෙයාකාර පැමිණීමයි. පසු කවරයෙන් ජේසුස් වහන්සේගේ ඓතිහාසික පැමිණීමත්, මුල් කවරයෙන් උන් වහන්සේගේ දෙවන පැමිණීමත් පෙන්වයි. උන් වහන්සේගේ ඓතිහාසික පැමිණීමෙන් අපගේ ජීවිත වෙනස් කරගෙන ප්‍රීතිමත් වීමටත්, එසේ වෙනස් නොවන අයට ලැබෙන විපාකය මුල් කවරයෙන් අපට පෙන්වා දෙයි.

මුද්‍රණ අවසරය
අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා
කතෝලික - රාජගුරු ප්‍රසාදීන් වහන්සේ

ප්‍රධාන සංස්කාරක
ගරු ගයාන් හිරන්ත පියතුමා

පිටු සැකසුම
එච්.අයි.එස්. හෙට්ටිආරච්චි

මුද්‍රණය
අනුර ප්‍රින්ටර්ස් (පුද්ගලික) සමාගම
නො. 246, නුවර පාර,
කුරුණෑගල.

ලිපිනය
ප්‍රධාන සංස්කාරක පියතුමා
පහන්ටැඹ සඟරාව
ශ්‍රී හෘදයේ දේවස්ථානය
මැල්සිරිපුර.

දුරකථන අංකය
071 039 2087

විද්‍යුත් තැපෑල
gayanhirantha1987@gmail.com

පසු කවරයේ සිතුවම
මල්ෂා රෝමිණි

මිල රු. 100.00

පෙළගැස්ම

- සංස්කාරක සටහන 2
- ඇතුගල්පුර පදවි රදගුරු හිමිපාණන්ගේ පණිවිඩය 3-4
- මිදි උයනේ රිදී සීනු 5-63
- ජනසන්නිවේදනයේ රන් සලකුණ 7-8
- දශක දොකක මතක 8-13
- ගිහි පිළිසඳර 14-15

පුදබිමක වරුණ

- සියවස් ජුබිලිය සැමරු 16-18

නැණස

- සුවමිණි වදන් 19
- ඇතුගල මතින් පෑයු සඳ 20-21
- English Without tears 22-23
- බෙත්ලෙහෙමේ නත්තල් 24-25
- මෙරට කිතුණු ඇදහීමේ ආවර්ජනයක් 25-27
- මනෝවිද්‍යාත්මක උපදේශනය තුළින් පුද්ගල හා සමාජ සංවර්ධනය ඇති කරයි. 28
- රුසියානුන් කියන කතා 29
- පුරසාරම් 30
- එඬේරාගේ කටහඬ 31
- මා කුඩා කළ නත්තල සැමරු හැටි 32
- ආච්චියි... සීයයි... 33
- විශ්වාසය කොතනද ? 34
- කියා දන්වන වග නම් 34

ධර්ම ප්‍රදීපය

- විශ්වාසයේ ජීවිතය බලගන්වන ජපමාලය 35
- ගැලවීමේ හේතුව වූ මරියාවෝ 36-37
- නත්තල දෙසැම්බර් 25 වන දිනට යෙදුණේ.... 38
- සඟපුර වැසියෝ 39-40
- ශූ.තෝමස් මුනිතුමා 41-42
- නිරතුරු දෙව් මව් පසසමු 43
- එදා සහ අද නත්තල් 44-45
- අසීමිත වූ දේව ප්‍රේමය 46-47
- නිමල් අල්මේදා 48

පන්හිඳ

- නිර්මාණ 49-51
- කෙටි කතාව 52-55

පහන් තරු 56

දැන්වීම් 57-58

සිව් දෙස 58-63

ගවේෂණ

- නත්තල් දිව්‍ය පූජාවේ හැඳින්වීම 64
- නත්තලේ ඉතිහාස කතාව 65-69
- නත්තලේ සැබෑ ආලෝකය 70

පුංචි සිත්තරු 71-72

සංස්කාරක පිය සටහන්

නියම නත්තල ජේසුස් වහන්සේගේ උපත සිහිකිරීමෙන් පමණක් අවසාන වන්නේ නැහැ. සැබෑ නත්තල කියන්නේ ජේසුස් වහන්සේගේ උපතින් ඇතිවූ ආලෝකය අපගේ හදවත් තුළත් ඇති කර ගැනීමයි. සරළ වචනයෙන් කියනව නම් ජේසුස් වහන්සේ ලෝකයාට ගෙනාපු සාමය, ප්‍රේමය, ඉවසීම, බැගෑපත්කම, නිහතමානීකම, පරිත්‍යාගය, සමාව දීම වගේ යහපත් ගතිගුණ අපගේ හද තුළ ඇති කර ගැනීම මේ නත්තලේ සැබෑ අර්ථය ඉස්මතු කරනවා. එනිසයි, ජේසුස් වහන්සේගේ උපත එහෙම නැත්තම් නත්තල උත්සවයකට දිව්‍ය පුජාවකට පමණක් සීමා වන්නේ නැත්තේ. මේක ලෝකයක් එකතුව සමරන නමුත් අර්ථය හරි හැටි නොදන්නා උත්සවයක් බවට මේ වන විට පත් වෙලා තියෙනවා. මේ නත්තල අපි අර්ථවත්ව සමරන්නට උත්සාහ දැරිය යුත්තේ, අපේ හිත්වල පිරිලා තියෙන අයහපත් ගතිගුණ වලින් මිදිලා යහපත සැම දෙනාට දෙන්නට උත්සාහ කරන ආදරණීය බවකින් අපේ හදවත් පුරවා ගැනීම තුළිනුයි.

එනිසා මේ නත්තලේ ජේසුස් වහන්සේට සාම්ප්‍රදායික විදියට ගවහලේ හුදකලාව ඉපදෙන්නට ඉඩ නොදී, අපගේ හදවත් තුළ ජේසුස් වහන්සේට ඉපදෙන්නට ගවහලේ ගව ඔරුව බවට පත් කර ගන්නට තරම් අපි බැගෑපත් විය යුතුය.

මේ නත්තලේ අපි හැම දෙනාම පවුලක් විදියට එකතු වෙලා දේවස්ථානයට එකතු වෙලා ශුද්ධ වූ පවුල් විදියට මේ මුළු මහත් ලෝකය වෙනුවෙන් යාඤා කරමු. මේ අභාග්‍ය සම්පන්න අවස්ථාවේ පීඩිත ජනතාව සමඟ හැකි අයුරින් නත්තලේ සැබෑ අරුත බෙදා ගන්නට උත්සාහ දරමු.

එලෙසම ලබන වසර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට කැප කර ඇති නිසා අප පෞද්ගලිකව දිව්‍ය සත්ප්‍රසාදයේ ජේසුස් වහන්සේව අත්දකින්නට උත්සාහ දරමු.

ඒ වගේම මේ සැරේ බොහෝ දෙනාගේ ඉල්ලීම පරිදි නැවත පහන්ටැඹ සඟරාව සුපුරුදු පරිදි ඒ ප්‍රමාණයට මුද්‍රණය කරන්නට පියවර ගත්තත් එක සඟරාවක් මුද්‍රණය කරන්නට රුපියල් 150 ක පමණ මුදලක් වැය කිරීමට සිදු වෙලා තියෙනවා. එබැවින් සඟරාව කියවන පාඨක ඔබගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ ප්‍රදේශයේ වෙළෙඳ දැන්වීම් පළ කිරීමට කැමති අයගේ සහයෝගය අප වෙත ලබා දෙන ලෙසයි. එලෙසම සඟරාවට ඔබගේ නිර්මාණ දායකත්වය ලබා දීමට කැමති නම් මීසම් භාර පියතුමා දිව්‍ය හෘදයේ දේවස්ථානය, මැල්සිරිපුර යන ලිපිනයට ඔබගේ නිර්මාණ ජනවාරි මස අවසන් වීමට පෙර ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඔබ සැමට සුභ නත්තලක් හා සුභ පැතුම් ඉටුවන නව වසරක් පතමි.

ගයාන් හිරන්ත පියතුමා
සංස්කාරක,
දිව්‍ය හෘදයේ දේවස්ථානය,
මැල්සිරිපුර.

විශේෂ ස්තුතිය, සිඛිනි, ජ්ඝින්තා ඇල්නස්, තරංගා යන බහන්ම බහන්ගින් වෙත...

2025 වර්ෂයේ නිමාවීමත් සමඟ කිතුනු අප සැමරීමට සූදානම් වන සිරිලක නත්තල

ඕනෑම සුබදායක නොවේ



අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා
වයඹ පළාත් - කුරුණෑගල
කතෝලික රාජගුරුප්‍රසාදින් වහන්සේ

2025 වර්ෂයේ නිමාවීමත් සමඟ කිතුනු අප සැමරමට සුදානම් වන සිරිලක නත්තල ඒතරම් සුබදායක නොවන බව කාටත් වැටහේ. නත්තල ඔබටත්, මටත් ගෙන එන්නේ සැබැවින්ම ප්‍රීතිමත් පණිවිඩයකි. ප්‍රීතිමත් සංකල්පයකි. එහි ගැබ්වෙන සුවිශේෂී අරමුණු මේ පොළොව මත ස්ථාපිත කිරීම අප සියලුම දෙනාගේ වගකීමකි.

මෙම වර්ෂය පුරාම විවිධ වූ තාඩන පීඩනයන්ට අප රට ගොදුරු වී හෙම්බත්ව සිටින මේ අවස්ථාවේ, ස්වභාවික ව්‍යවසනයෙන් ඇතිකළ ගංවතුර හා නායයෑම් යන ස්වභාවික ආපදා හේතුවෙන් මෙරට බොහෝ දෙනෙකුට සිදුවූ ජීවිත හානි හා දේපළ හානි මේ තාක් යැයි කිව නොහැක. මෙම ආපදා තත්ත්වයන් හේතුවෙන් කිතුනු අපගේ නත්තල සැමරීම සීමා කිරීමට අපට සිදුවේ.

"අති උසස් තැන්හි දෙවිඳුන්ට මහිමය ද මිහි පිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා,යි දේවදූතයන් ගැයූහ. (ශු. ලූක් 2 : 14)

කිතු උපතේ මහිමය සකල විශ්වයටම ගෙන එන සාමයේ පණිවිඩය සෑම දිනටම කාලෝචිතය. සිත් සාමය, සැනසීම තොරොම්බල් වී, ස්වභාව ධර්මය සාතන්ගේ බලයෙන් සොරාගෙන තිබෙන වේදනාත්මක කාල පරිච්ඡේදයක, දෙවිඳු සරණ මිහිමතට පතිත වන්නේ නම් එය මහත් අස්වැසිල්ලක් යැයි සෑම මුවකින්ම පවසනු ඇත.

වසරක් පුරාවට පොදිබැඳගත් හීන, සාරධර්ම හා ගොඩනැගාගත් මනුෂ්‍යත්වය, බෙදාහදාගැනීම, ගෞරවය ආදිය යටපත් කරවීමට විවිධ බලවේග වර්ධනය වුවත්, මනුෂ්‍යත්වයේ නාමයෙන් ඒ සියල්ල ජයගැනීමට ජේසු බිළිඳාණන් ලොවට ගෙනා සාමයේ නත්තලට හැකිවූ බව සිහිපත් කරමු. පසුගිය දිනයන්වලදී වත්මන් සමාජය දූෂණය කරන අනේක විධ බලවේගයන්ට වඩා ස්වභාවික ආපදා මුළු මිනිස් සංහතියකගේම අනාගත ජීවිත තත්ත්වයන්ට බලපෑ බව සිහිපත් කරගනිමු. ස්වභාව ධර්මයේ විවිධ රුදුරු ප්‍රහාර මධ්‍යයේ ජීවිත සමඟ පොර බඳිමින් සෑම අයෙකුගේම මුවඟට සිනා පොදක් ගෙනෙන්නට අපට හැකියාව ඇත්තේ මේ උතුම් නත්තල තුළිනුයි.

මැවිල්ල බිඳී සුනු විසුණු වී ඇත්තේ පාපය නිසාය. දුක් වේදනා ලෝකයට ඇතුළු වූයේ දෙවියන් වහන්සේ වේදනාවට ප්‍රිය කරන නිසා නොව, පාපය තුළින් මැවිල්ල තුවාල වූ නිසා බව ශුද්ධ බයිබලය උගන්වයි. **"මැවිල්ල කලකිරීමට පත් වූයේ..... මැවිල්ලම දිරාපත්වීමේ වහල් භාවයෙන් නිදහස් වන බවට බලාපොරොත්තු වෙනි."** (රෝම 8 : 20 - 21)

ස්වභාවික විපත් යනු මැවිල්ල තවමත් යථා තත්ත්වයට පත්කර නොමැති බවට ලකුණකි. ලෝකය සුවය ලැබීමට බලා සිටින දෙයක් මෙන්

කෙඳිරිගායි. **"මුළු මැවිල්ලම මේ කාලය දක්වාම දරු ප්‍රසූතියේ වේදනාවෙන් මෙන් කෙඳිරිගාමින් සිටින බව අපි දනිමු."** *(රෝම 8 : 22)*

දෙවියන් වහන්සේ නපුරේ කතුවරයා නොවේ. දෙවියන් වහන්සේ නපුර නිර්මාණය නොකරන බවත්, දුක් විඳීමෙන් සතුටු නොවන බවත් ශුද්ධ ලියවිල්ලේ පැහැදිළිය. **"මක්නිසාද, මම කිසිවෙකුගේ මරණය ගැන සතුටු නොවෙමි."** යනුවෙන් සම්ඳාණන් වහන්සේ ප්‍රකාශ කරයි. *(එසකියෙල් 18 : 32)*

"දෙවියන් වහන්සේ ආලෝකය ය, ඔහු තුළ කිසිසේත් අන්ධකාරයක් නැත." යනුවෙන් සම්ඳාණන් වහන්සේ ප්‍රකාශ කරයි. *(යොහන් 1 : 5)*

වැටුණු ලෝකයක දෙවියන් වහන්සේ දුක් වේදනාවලට ඉඩ දුන්න ද, උන්වහන්සේ යහපත්, දයානුකම්පිත සහ බිඳුණු සිත් ඇත්තන්ට සමීපව සිටිති. **"සම්ඳාණන් වහන්සේ බිඳුණු සිත් ඇත්තන්ට සමීපව සිටින අතර තැළුණු ආත්මයන් ගළවයි."** *(ගීතාවලිය 34: 18)*


දුක් විඳීම, වේදනාව, ස්වභාවික විපත් සැබෑ පරිවර්තනය සඳහා කැඳවීමක් විය හැකිය. අවසානයේදී, දෙවියන් වහන්සේ සියලු දුක් වේදනා අවසන් කරනු ඇත. ශුද්ධ බයිබලයේ අවසාන වචනය වස්සානය නොව නැවත පිහිටුවීමයි.

කිතු උපතේ 2025 වසර සමරණ සුවිශේෂී නත්තල මෙයයි. සංඝමනයේ සභාවේ නැංගුරම් නැවතත් ලිහිල් කර බලාපොරොත්තුවේ වන්දනා නඩයක් ලෙස නැවතත් ගමන අරඹන්නට කාලය උදාවී ඇත. කුරුණෑගල රදගුරු වසමේ අපට චම සංඝය, දිව්‍ය සත්ප්‍රසාදීය සංඝයක් ගොඩනඟන්නට කෙරෙන ඇරඹුමක මෞලි මංගල්‍යයයි.

අප නත්තල සමරන්නේ දිළින්ඳන් සමඟයි. අපගේ පළමු නත්තල සැඟවී ඇත්තේ දිළින්ඳාගේ පැළ තුළය. වීදී මාර්ගවල කිතු උපත පතුරනවාට වඩා මෙවර නත්තල මරණයේ අභිමුව ගොළුවන හදවත්වලට පණ දෙන්නට තනන ආපදාවන්ගෙන් විපතට පත් අපේම සහෝදර ජනතාවට සහනයක් වන චිකමුතුකම පෙරදැරි කරගත් මෙවර නත්තල තුළ, ක්‍රිස්තුන් වහන්සේගේ උතුම් ආගමනය මනාව ගම්‍ය වේ. වාණිජමය රැල්ලට යටපත් වී, විවිධ අරමුණු ඔස්සේ හඬායෑම නොව, ස්වභාවික ආපදා මධ්‍යයේ නත්තලේ ගැඹුරු හරය සෑම අයෙකුගේම සිත් තුළ ජීවමාන කරවීමට අප උත්සාහ ගැන්විය යුතුයි.

ඔබේ නිවසේ ආලෝකමත් සිරියෙන් බබළන නත්තල, දුගියාගේ යටපත්වී යන හීන තුළත් එසේම, ආලෝකමත් කරවීමටත්, මේ සියලු වේදනාවන් දෙවියන් වහන්සේට කැපකරමින් විශ්වාසය තුළ මෙම **අසිරිමත් නත්තල ඔබටත්, ඔබගේ පවුලේ සියලු දෙනාටත් සියලු ප්‍රාර්ථනා ඉටුවන සුබ නත්තලක් සහ 2026 වසර වාසනාවන්ත නව වසරක් ද වේවා!**

හැරල්ඩ් ඇන්තනී පෙරේරා
වයඹ පළාත් - කුරුණෑගල
කතෝලික රාජගුරුප්‍රසාදීන් වහන්සේ



මිදී ඵලයන්නේ ඊදී සිතූ



වසර 2025 දී ඇතුගල්පුර පදවියේ කිතුනු විශ්වාසය රැකගනිමින් දේව ජනතාව සමිඳුන් වෙතට රැගෙන යන්නට සුභාරංචිය දේශනා කිරීම තම කැරිස්මාව කරගත් පූජක පුතුන් තුන්නමක් 25 වන පූජක සංවත්සරයන් සැමරූහ.

උන්වහන්සේලාගේ වතගොත හා විසි පස් වසරක සේවාව පිළිබඳ කෙටි විස්තරයක් ගෙන එමු.

ගරු මිල්රෝයි ෆ්‍රැන්සිස් පූජාප්‍රසාදීන්වහන්සේ



1966 ඔක්තෝබර් මස 12 වන දින ගාලු පුරවරයේ කලේගාන ග්‍රාමයේ කොර්නේලියා විජේතුංග කරුණානායක මැතිණිය හා ජස්ටින් එමානුවෙල් ෆ්‍රැන්සිස් (නැසීගිය) මහතාට දාව උපත ලද ඔහු පවුලේ දරුවන් හය දෙනාගෙන් හතර වැනියා විය. ඔහු මූලික අධ්‍යාපනය ගාල්ලේ මිහිරිපැන්න මහ විද්‍යාලයෙන් සහ ද්විතීයික අධ්‍යාපනය ගාල්ලේ ඇලෝෂියස් විද්‍යාලයෙන් ලබා ගත්තේය.

ඉන්පසු 1992 දී මිල්ලව සා.ජෝසප් වාස් කනිටු දෙව්සත්හලට ඇතුලත් විය. එහිදී ඔහුගේ ආත්මික අධ්‍යක්ෂක පියතුමා වූයේ ගරු කෙනත් පෙරේරා පියතුමාය.

1993-2000 දක්වා කාල පරාසය තුළදී අම්පිටිය ලංකා අප ස්වාමිදුවගේ දෙව්සත්හලේ පූජක පුහුණුව හැදෑරීය.

වසර 2000 සැප්තැම්බර් 09 වන දින එවක කුරුණෑගල පදවි රදගුරු තැන්පත් අති උතුම් රේමන්ඩ් පීරිස් රදගුරු හිමිපාණන් අතින් කුරුණෑගල සාන්ත ආනා ආසන දෙව් මැඳුරේදී පූජක වරම් ලබා ගන්නා ලදී.

ගරු මිල්රෝයි ෆ්‍රැන්සිස් පියතුමා කුරුණෑගල පදවිය තුළ විවිධ අවස්ථාවලදී, මරිය හමුදාව, වින්සෙන්ති පාවුලා සමිතිය, ලක්‍රිවි සමිති සමාගම් භාරව කටයුතු කළ අතර, ශා.ජෝසප් වාස් කමිටුවේ ද සාමාජිකත්ව දැරීය. මේ වසර මුලදී උන්වහන්සේ අනුරාධපුර පදවියට සුභද මාරුවීමක් ලබා තලාව සාන්ත ජූඩ් අපෝස්තුළුවරයාණන්ගේ දේවස්ථානයේදී සිය 25 වන ජුබිලි සංවත්සරය 2025 සැප්තැම්බර් 07 වෙනි දින සැමරූහ.

ඇති ගරු නලීන් ප්‍රනාන්දු පූජාප්‍රසාදීන් වහන්සේ

1971 මාර්තු මස 01 වෙනිදා හලාවත දෝන රීටා පද්මිණි මැතිණිය හා ඒ.ජෝසප් ප්‍රනාන්දු (නැසීගිය) මහතාට දාව උපත ලැබූ ඔහු එම පවුලේ දරුවන් පස් දෙනා අතර දෙවැන්නා විය.

ආත්මික අධ්‍යක්ෂ පියතුමා වූ ගරු නෝබට් ප්‍රනාන්දු පූජාප්‍රසාදීන් වහන්සේ මගින් මුල් වරට 1987 මැයි මාසයේ මාරවිල සාන්ත පාවුළු කනිටු දෙව්සත්හලට හා පසුව එම වසරේ ම දෙසැම්බර් මස කුරුණෑගල පදවියේ අළුතින් බිහිවූ සාන්ත ජූසේ වාස් කනිටු දෙව්සත්හලට ඇතුළත් කරනු ලැබීය.

ඉන්පසු කළුතර ''දහම් සෙවන'' හා 1993-2000 අතර කාලවකවානුවේ අම්පිටිය ලංකා අප ස්වාමිදුවගේ දෙව්සත්හලෙන් තම පූජක පුහුණුව සම්පූර්ණ කරගන්නා ලදී.

2000 වසරේ සැප්තැම්බර් 09 වන දින කුරුණෑගල පදවි එඩේරාණන්වූ අති උතුම් රේමන්ඩ් පීරිස් රදගුරු හිමිපාණන් අතින්



කුරුණෑගල සාන්ත ආනා ආසන දෙව්මැඳුරේදී පූජක වරම් ලැබීය. ඉන් අනතුරුව එතුමා රෝමයේ උර්බානියා ශුද්ධාසන විශ්ව විද්‍යාලයෙන් සහා නීතිය පිළිබඳ උපාධිය ලබා ගන්නා ලදී.

එතුමා කලක් පදවි තරුණ සංවිධානයේ හා දේවධර්ම නිකේතනයේ අධ්‍යක්ෂ ධූරය හොබවනු ලැබූ අතර, අම්පිටිය ජාතික දෙව්සත්හලේ කථිකාචාර්යවයෙකු ලෙසත් කටයුතු කරන ලදී. අප පදවියේ මරිය හමුදාව භාරව නලීන් පූජාප්‍රසාදීන්වහන්සේ ඉමහත් සේවාවක් ඉටු කළහ.

මේ වනවිට පැල්ලන්දෙණිය මීසමේ සේවය කරන උන්වහන්සේ තම සෞඛ්‍ය තත්වය ගැන පවා නොසලකා උපරිමයෙන් සියලු වගකීම් මැනවින් ඉටුකරමින් තම මීසම් ජනතාවගේ අවශ්‍යතාවයන් කෙරෙහි ඇප කැපවී කරන අනගි සේවාවන් පිළිබඳව අප සැමගේ හෘදයාංගම ස්තුතිය හිමිවිය යුතුව ඇත.

ගරු ඇන්ඩෘ ෆොන්සේකා පූජාප්‍රසාදීන් වහන්සේ

1959 නොවැම්බර් 05 වෙනි දින කටුපොත කිරිමැටියාවේ පී.ස්ටීවන් ෆොන්සේකා සහ එම්. කේ. එස්තර් ප්‍රනාන්දු යුවලට දාව උපත ලැබූ ඔහු දරුවන් සතර දෙනෙකුගෙන් යුත් පවුලක වැඩිමලා විය. ඔහු මූලික අධ්‍යාපනය කිරිමැටියාව කනිෂ්ඨ මහ



විදුහලෙන් සහ නක්කාවත්ත මධ්‍ය මහා විදුහලෙන් ද ද්විතියික අධ්‍යාපනය කුරුණෑගල සාන්ත ආනා විදුහලෙන්ද ලබා ගත්තේය. ගරු සිල්වෙස්ට විජයකුලසූරිය ආත්මික අධ්‍යක්ෂ පියතුමා විසින් ඔහු මාරවිල සාන්ත පාවුළු කනිටු දෙව්සත්හල වෙත 1987 දී ඇතුළත් කරනු ලැබීය.

පසුව කුරුණෑගල ශුද්ධවර ජුසේ වාස් කනිටු දෙව්සත්හල වෙත ඇතුලත් කරනු ලැබීය. 1992-1999 කාල පරාසය තුළදී කළුතර හා අම්පිටිය ලංකා අප ස්වාමිදුවගේ දෙව්සත්හලේ පූජක පුහුණුව සම්පූර්ණ කරන ලදී.

1999-12-09 දී තේවාචාර්යවරයෙකු ලෙස කුලියාපිටිය දේවස්ථානයේ සේවය කළ අතර 2000 ජනවාරි 29 වෙනිදා කුරුණෑගල පදවියේ අති උතුම් රේමන්ඩ් පීරිස් රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙතින් කිරිමැටියාවේ සාන්ත සෙබස්තියන් දෙව් මැඳුරේ දී පූජාත්වරය ලැබීය.

මේ අතර උන්වහන්සේ රෝමයේ උර්බානියා ශුද්ධාසන විශ්ව විද්‍යාලයෙන් ''ධර්මෝපදේශ සහ එඩේරික දේවධර්මය'' පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හිමිකර ගත්තේය.

ගරු ඇන්ඩෘ ෆොන්සේකා පූජාප්‍රසාදීන් වහන්සේ, මල්පිටිය, තල්ගහපිටිය, දුනකදෙණිය සහ ඉරබඩගම මීසම් භාර පියතුමා ලෙස සේවය කළ අතර, දැනට වල්පිටගම මීසම් භාර පියතුමා ලෙස කටයුතු කරනු ලබයි. තවද එතුමා ශුද්ධාසනීය ධර්මදූත සංගමයේ පදවි අධ්‍යක්ෂ පියතුමා ලෙසත්, කුලියාපිටිය දිසා භාර පියතුමා ලෙසත් කලක් කටයුතු කර ඇත.

o o o o o

උන්වහන්සේලා විසින් සමිඳු කෙත සාරකන්නට ඩහදිය, කඳුල වගුරා ගතවූ පස්විසි වසර සමරමින් සමිඳුන්ට තුති පුදමු.තව තවත් විපුල පළ දරන්නට අවශ්‍ය දිරිය, සවිය, සුදත් ආලෝකය නිබඳව ප්‍රාර්ථනා කරමු.

සටහන
සිරිල් පෙරේරා

ඇතුගල්පුර පදවි ජනසන්නිවේදන අපෝස්තලික සේවාවේ රන් සළුකුණ

දහම් දානීය මෙහෙවර උදෙසා පන්හිඳෙන් දස්කම් විස්කම්, නිසඟ හැකියාවන් ලෙස දායාද කොටගෙන දේව සේවාවට එක්ව සසුන් කෙත සිසාරා සුබ වදන වපුරමින් ඇතුගල්පුර පදවි ජනසන්නිවේදන අපෝස්තලික සේවාවේ කිතුගොස නංවන්නට අඛණ්ඩව වසර දහයක් සමඟ දහසය වසරක් කැපකළ නියමුවාණන්වූ ගෞරවනීය ආනන්ද වීරකෝන් පූජාප්‍රසාදීන් වහන්සේ එම සේවාවෙන් සමුගැනීම නිමිත්තෙන් ඒ අතීත පියසටහන් අවලෝකනය කිරීම මෙම ලිපියේ අරමුණයි.



නවක පූජකතුමෙකු ලෙසින් දේව සේවයට පිළිපන් අවධියේදීම එනම් 1999 දී ජනසන්නිවේදන අපෝස්තලික සේවාවට අත්පොත් තබන්නේ සහායක අධ්‍යක්ෂ තනතුරින් පිදුම් ලබමිනි. (පූජක වරම් ලබන්නේ 1998 අගෝස්තු මස 24 වෙනි දිනදීය.) අනතුරුව 2001 වසරේදී එහි ප්‍රධාන අධ්‍යක්ෂ ලෙස පත්වී අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ අනුශාසකත්වය යටතේ දැවැන්ත සේවාවක අඩිතාලම දැමීය. ඒ අතරම ''පහන් ටැඹ'' සඟරාවේ ප්‍රධාන සංස්කාරක ධූරය දරමින් විවිධ විශේෂාංග සහිතව එළිදක්වා පාඨකයන් අතර ජනප්‍රිය සඟරාවක් බවට පත් කරන්නට ගත් තැනද කැපී පෙනුණි.කුරුණෑගල පදවියට වසර විසි පහක් සපිරීම වෙනුවෙන් 2012 දී ''ප්‍රණාම පූජා'' නමින් එය ඓතිහාසික අගයකින් යුක්තව එළි දැක්වූයේ උන්වහන්සේ ගේ නිර්මාණාත්මක හැකියාවන් විදහා පාමිණි.

දේව සේවයට පිවිසෙන්නටත් පෙරාතුව පටන් සුබ වදනේ දූතයෙකු ලෙසින් සිය තලෙන්තු මුදා හරිමින් කිතුනු පුවත්පත් හා ජාතික පුවත්පත් ද සැරසූ උන්වහන්සේට පදවි ජනසන්නිවේදන සේවාව සිය අභිලාෂයන් සඳහා හොඳ තෝතැන්නක් වූවා නිසැකය. 2003 වසරේ දී විදේශ අධ්‍යාපනය සඳහා ඉන් සමුගත් අතර, 2015 දී යළි අධ්‍යක්ෂ තනතුර හිමිවූ උන්වහන්සේ 2025 වනතුරුම අඛණ්ඩව සේවාවක් ඒ තුළ ඉටු කළහ.

විවිධ අභියෝගයන් හමුවේ වුවද පදවිය තුළ පමණක් නොව, ජාතික මට්ටමින්ද සිය මාධ්‍ය සේවාව, ප්‍රශස්ත ලෙස දියත් කරන්නට උන්වහන්සේ විසින් දරන ලද ප්‍රයත්නයන් අප්‍රමාණය.

ජාතික වශයෙන් සුවිසල් පරාසයක ජනතාව ඇමතීමට ගුවන්විදුලි හා රූපවාහිනී වැඩ සටහන් උපයෝගී කරගත් අවස්ථා රැසකි. විවිධ කුසලතාවයන් වැඩි වර්ධනය කරගැනීමට අවස්ථාව සලසමින් ඒ ඒ අංශයන්හි ප්‍රවීනයන් ලවා වැඩමුළු පැවැත්වීම, ලෝක සන්නිවේදන දිනය උත්සවාකාරයෙන් වාර්ෂිකව සැමරීම, සම්මාන ප්‍රදානය, සාමාජිකයන්ගේ අධ්‍යාත්මික වර්ධනය සඳහා ධර්මවිවේක, වන්දනා චාරිකා ඇතුළුව වර්ෂය පුරා විවිධ වැඩසටහන් දියත් කිරීම මෙම කාල සීමාව තුළදී නොකඩවා සිදු කෙරුණි.

මෙම කාර්යයන් ක්‍රියාත්මක කරන අතරතුර මාධ්‍ය කමිටු සාමාජිකත්වය වෙත දායාද කළ දෑ මෙහිදී කෘතවේදීව සිහිපත් කළ යුතුව ඇත.

''තමන් ළඟ නැති දෙයක් අන්‍යයන්ට දිය නොහැක.'' යන සිද්ධාන්තයෙහි පිහිටා, දේව

වචනය-සුබ වදන, අන්‍යයන්ට බෙදා හැරීමට පෙරාතුව තමන් ඒ තුළ පැවතිය යුතු බව නිතරම උන්වහන්සේ අවධාරණය කරමින් ඒ සඳහා ඉඩ හසර විවර කර දුන් අයුරු සිහියට නැගේ.

එමෙන්ම නිර්මාණශීලීභාවය හා නිරවද්‍යතාවය නිතරම අපේක්ෂා කළා පමණක් නොව, ඒ සඳහා සමාජිකත්වය හුරු පුරුදු කරන්නටද අමතක කළේ නැත.

වසර කීපයක් මුළුල්ලේ දැඩි ප්‍රශ්නයක් දරා, උන්වහන්සේගේ සංකල්පයත් මල් පල ගන්වමින්, පදවියේ ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ රැසක් එක්තැන්කොට ''ඇතුගල්පුර පදවි නිර්මාණ සංග්‍රහය'' එළි දක්වා පිටස්තර පදවි වල පවා අගැයීමට ලක්වූ අයුරුද මෙහිදී සඳහන් කළ යුතුය.

ඇතුගල්පුර පදවි ජනසන්නිවේදන අපෝස්තලික සේවාව 1988 දී අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ නායකත්වය යටතේ ඇරඹී අධ්‍යක්ෂ පියතුමන් කීප දෙනෙකුගේ දැවැන්ත කැපවීම මත දිගු ගමනක පිය සටහන් යටගියාවේ ඇත. ගරු ජෙරල්ඩ් ප්‍රනාන්දු පූජාප්‍රසාදීන් වහන්සේ, අතිගරු පියල් ජානක පූජාප්‍රසාදීන්වහන්සේ, අතිගරු ප්ලැසිඩස් ද සිල්වා පූජාප්‍රසාදීන් වහන්සේ ද මෙම අපෝස්තලික සේවාවට අදාළ වූ සියලු අවශ්‍යතා සපුරමින් කළ සේවාවද කෘතවේදීව සිහිපත් කළ යුතුය. එමෙන්ම සියලු කාර්යයන්හිදී නිබඳව සහාය දක්වන්නට කාරුණික වන අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා රදගුරු හිමිපාණන්ට ද කෘතවේදී වෙමු. මෙම අපෝස්තලික සේවාවේ වත්මන් නියමුවාණන් ලෙස පත්ව ඇති ගරු නවීන් ලක්ෂාන් පූජාප්‍රසාදීන් වහන්සේ හා ''පහන් ටැඹ'' නිළ සඟරාව පාඨකයන් අතට පත් කිරීමේ දැවැන්ත කාර්යභාරය පැවරී ඇති ගරු ගයාන් හිරන්ත පූජාප්‍රසාදීන් වහන්සේ ද සාරවත් දිගු ගමනක ආරම්භය සනිටුහන් කර ඇති මේ මොහොතේ මෙම අපෝස්තලික සේවාවේ ස්වර්ණමය යුගයක් උදාකරන්නට හැකි වනසේ ශුද්ධාත්ම වරම් අයදිමු.

අඛණ්ඩව වසර දහසයක දිගු කාල පරාසයක් තුළ පදවි ජනසන්නිවේදන සේවාව පෝෂණය කළ අතිගරු ආනන්ද වීරකෝන් පූජාප්‍රසාදී තුමෙනි,

ඔබ වහන්සේට අපි සමු දෙමින් තුති පුදමු.

සටහන
ඇතුගල්පුර පදවි මාධ්‍ය පර්ෂදය

දිගුක දෙකක මතක

ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා

1954 ජනවාරි 20 දින සිමියොන් පීරිස් මහතාට හා ඇනී පැට්‍රිෂියා මානාවට දාව මොරටුව කොරළවැල්ලේ දරුවන් හත් දෙනෙකුගෙන් යුතු පවුලක බාලයා ලෙස මෙලොව උපන් ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා පළමුව ෆ්‍රැන්සිස්කන් නිකායේ සහෝදරතුමෙක් ලෙස කොච්චිකඩේ පල්ලන්සේන, බෝලවලාන ප්‍රදේශයන් වල සේවය කොට, පසුව එම නිකායෙන් ඉවත්ව කුරුණෑගල පදවියේ පූජාප්‍රසාදී තුමෙක් ලෙස මීසම් සේවයට එක් වෙයි. එතුමා කොළඹ සිට කුරුණෑගලට එන ගමනේ මුලින්ම බසයෙන් බසින්නේ මල්පිටිය සා.සෙබස්තියන් මුනිදුන්ගේ දේවස්ථානයේ එකල සේවය කළ ෆ්‍රැන්සිස්කන් නිකායේ



කලක් සේවය කළ පියතුමෙක් වූ ගරු ජස්ටින් වර්ණකුල පියතුමා මුණ ගැසීමේ අටියෙනි.

ගරු ජස්ටින් පියතුමා, එවක සහෝදරතුමෙක් වූ ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාව කුරුණෑගල පදවි එවක රදගුරුතුමා වූ අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් වෙත කැඳවාගෙන ගිය බව ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා

මා සමග පවසා ඇත. අනතුරුව එතුමා සහෝදර තුමෙක් හෝ සහයක පියතුමෙක් ලෙස කුලියාපිටියේත්, මීසම් සේවක පියතුමෙක් ලෙස හිරිපොකුණ මීසමෙත් සේවය කළේය.හිරිපොකුණ මීසමේ සේවය කරන කාලයේ මාසයේ පළවෙනි සිකුරාදා දින දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සිදුකොට,අවසානයේදී පැමිණි අය ආශිර්වාද කිරීමට පටන් ගැනීමත් සමග විවිධ ප්‍රාතිහාර්යන් සිදුවී ඇති අතර, ඒ අනුව කෙමෙන් කෙමෙන් බාහිරින්ද ජනතාව හිරිපොකුණ දේවස්ථානයේ පැවැති සිකුරාදා මෙහෙයට පැමිණෙන්නට පුරුදුව සිටියහ. පසුව හිරිපොකුණ මීසමෙන් සමුගෙන බක්මීගොල්ලට පැමිණීමත් සමග **"බක්මීගොල්ලේ ෆාදර්"** ලෙස බොහෝ දෙනා අතර එතුමා ඉමහත් ප්‍රසිද්ධියට පත්වන්නට පටන් ගත්තේය.

කුරුණෑගල පදවියේ මීසම් සේවයට එක් වූ එතුමා මට මුණ ගැසෙන්නේ එතුමා බක්මීගොල්ල දේවස්ථානයේ රෝගීන් ආශිර්වාද කරන කාල සීමාවේදීය.එතුමාගේ සේවාව පිළිබඳව මා හට එතරම් විස්වාසයක් නොතිබුණද, මාගේ මව නිතරම පියතුමා මුණගැසීම සඳහා පවුලේ අය සමග බක්මීගොල්ල දේවස්ථානය වෙත යාම පුරුද්දක් කරගෙන සිටියාය.එහෙත් පියතුමා අනාවරණය කර තිබූ අයුරින්ම, දෙවියන් වහන්සේ විසින් මගේ ජීවිතය තුළ සිදු කරන ලද ප්‍රාතිහාර්යයක් නිසා, ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා යනු දෙවියන් වහන්සේ විසින් මෙහෙයවන බලවත් අවියක් බව මට අවිවාදයෙන් පිළිගන්නට සිදුවිණ. එදා සිට සෑම මසකම බක්මීගොල්ල දේවස්ථාන භූමියේ පැවති එතුමාගේ සුව මෙහෙයට මම අනිවාර්යයෙන්ම සහභාගි වූවෙමි.

2005 වසරේ සිට පියතුමා මල්පිටිය සා.සෙබස්තියන් දෙව්මැදුරේ මීසම් සේවක පියතුමා ලෙස පැමිණෙන බවට වූ ආරංචිය තරම් සතුටුදායක පුවතක් මා එතෙක් අසා තිබුනාදැයි මම නොදනිමි.එය සිහිනයක් සැබෑ වූවක් මෙන් විය.එය සිහිනයක්ම නොව සැබෑවක්ම විය. එමෙන්ම එය මල්පිටිය මීසමේ සියලුම දෙනාට ප්‍රාතිහාර්යයක්ම හා ආශිර්වාදයක්ම විය.

ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා මීසමට පැමිණ සිදු කළ පළමු දිව්‍ය පූජාව අතර තුර, ගෝලයන් 12 දෙනෙකුගේ පාද සේදීමක් සිදු කළ අතර, ඒ සඳහා ගෝලයෙකු ලෙස මටද ශුද්ධවූ අල්තාරය දෙපැත්තේ තබා තිබූ බංකුවක කොණක වාඩිවීමට අවස්ථාව ලැබිණ.පියතුමා ජල බදුනක් ගෙන ප්‍රථමයෙන් මා සිටි ස්ථානයේ සිට පාද දෝවනය ආරම්භ කළ අතර, පියතුමා මා අසළ, හිඳගෙන මාගේ පාද සෝදා ඒවා සිපගත්තේය. මගේ මුළු ශරීරයම ගැහෙන්නට විණ. ඇස් වලින් කදුළු කඩා වැටෙන්නට විය. එතුමා නැගිසිට මා වැළඳගත්තේය. එය මගේ ජීවිතයේ ඇස් අදහාගත නොහැකි දර්ශන පෙළක් විය. එසේ පියතුමා එතැන සිටි මල්පිටිය මීසමේ තෝරාගත් ගෝලයන් සියළුම දෙනාගේ පාද සෝදා, පාද සිපගෙන, නැගිට ඔවුන් සියලුම දෙනාව වැළඳ ගත්තේය. මා මුහුණ දුන් අත්දැකීමටම ඔවුනුත් මුහුණ දුන් බව මම දුටුවෙමි.



මල්පිටියේ පවත්වන ලද රෝගීන් ආශිර්වාද කිරීමේ මෙහෙයේ නිවේදන කටයුතු ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා මා පිට පැවරීමත් සමග එතුමා මගේ ජීවිතයට බොහෝ සෙයින් ළං වීමට පටන් ගත්තේය.සුව මෙහෙය අවස්ථාවේ එක් එක් අය වේදිකාවේ සාක්ෂි දැරීම් කළ අතර, ඔවුන්ගේ අවසරය මත ඒවා එක් කරමින් 2007 වසරේ ''සහන" නමින් ත්‍රෛමාසික සගරාවක් එළිදැක්වීමට පියවර ගැනිණ. 2007 වසරේ සිට 2024 වර්ෂය දක්වා එය අඛණ්ඩවම ප්‍රකාශයට පත් වූ අතර, සාමාන්‍යයෙන් පිටපත් 1000 ක් මුද්‍රණය කළත් සමහර අවස්ථාවලදී පිටපත් 3000 ක් පමණ වරකට මුද්‍රණය කිරීමට සිදුවිණ.ඒ සඳහා විවිධ අය උපකාර කළ නිසාත්, මුද්‍රණ වියදමටම එය අලෙවි කිරීමට අපට හැකියාව ලැබිණ.සංස්කාරක සටහන පමණක් නොව, පියතුමාගේ ලිපියද මා විසින් සකස් කොට පියතුමාට ඇසෙන සේ කියවූ පසු **"මගේම අදහස තමයි තියෙන්නේ අම්මලට"** කියමින් මා ආශිර්වාද කිරීම එතුමාගේ පුරුද්දක් වී තිබිණ. සගරාවේ පියතුමාගෙ පණිවිඩයට උචිත කොටස් සිහියේ තබා ගත යුතුව තිබූ නිසා ඉරිදා දිව්‍ය පූජාවලදී පමණක්

නොව, විවාහ මංගල්‍යය දිව්‍ය පූජා වලදී පවා එතුමාගේ දේශනා මතක තබා ගෙන ඉන්නට මම වෑයම් දැරීමී. **"කසාද බදින්න කලින්නම් කියනවා, සීගිරි ගීයක් ඔබේ හදවතේ ලියන්න දෙනවද? සදකඩ පහණක් ඔබේ හදවතේ නෙළන්න දෙනවාද"** කියලා, හැබැයි කසාද බැඳලා ටික දවසක් යද්දී කියනවා, කටු යහනේ ඉන්නට බෑ ප්‍රභාවතී, මල් යහනෙන් බැස පළයන් ප්‍රභාවතී කියලා" විවාහ මංගල්‍යය දිව්‍ය පූජා කීපයක පියතුමා සිය දේශනයේදී ඔය ගීත කොටස් උපුටා ගෙන සිය දේශනාව ඉදිරිපත් කරනවා මා අසා ඇත. "අද කාලේ මිස් කෝල් එකක් තමයි මිසීස් කෝල් එකක් වෙන්නේ. අද ෆොටෝ ගන්න අය, මුලින්ම මුළු මුදලම ගන්නවා, මොකද නැත්නම් ඇල්බම් එක හදලා බාර දෙද්දී දෙන්නා ඩිවෝස් වෙලා, ඒ කාලේ අපේ අම්මා අපේ තාත්තාව විවාහයට කලින් දැකලා තිබිලා තියෙන්නේ එක පාරයි, හැබැයි ලස්සනට දරුවෝ හදාගෙන, කොයිතරම් ආර්ථික අපහසුතා තිබුණත්, අවසානය දක්වා පවුල් ජීවිතය ගෙනිච්චා. ඒත් දැන් බදින්න කලින් කරන්න පුළුවන් ඔක්කොම දේවල් කරනවා, පැය ගණන් ෆෝන් එකෙන් කතා කරනවා, බැඳලා අවුරුද්දක් ඉන්න බෑ "මෙවැනි කතා බොහෝ විවාහ මංගල්‍යය දිව්‍ය පූජාවන් වල එතුමා දේශනා කළේය. එම දේශනා ගැන අවුරුදු කීපයක් ගතවුවාට පසුව හෝ එයට සහභාගිවූ යමෙකුගෙන් **"මතකද ඒ මගුල් පූජාවේ ෆාදර් ස්ටැන්ලි කිව්ව දේවල්"** කියා ඇසුවොත් එය අකුරක් නෑර කියන්නට තරම් ඔහුගේ හෝ ඇයගේ මතකය තුළ එම වචන තැන්පත් වී තිබිණි.

මීසමේ අවිවාහක තරුණ තරුණයන්ව නිසි වයසේදී විවාහ කර දීමට පියතුමා කටයුතු කළේය. එසේ මල්පිටිය මිසමේ සිටි කීප දෙනෙකුගේම විවාහ සිදුවූයේ පියතුමාගේ මැදිහත්වීමෙනී. එකල අවිවාහකව සිටි මටද තරුණියක් ජෝඩු කිරීම සඳහා පියතුමා අපමණ උත්සහයක් දැරීය. මගේම වාහනයේ නැගී පියතුමා බොහෝ තැන්වල මනමාලියන් සොයා ඇවිද ගියේය." අමිල දැන් බලන්න යන ගෙදර ගැණු ළමයෙගේ අම්මයි දුවයි පටල ගන්න එපා, මොකද අම්මා ඉන්නෙත් කෙල්ල වගේ" කියමින් පියතුමා කුඩා දරුවෙක් මෙන් මහා හඬින් සිනාසුණු අවස්ථා එමටය. එම ගමන් තනිකරම හාස්‍ය පිරි කතා වලින් හා දෙබස් වලින් පිරී තිබිණ. (පියතුමා තඹකන්දට පැමිණීමත් සමඟ, තඹකන්දට සමීප කොච්චිකඩේ පල්ලන්සේන ප්‍රදේශයෙන් විවාහයට සුදුසු සහකාරියක් මා හට තෝරා දුන්නේ ද විවාහ මංගල දිව්‍ය පූජාව සිදු කරන ලද්දේ ද පියතුමා විසිනි.)

මල්පිටිය මීසමට අයත් කොහිලේගෙදර අති දැවැන්ත දෙව්මැදුරක් ඉදිකරන්නට පියතුමා පියවර ගත් අතර, සමහර දෙනා අත්සන් කළ හිස් චෙක්පත් පියතුමාට ලබා දී තිබුණේ, දේවස්ථානය ඉදි කිරීම සඳහා මුදල් අවශ්‍ය වන ඕනෑම විටෙක කැමති මුදලක් චෙක්පතේ ලියා මුදල් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමිනි. පියතුමා ගොස් ආශිර්වාද කළ පසු සාර්ථක ව්‍යාපාරිකයන් වූ බොහෝ දෙනෙක් එකල කොහිලේගෙදර දෙව්මැදුර වෙනුවෙන් උපකාර කළහ. එමෙන්ම ඉතා මනරම් පරිසරයක පිහිටි, කුඩා කිතුනු පිරිසක් සිටි වෙල් යායකින් වටවී තිබුණු උඩුපිටිය ග්‍රාමයේ දේවස්ථානය පියතුමා පිළිසකර කිරීමට පියවර ගැනිණ. උඩුපිටිය දේවස්ථානයට පිවිසීමට මාර්ගයක් නොමැති වීමෙන් ජනතාව කුඹුරු උඩින් හා නියරවල් උඩින් දේවස්ථානය වෙත පැමිණි අතර, වැසි කාලයට එහි ළඟාවීම ත්‍රාසජනක අත්දැකීමක් වෙයි. වැසි කාලයේදී ඇලවල් හා කුඹුරු එක මට්ටමට ජලයෙන් පිරීයාම නිසා ආගන්තුක අයෙක් ජලය පිරි වළකට හෝ කානුවකට ඇද වැටීම එහි සාමාන්‍ය දෙයකි. ප්‍රධාන මාර්ගයේ සිට දේවස්ථානය ඉදිරියෙන් දේවස්ථානය අසළට නියරක් තිබුණද එය පළල් කොට පාරක් ලෙස දෙන්නට වසර 75 පමණ කාලයක සිට එනම් දේවස්ථානය ඉදිකළ දිනයේ පටන් උත්සහ කර තිබුණද ඊට අන්‍යාගමික ගොවි මහතුන් ඉඩදී නොතිබිණ. එහෙත් පියතුමා ඔවුන් මුණ ගැසී ඔවුන්ගෙන් පල්ලියට පාරක් දෙපස ඇති වෙල් වලින් දෙන ලෙස ඉල්ලීමක් කළේය. කුමන හේතුවක් නිසාවත් තම කුඹුරු මැදින් පල්ලියට පාරක් නොදෙන බව කී එම ගොවි මහතුන් පියතුමා ඉදිරියේ මුහුණට මුහුණ බලාගෙන පියතුමාගේ වචනයට දමනය වූවාක් මෙන් කිසිදු පැකිලීමකින් තොරව ප්‍රධාන පාරේ සිට, දේවස්ථානයට පිවිසීමට අඩි 8 ක පමණ පාරක් ලබා දුන්නේ උඩුපිටිය ග්‍රාමය පමණක් නොව ඒ පුවත ඇසූ මල්පිටිය මීසමම පුදුමයට පත් කරමිනි. උඩුපිටියේ ජනතාව, තම ජීවිත කාලය තුළ කිසි දිනෙක දැක ගැනීමට අවස්ථාවක් ලැබේ වී යැයි කිසිසේත්ම නොසිතූ දේවස්ථානයට පැමිණෙන නව පිවිසුම් මාර්ගය **"ගරු ස්ටැන්ලි පීරිස් පිය මාවත"** නමින් නම් කළේ ඔවුනට පියතුමාට දිය හැකි උතුම්ම සත්කාරයක් සේ සලකමිනි.

කොහිලේගෙදර හා උඩුපිටිය යන කුඩා දේවස්ථානවල මංගල්‍යය සමයේ සතියක් ගරු ස්ටැන්ලි පියතුමා එම දේවස්ථානයේ නතර වී සිටීම ඉතා ආසාවෙන් කළ දෙයකි.එය එතෙක් කිසිදු පියතුමෙක් නොකළ ක්‍රියාවක් බව එම ගම්වැසියෝ පවසති. බොහෝ විට පියතුමාට නතරවීමට තිබුනේ, සංක්‍රිස්තියන් කාමරය තුළය.පියතුමා එම දේවස්ථාන වල ඉන්නා කාල වල එම ජනතාව ඉමහත් සතුටින් දේවස්ථාන භූමියට වී රාත්‍රීය පවා ගත කරමින් සිට පියතුමා ආරක්ෂා කරයි. පියතුමාද රාත්‍රියේ නැගිට විත් ඔවුන් සමග කෝපි පානය කරමින් ආගිය තොරතුරු කතා කරමින් කාලය ගත කරයි. බාහිරින් පැමිණෙන ජනතාව එම දේවස්ථාන වලටද, පියතුමා මුණ ගැසීම සඳහා පැමිණෙන නිසා, සෙනසුරාදා සවස හා ඉරුදින සවසද, එම භූමියන්ද කාර්යබහුල වෙයි. එහෙත් පියතුමා මංගල්‍යය සමයේ එම දේවස්ථාන වල කාලය ගත කිරීම ගැන බාහිර පිරිස් නොදන්නා නිසාත්, දේවස්ථාන ජනතාව සමග බොහෝ දේ කතා කිරිමට එතුමාට හැකියාව ඇති නිසා පියතුමා නේවාසිකව එහි සිටීම ගැන ඔවුහූ ඉමහත් සතුටට පත්ව සිටියහ.

2010 වසරේ ජනවාරි මස මල්පිටියේ සා.සෙබස්තියන් මුනිදුන්ගේ මංගල්‍යය සමරා, ඊට පසු ඉරුදිනක පියතුමා තඹකන්දට මාරු වීමක් ලැබ පැමිණියේය. පියතුමා වසර 7 ක් බක්මීගොල්ල දේවස්ථානය තුළ සේවය කළා සේ, මල්පිටියේද තවත් වසර කීපයක් සිටින්නට ඉඩ දෙන මෙන් මා ද ඇතුළු මීසම් වැසියෝ කීප දෙනෙක් අති උතුම් හැරල්ඩ් ඇන්තනී රාජගුරු ප්‍රසාදින් වහන්සේගෙන් ඉල්ලා සිටියෝය. එහෙත් එතුමා කියා සිටියේ තඹකන්ද දෙව්මැදුර, පියතුමාගේ සේවාවට හා මෙහෙයට වඩාත්ම සුදුසු ස්ථානයක් ලෙස තමන් හඳුනාගෙන ඇති බවය. රදගුරුතුමාගේ පැහැදිලි කිරීම ගැන එදින අපට පැහැදීමක් නොමැති වුවද, තඹකන්ද භූමිය දකින විට රදගුරුතුමාගේ දැක්ම නිවැරදි බව මට වැටහිණ.

ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාගේ ආගමනයත් සමග තඹකන්ද, රන් කන්දක් වීමට පටන් ගැනිණ. පැමිණෙන ජනතාවට කිසිදු පහසුකමක් හෝ පියතුමාට නැවතීමට ඉඩ පහසුකම් නැති වුවද, ඒ කිසිවෙකින් නොසැලී භෞතික වශයෙන් කඩිනමින් කළ යුතු දෑ රාශියක් බොහෝ දෙනාගේ මූල්‍ය ආධාරයෙන් සිදු කරන ලදී.

- තඹකන්දට පැමිණෙන ජනතාව වෙනුවෙන් යටිතල පහසුකම් සැපයීම.
- දැවැන්ත වේදිකාවක් ඉදිකිරීම.
- නව මීසම් ගෘහයක් ඉදි කිරීම්
- පාද නමස්කාර ස්ථාන හා උත්ථාන වූ ජේසු තුමන්ගේ ප්‍රතිමාවක් ස්ථාපිත කිරීම.
- දහම්පාසැල් දරුවන්ගේ විවිධ ප්‍රසංගයන් සඳහා ශාලාවක් ඉදිකිරීම හා දේවස්ථානයට පිවිසෙන මාර්ග සංවර්ධනය කිරීම.
- සේවක මහතුන් හට නවාතැන් ගැනීම සඳහා නිවාසයක් හා මංගල්‍යය වෙනත් විශේෂ දිනයන් හී දානය හෝ ආහාරපාන පිළියෙළ කිරීම සඳහා මුළුතැන්ගෙයක් ඉදිකිරීම.
- දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සඳහාම අර්ධ භූගත නව දෙව්මැදුරක් ඉදිකිරීම.
- ප්‍රතිමා තැන්පත් කිරීම සඳහා නව ප්‍රතිමා මණ්ඩපයක් ඉදිකිරීම.
- තඹකන්ද දෙව්මැදුරේ ඉදිරි කොටස අළුතින් නිර්මාණය කිරීම හා අවට වටපිටාව සාන්ත බවක් හා යාච්ඤාවට සුදුසු පරිසරයක් ලෙස හැඩ ගැන්වීම.
- මුළු භූමියේම ඉදිරි අනාගත පරපුර වෙනුවෙන් පළතුරු ගස් සිය ගණනින් රෝපණය කිරීම.
- මහසිකුරාදා දින තුන්පැය ධ්‍යානය හා පාස්කු නාට්‍යය වේදිකා ගත කිරීම.
- සෑම මසකම පළවෙනි බ්‍රහස්පතින්දා දිනෙකම සවස 7.00 ට ශුද්ධවූ පැය පැවැත්වීම හා සදුදා දින හැර සෑම දිනකම සන්ද්‍යාවේ දිව්‍ය පුජාව පැවැත්වීම.
- මාසයේ පළවෙනි සෙනසුරාදා දින රෝගීන් ආශිර්වාද කිරීමේ මෙහෙය පැවැත්වීම
- බදාදා, බ්‍රහස්පතින්දා පළමු සිකුරාදා හා ඉරිදා දිනවල බාහිරින් පැමිණෙන ජනතාව මුණගැසී ඔවුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් යාච්ඤා කිරීම.
- දහම්පාසැල් දරුවන් සඳහා නිළ ඇදුම් ලෙස ළමා සාරිය, සරම, කමිසය සඳහා අවශ්‍ය රෙදි

සෑම වසරකම පියතුමා විසින් දරුවන් හට ප්‍රදනය කිරීම හා දහම් පාසැලේ ගුරුවර ගුරුවරියන් වෙනුවෙන්ද නිළ ඇදුම් පිරිනැමීම.

- සම්පත් දායකයන් ගෙන්වා, විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන්, මීසම් ජනතාවට, දහම්පාසැලට, තරුණ දරුවන් වෙත නිබඳවම ලබා දීම.
- ඉගෙනීමට දක්ෂ දරුවන්ට පමණක් නොව, අවශ්‍ය ඕනෑම දරුවෙකුට ශිෂ්‍යාධාර සෑම මසකම ලබා දීම හා මීසමේ ආර්ථික අපහසුතා ඇති සෑම පවුලක් වෙතම මාසිකව මූල්‍ය හා පෝෂණ ආධාර ලබා දීම.
- තමන්ගේ උපකාර බලාපොරොත්තුවෙන් පැමිණෙන පූජක, පැවිදි උතුමන් හට පවා නොපැකිලිව උපකාර කිරීම.
- සා. බෘහස්පති මුනි මංගල්‍යය හා සන්ධ්‍යා මෙහෙය අති උත්කර්ෂවත්ව සැමරීම.
- සෑම වසරකම, දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය, මැයි මංගල්‍යය හා නත්තල් උත්සවයද ඉහළින්ම සැමරීම හා වසර අවසාන දහම්පාසැල් උත්සවය ලංකාවේ සුවිශේෂී කලාකරුවන් රාශියකගේ ප්‍රධානත්වයෙන් සිදුකොට ඔවුන්ගේ අත්දැකීම් දරුවන් සමග බෙදාගැනීමට ඉඩකඩ සකසා දීම.
- (තඹකන්ද දේවස්ථානයේ මංගල්‍යයන් හා සන්ධ්‍යා මෙහෙයන් සඳහා කුරුණෑගල රාජගුරු ප්‍රසාදීන් වහන්සේ පමණක් නොව එතුමාගේ අවසරය මත, ගාල්ල රදගුරු අතිඋතුම් රේමන් වික්‍රමසිංහ, මහනුවර රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස්, මහනුවර විශ්‍රාමික රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු, කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ෂ්වල් සිල්වා යන හිමිපාණෝද, කොළඹ පදවියේ ගරු ප්‍රසාද් හර්ෂණ පියතුමා, ගරු කෙනඩි පෙරේරා පියතුමාලාද සහභාගි වන්නාහ.)
- ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා සේවය කළ මීසම් වල භෞතික දියුණුව හා ආත්මික දියුණුව වෙනුවෙන් කළ සේවය, ඉලක්කම් යොදා මෙපමණයැයි කීම කිසිසේත්ම සාධාරණ නොමැති වුවද එතුමා අසලම රැඳෙන්නට වරම් ලද අයෙක් ලෙස මෙසේ හෝ සටහන් කිරීම එතුමාගේ සේවයට යම් සාධාරණයක් කළා යන හැඟීමක් ඇති වෙයි.
- එතුමාගේ රෝගින් ආශිර්වාද කිරීමේ මෙහෙයන් වල නිවේදන කටයුතු හා අන් අයෙගේ සාක්ෂි දැරීම් ඉදිරිපත් කළ මටද පියතුමාගේ වටිනාකම අවබෝධ කරලීම සඳහා දෙවියන් වහන්සේ විවිධ පරීක්ෂණයන් කළ සේක. පළවෙනි සෙනසුරාදා සුව මෙහෙයට සහභාගි වීම නිසා මගේ රැකියා ස්ථානයේ ප්‍රශ්න ඇතිවිය. ''බයවෙන්න එපා, පුතා අළුත් රස්සාවකට යන්න ''එතන ඔයාට හොඳයි.'' පියතුමා කී දෑ එලෙසින්ම විය. මගේ බිරිඳගේ පළමු දරු උපත අවස්ථාවේදී ඇය මරණාසන්නව සිටියදී, අය මියයන බව වෛද්‍යවරුන් පවා අනාවැකි කියා තිබියදී, කුස තුළ දරුවා ජීවත් නොවුණත්, ඇය ජීවත් වන බව කී එකම පුද්ගලයා ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා පමණි, එය එසේම විය. ඇය ජීවත් වුවත් ඇවිදීමට හෝ කතා කිරීමට හෝ නොහැකිවන බවත්, නැවත දරුවන් හැදීමට නොහැකි වන බව පසුව වෛද්‍යවරුන් පවසන විට, ඇය පූර්ණ සුවය ලබන බවත් ඊළඟ වසරේ දරුවෙක් පවුලට එක්වන බවත් ඒ දරුවා පිරිමි දරුවෙක් වන බවත් පියතුමා අනාවරණය කළේය. එයද එසේම විය. බිරිඳගේ වෛද්‍ය වාර්තා බලා "රිපෝට් වල තියෙන අවුල් වල හැටියට මෙයා මෙහෙම ඉන්න බෑනේ. හොඳට ඇවිදිනවා, කතා කරනවා, ඉතින් දෙන්න බෙහෙතකුත් නෑ, මේක ප්‍රාතිහාර්යක්, එච්චරයි අපිට කියන්න තියෙන්නේ" කියා වෛද්‍යවරු පසුව කීහ. පියතුමා කී ලෙස ඊළඟ වසරේදී කිසිදු ප්‍රශ්නයකින් තොරව දරුවෙක් බිහි කිරීමට බිරිඳට හැකිවිය. එමෙන්ම පියතුමා කී ලෙසම ඒ දරුවා පිරිමි දරුවෙක් ද විය.
- ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා මට හමුවුණු විස්වාසවන්තම මිතුරා විය. එතුමාද මා කෙරෙහි බොහෝ විස්වාසය තැබූ බව මම දනිමි. එතුමාට පෞද්ගලිකව විඳින්නට වූ සිත් අමාරුකම් මා සමග පවසා ඇත. (බොහෝ දේ සටහන් කළ හැකි වුවද එය මෙතනින් නතර කරමි.)
- දසක දෙකක්, මා හා ගමන් ගත්තාවූ මාගේ ජීවිතයම වූ ගරු ස්ටැන්ලි පීරිස් පියතුමෙනි, ඔබ වහන්සේ ස්වර්ගස්ථ වන්නට පෙර එක් ඉල්ලීමක් මගෙන් ඉල්ලීය. එය මට ඔබතුමා ජීවත්ව සිටියදී කළ නොහැකි විය. එහෙත් එය මම ඉටු කරමි.

- 2025 අගොස්තු 30 දින මම එතුමන් බැලීමට රෝහලට ගියෙමි. යන්ත්‍රයක් ආධාරයෙන් හුස්ම ගනිමින් සිටිනිසා එතුමා කතා කළ වචන තේරුම් ගැනීමට තරමක් අපහසු විය. එහෙත් මහත් වෙහෙසක් දරමින් එතුමා මා ඇමතීය.
- **''සැප්තැම්බර් 04 බර්ත්ඩේ එකනේ. මේ පාර මට සුභ පතන්න වෙන්නේ නෑ. ඒ නිසා දැන් මම සුභ පතන්නම්"අවසන් හුස්ම හෙළන්නට ආසන්න මොහොතක පවා, සැප්තැම්බර් 04 දින මගේ උපන්දිනය සිහියට පැමිණි මම පුදුම සහගතය. මෙලොව ජීවිත්ව සිටිනා අවසන් මොහොතේ පවා තව කෙනෙක්ගේ සතුට ගැන නොවේද ගරු ස්ටැන්ලි ජීරිස් පියතුමා පෙන්නුම් කරන ලද්දේ ? අගෝස්තු 31 දින එතුමා ස්වර්ගස්ථ විය.**

"අහස සේ ඔබ අනන්තයි, -සයුර සේ ඔබ අනන්තයි
මේ විශ්වයේ මා දකින්නේ,,, - ඔබම පමණයි, ඔබ අනන්තයි"

අමිල කොටිකාවත්ත
සංස්කාරක, සහන සඟරාව



සේවය නිමකල ස්ටැන්ලි පියතුමනි !



අපෙන් සමුගත් ගරු ස්ටැන්ලි ජීරිස් පියතුමනට...

මීසම් ගණනාවකම සේවයෙ — යෙදුනී
ජනතාවට දුන් ඔවදන් — අපමෙනි
රෝගී දුනන් හට සදහට — සුවය දුනි
ඔබතුමගෙන් ලැබූ සහනය නිම — නොවුනි

නිතරම සිනහ මුහුණින්මය — සිටින්නේ
සැමදෙන හට ජේසු පිහිටය — පතන්නේ
නිතරම අතදැරූ කුරුසියෙ — බලයෙන්නේ
සැදැහැති දනට කළ සේවය උතුම් — වුනේ

ඔබතුමගේ වියෝව ඇතුගල්පුර පදවියටම — පාඩුවකි
සේවය ලැබූ හැමටම අපමණ — දුකකි
රෝගී වුවත් සුපුරුදු දිරියක් — තිබුනි
නිතරම සිතුවෙ අන් අය ගැනමය — තුටිනි

ගරු පියතුමෙනි ඔබතුම හට මෝක්ෂය — උරුමයි
එය සිරිලක කිතුනු ජනතාවගෙම — පැතුමයි
දෙව්මව් තුරුලෙ සැනපෙන්න එය හිරි — කදිමයි
ආත්මයට සදා සැනසීම ලැබෙනු — ඒකාන්තයි

හිල්ඩා කුමාරපේරු
දඹදෙණිය විසව

බැතිමත් මව්පියද සොයුරු කැළ මැද ඉපදුන — ඔබට
අලුයම පිබිද දෙපයින් ගොස් දෙව් මැදුරේ — යාගය ට
දින තුන්සිය හැටපහටම ජේසු ලඟන්නට — හිස් කුසට
ළමා වියේ හැකිවුණාලු මනකයි ස්ටැන්ලි පියේ — අපට

ගුරුතුමි ඔබේ පොත විසි කලත් දොරෙන් — එළියට
සුදුසු නැතැයි සෙමනේරියෙන් දිනකදි දැම්මත් — දොවිට
නිර අදිටනින් දිගි වැඩුවේ මිදි උයනේ — සේවයට
නිර්මල වූ නිහතමානි හදවතමයි හේතුව — ජයට

එඬේරුන්ට අකීකරුව අයාලෙ යන බැටලුවන් — සොයා
කලකදි මරිමවුන් සමඟ සේනාවත් කැටුව — ඔබ ගියා
මනුසත වෙනුවෙන් දෙව් සතු ගම්බිම්වල සැරිසැරූ — නියා
වෙහෙස වුණා ඔබත් පියේ නින්ද අහර පසෙකින් — නියා

විවිධ විෂම ජීවිනවල කඳුලු හෙලන මහ — පිරිසක්
ලංකර ගෙන සනසන්නට තිබුණා ඔබට මහ — පිපාසයක්
මග වැරදී අසරණ වූ ආත්ම සිය — දහසක්
ඒ නිසාය ගොඩනගන්න දෙව්දු දුන්නෙ විශේෂ — වරමක්

ඔබෙ අඟනා දෙසුම් සමඟ ඔවදන් සැමදා — සුරකින්නම්
ඔබ කළ සේවය අඟයා දෙව් සම්දුට නැති — පුද දෙන්නම්
වැයවී දියවී දුන් ආලෝකය නොනිවා — රැක ගන්නම්
ඔබ සුදුවරයෙක් වන්නට යදිමින් නෙත් දෙක — පිසගන්නම්

ලිලියන් සපරමාදු
පැල්ලන්දෙණිය

ගිහි පිළිසඳර

කුඩා කිතුනු සංඝ ව්‍යාපාරය සමඟ බැඳුණු ජාතික කමිටුවේ ගරු ලේකම්

"නිමල් පෙරේරා" මහතා



සමඟ අද පිළිසඳරේ යෙදෙමු.

වසර 30 කට වැඩි කාලයක සිට කුඩා කිතුනු සංඝ ක්‍රියාවලියේ මහා බලය ජනගත කිරීමේ නියමු තැන්හි සිටිමින් ගිහි සේවයේ යෙදෙන්නාවූ කුරුණෑගල පදවියේ පන්නල විසවේ පදිංචිව සිටින නිමල් පෙරේරා මහතා සමඟ සුභද පිළිසඳරක යෙදෙන්නට කාල වේලාව සොයා ගැනීම දුෂ්කර කාර්යයක් වූ බව සඳහන් කරමි.

- මා ඔබතුමා හඳුනාගෙන කිතුණු ක්‍රියාවලින්ද වසර විසිපහකට වැඩියි. අප කවුරුත් ඔබතුමාට ආදරයට කියන්නේ 'නිමල් අයියා' කියල. ඔබතුමාගෙන් සම්පූර්ණ නම, විස්තර දැන ගන්න කැමතියි.
- මගේ නම, සී. නිමල් ඉග්නේෂස් පෙරේරා. උපන් ගම, වැවල. මීසම, ශාන්ත ප්‍රැන්සිස් ක්ෂේවියර් දේවස්ථානය, වැවල. පවුලේ විස්තර කීවොත්, දෙමාපියන් ස්වර්ගස්ථ වෙලා. මගේ පියා, සී. ලියොන් පෙරේරා. වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ හිටපු කාර්මික ශිල්පියෙක්. මව, එච්. මේරි ග්ලැඩිස්. ඇය මරිය හමුදාව, දිව්‍ය හෘදයේ සමිතියේ, මීසම් දායක සභාවේ ප්‍රබල සාමාජිකාවක්. මම සොයුරියන් දෙදෙනෙක් හා එක් සොයුරෙක් සමඟ පවුලේ වැඩිමලා. නමුත් මල්ලී දැනට ජීවතුන් අතර නැහැ.
- අධ්‍යාපන හා රැකියා තොරතුරු ගැන කථා කරන්න පුළුවන්ද?
- ප්‍රාථමික අධ්‍යාපනය, වැවල ශාන්ත ප්‍රැන්සිස් ක්ෂේවියර් විදුහලෙන්. ද්විතියික අධ්‍යාපනය වසර 6 සිට උසස් පෙළ දක්වා කඳන ඩී. මැසනොද් විදුහලෙන්. දර්ශණ ශාස්ත්‍ර උපාධිය හා දේවධර්ම ශාස්ත්‍රය, දකුණු ඉන්දියාවේ කොඩෙල්කනාල් හි ශෙම්බෙගනූර් ජේසු නිකායික දර්ශණ පීඨය හැදෑරුවා. ඉන්දියාවේ මදුරාසියේ ''සත්‍ය නිලයම්'' ජේසු නිකායක පුහුණු විද්‍යාලයෙන් මම අධ්‍යාපනය ලබා ගත්තා.
- රැකියා කටයුතු ගැන කියනවානම්,
- 1985 දී මාකඳුර නෙස්ලේ සමාගමේ පරිගණක අංශය ආරම්භ කිරීමේ නියමුවා ලෙස රැකියාවට ආවා. ගමන් පහසුව තකා නාලවලාන මීසම භාර පියතුමා මට මීසම් ගෘහයේ නතරවන්නට අවස්ථාව සලසා දුන්නා. ඒ පියතුමා මීසමේ තරුණ සමිතිය ශක්තිමත් කර දෙන ලෙස ඉල්ලා සිටියා. ශ්‍ර. පවුලේ ගර්ට්රූඩ් කන්‍යා සොයුරුතුමිය නාලවලානේ නිවසක්, කුලී පදනම මත සොයාගන්නට උදව් දුන්නා. මම බිරිඳ හා වැඩිමල් දියණිය සමඟ එම නිවසේ පදිංචි වුණා.
- මේ කාලයේ කුරුණෑගල පදවියේ ගරු කුවින්ටින් පෙරේරා, ගරු මයිකල් කොස්තා, ගරු කැමිලස් පාතිමාදාස ආදී පියතුමන්ලා සමඟ ලගින් ඇසුරු කරන්නටත්, පදවි ධර්මෝපදේශ කටයුතුවල නියැලෙන්නටත් අවස්ථාව ලැබුණා.
- වසරක් යද්දී රැකියාවේ කළමනාකාර ධූරයකට උසස්වීමක් ද ලැබුණා. විදේශ පුහුණු වලට පවා සහභාගිවීමට අවස්ථාව ලැබුණා.
- 1989 වසරේදී මම දැනට පදිංචිව සිටින පන්නල මීසමේ නිවසක් තනා පදිංචි වුණා. ශුද්ධ වූ ඇග්නස් මුනිවරියගේ දෙව් මැඳුර මගේ දේවස්ථානය යි.
- වර්තමානයේ ශ්‍රී ලංකා ගිහි සැල්වතෝරයානු පවුලේ සභාපති ලෙසත්, ජාතික ගිහි මීසමේ විධායක කමිටු සභාපති ලෙසත් සේවය කරනවා.
- **එතකොට ඔබතුමා වසර 40 කට වඩා වැඩි කාලයක සිට දේව සේවාවේ නියැලෙන අයෙක් නේද? ඔබතුමා රැකියාවක් කරමින් දේව සේවාව කරන්නට විශේෂ වරම් ලද අයෙක් කියලයි මට හිතෙන්නේ.**
- ඔව්..ඒක ඇත්ත. මේ වෙලාවේ ස්වර්ගස්ථ වූ අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණෝ 1995 ඔක්තෝබර් 02 සිට 14 දක්වා මහනුවර ලේවැල්ල පාතිමා භාවනා මධ්‍යස්ථානයේ පැවැත්වෙන පළමුවන අන්තර් ජාතික ''අසිපා'' පුහුණු වැඩමුළුවට සහභාගි කරවීමට මා තෝරා ගෙන තිබුණා.
- ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමා සහ ගරු පැට්‍රික් ඇටැම්පොල පියතුමා, ගරු තෙරෙස් කන්‍යා සොයුරිය හා රීටා සේනානායක මිය සහ අති උතුම් රදගුරු පියාණන් සමඟ පදවි කණ්ඩායමක් ලෙස මම ඊට සහභාගි වුණා. මෙය තමයි කුඩා කිතුනු සභාවේ ජීවිත ගමන් ආරම්භය.
- **ඔබතුමා පදවිය තුළ පමණක් නොව ජාතික මට්ටමෙන් ද වැඩසටහන් සම්පාදනය කරමින් ජාත්‍යන්තරය හා සම්බන්ධවෙමින් කරන්නාවූ මෙම දැවැන්ත දහම් සේවාවේ දී විශේෂ පුද්ගලයින් හා සන්ධිස්ථාන ඇතැයි මා සිතනවා.**
- අපොයි ඔව්.. පදවිය පුරා දිවයින පුරා පවත්වා ඇති වැඩසටහන් හා දේශීය විදේශීය සහභාගි වූ වැඩමුළු ගණනින් දක්වන්න පවා අසීරුයි.

- මේ සේවාවට මා විශේෂාකාරයෙන් කැඳවූ මිහිපිට දේවදූතයෙක් වූ අති උතුම් රේමන්ඩ් පීරිස් රදගුරු පියාණන් හද පිරි දයාවෙන්, භක්තියෙන් කෘතවේදීව සිහිපත් කරනවා.
- ඒ හැර මා හිතවත් ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමා, කොළඹ පදවියේ ගරු ජෝ ප්‍රනාන්දු පියතුමා සහ ක්ලැරේෂියානු නිකායේ ගරු රොහාන් දොමිනික් පියතුමා කුරුණෑගල පදවියේ සිටි කිතුනු සංඝ අධ්‍යක්ෂ පියතුමන්ලා වන ගරු ජෙරොම් පෙරේරා, ගරු චන්දන හපුආරච්චි, ගරු රූපස් තැලිස් ආදී පියතුමන්ලා මා ගෞරවයෙන් සිහිපත් කරන්න කැමතියි.
- ඒ වගේම පෞද්ගලික අංශයේ පරිගණක ක්ෂේත්‍රයේ රැකියාව කරමින් පෞද්ගලික ජීවන අවශ්‍යතා කාලීන ආර්ථික විෂමතා මැද දෛනික පවුල් ජීවිතයේ දුෂ්කරතා උසුලා ගනිමින් කටයුතු කළමනාකරණය කරගෙන දරුවන් හදා වඩා අධ්‍යාපනය ලබාදී මට මහා ධෛර්යයක් ගෙන දුන්නාවූ මගේ දයාබර බිරිඳ ලුසිල්ඩා සහ මගේ දියණියන් හතර දෙනා ද දයාබරව සිහිපත් කරනවා.
- ඒ වගේම දෙස් විදෙස් ගෞරවයට පාත්‍රවී සිටි විද්වත් පියතුමෙකු වූ නිර්මල මරිය නිකායේ ගරු තිස්ස බාලසූරිය පියතුමාගේ ''මරියතුමිය හා මානව විමුක්තිය'' පොත් පිංච සිංහලයට පරිවර්තනය කරන්නට මට අවස්ථාව ලැබුණා. එම වකවානුවේ උන්වහන්සේ තාවකාලික පූජක තහනමකට ලක්ව පසුව අති උතුම් 16 වන බෙනඩික්ට් පාප් වහන්සේ එවකට කාදිනල් තුමෙකු වශයෙන් සිටි කාලයේ එම තහනම ඉවත් කළ කාල පරිච්ඡේදයේ දී ගරු තිස්ස පියතුමන්ගේ ලිපි ලේඛණ හා විදෙස් සම්බන්ධතා සම්බන්ධීකාරක වශයෙන් කොළඹ සමාජය හා සාමාජික කේන්ද්‍රයේ සේවය කළා. ඒ වගේම කුඩා කිතුනු සංඝ තුළින් සභාවක් වීමේ නව මඟ (ආසියාතික ඒකාග්‍රතා දහම් පෝෂණ නැඹුරුව ආසියා) ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් එවකට ජාතික ගිහි කණ්ඩායම් සභාපති අති උතුම් කිංස්ලි ස්වාමි පිල්ලෙ - දැනට ත්‍රිකුණාමල පදවියේ විශ්‍රාමික රදගුරුතුමාව ද මේ දහම් පෝෂණ දූත මෙහෙවරේ අඛණ්ඩව නියැලීමට මට දුන් අපරිමිත දිරිය වෙනුවෙන් ඉතාම කෘතවේදීව සිහිපත් කරනවා. ගරු තිස්ස බාලසූරිය පියතුමා ඉතා සරල අල්පේච්ඡ දිවිපෙවෙතක් ගත කළ අයෙකි. එතුමා සමඟ කටයුතු කරන්නට ලැබීම නිසා සභාව තුළත් පරිභාහිර සමාජය තුළත් සැබෑ ලවණක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න උන්වහන්සේගෙන් ඉගෙනගත් බව කියන්නේ උන්වහන්සේට මගේ බැතිබර ගෞරවය පුදනු සඳහායි.
- 1995-2025 වසර 30 ක කාලය තුළ ''ආසියාතික ඒකාග්‍රතා දහම් පෝෂණ නැඹුරුව'' එනම් ''අසිපා'' නමින් කෙටියෙන් හඳුන්වන කුඩා කිතුනු සංඝ ක්‍රියාවලියේ දූත මෙහෙවර හා බැඳී සිටි ඇතැම් ගිහි නායකයින් හා පියතුමන්ලා මේ ක්‍රියාදාමය අත්හැර යද්දී තවමත් ජාතික හා අන්තර්ජාතික වශයෙන් රැඳී සිටින්නට සමිඳුන් මා හට දී ඇති ආශිර්වාද ගැන දැඩි නිහතමානී භක්තියක් ඇති බව පවසන්නේ ඉතා සතුටිනි.
- ජීවිතයේ සෑම දුෂ්කර කාලවලදී පවා සමිඳු දූත මෙහෙවර අත් නොහැර සිටින්නට සමිඳුන්ගේ ස්ප්‍රීතුව මා සමඟ ක්‍රියාත්මක වීම ගැන සැමවිටම මම තුති පුදනවා.
- ඔබතුමා මීසම්, පදවි, ජාතික හා ජාත්‍යන්තරය කරා යමින් ඇසට පෙනෙන, කණට ඇසෙන මහා සේවාවක් වසර 30-40 ක පමණ ලේ, දහදිය, කඳුළු කැපකර සිදු කර තිබෙනවා. ඒ වෙනුවෙන් ඇගැයීමක් ලබා ඇත්දැයි දැනගන්න කැමතියි.
- (සිනාසෙමින්) ''මම ලැබූ සම්මාන මේවා'' යි කියා කබඩ් තුළ දමාගෙන පුහු මානයෙන් හිස උදුම්මාගෙන සුරකින භෞතික දේවල් මම කිසි විටකත් බලාපොරොත්තු වන්නේ නැහැ.
- ''කාවෝ ද, වේයෝ ද, මීයෝ ද, මලකඩ ද නොකන වස්තුව රැස් කරන්න.'' යයි සමිඳුන් කියා තියෙනවා. මා කළ සේවාවන් දෙවිඳුන් නිරතුරුවම දකිනවා. කන් ඇත්තෝ අසත්වා... ඇස් ඇත්තෝ දකිත්වා.. කියල විතරයි මට කියන්න තියෙන්නේ ඒ ගැන.
- ඔබතුමාගේ වටිනා කාලය වැය කිරීම වෙනුවෙන් ස්තූති වන්ත වෙනවා. අවසාන වශයෙන් ''පහන් ටැඹ'' ට දෙන පණිවිඩය කුමක්ද කියා දැනගන්න කැමතියි.
- ''අප මිනිස් දිවියේ මුඛ්‍ය මෙහෙවර වන්නේ දෙවිඳුන්ගෙන් ලද ජීවිත තිළිණය ඔපවත් කර පරිපූර්ණ කර දෙවිඳු අතට නැවත නතු කර දීමයි.''
- තමා දිවි ගෙවන කුමන පරිසරයක කා සමඟ වුවද අන් ජීවිත පෝෂණය කරන ලවනක් වෙමින් පරිසරය, සමාජය ආලෝකමත් කරන එළියක් වෙමින් ක්‍රියා කළ යුතු බව මගේ ඇදහිල්ලයි.
- අපට කළ හැකි දේ කළ යුතුයි. නොහැකි දේ තේරුම් ගෙන සුදුසු කාලයේදී සුදුසු අය විසින් කරනු ලැබීමට මඟපාදා දෙමින් වර්තමානයේ ජීවත් වෙමු.
- මන්ද ජීවිතය යනු ගතවූ ඊයේ දිනවත්, නොඑළඹී හෙට දිනවත් නොව මම ඔබ ගත කරන මේ මොහොත පමණයි. ඒ නිසා අද දින මේ මොහොත සතුටින් උද්යෝගයෙන් සමිඳුන් තුළ බලාපොරොත්තුවෙන් ගත කරමු.

සාකච්ඡා හා සටහන
ඇග්නස් ජේ. කැරැව්ගොඩ

පුදබිමක විරුණ

සියවස් ජුබිලිය සැමරූ උඩුබද්දාව

ශූ. ජොආනා ද ආර්ක් දේවස්ථානය



එදා වන වදුලින් ගහන වූ උඩහ බැද්ද අද උඩුබද්දාව' නමින් නාගරීකරණයට ළඟා වූ අපූර්ව ගම්මානයකි. එය පිහිටා ඇත්තේ කුලියාපිටිය සිට මාදම්පේ මාර්ගයේ කිලෝමීටර් 09 ක් පමණ දුරිනි. උඩුබද්දාව ශූ. ජොආනා ද ආර්ක් මුනිවරිය නමින් කැප කරන ලද දෙව් මැදුර ඉතා දීර්ඝ කාලයක අතීත පුරාණයකට හිමිකම් කියයි. එදා මෙදා තුර විසූ කිතුනු ජන සංඝයක සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන් වත්මන් පරපුරට දායාද වී ඇති මෙම දෙව්මැදුරේ වංශ කථාව විචිත්‍රවත්ය.

1890 දී පමණ කිතුණු පිරිස් වෙන්නප්පුව, කටුනේරිය, මාරවිල යන පෙදෙස් වලින් සංක්‍රමණය වී උඩුබද්දාව ස්ථීර පදිංචිය සඳහා තෝරාගෙන තිබුණි. කට්ටිමහන ඇතුළු තවත් ගම් රාශියක ද සිටි කිතුණුවෝ පොල්වගාව, දුම්කොළ වගාව ඇතුළු වගා කටයුතු සඳහා මෙහි පැමිණ සිටියහ. උඩුබද්දාව ගමේ පදිංචි වූ මුල් කිතුණු පවුල් සංඛ්‍යාව 12 කි. ඔවුහු තම ආගමික කටයුතු සඳහා කට්ටිමහන හෝ කුලියාපිටිය වැනි දේවස්ථානයක් කරා ගිය බව සිතිය හැක.

මේ වකවානුවේ දී මට්ටා කොටුව මීසමේ සේවය කළ ගරු තුරුෂියන් (නි.ම.නි) පියතුමා (1890) සහ ගරු ජෝන් පහමුනේ පියතුමා ද (1895) ඔවුන් වෙත දේව සේවය ලබා දී ඇත. 1904 දී පමණ කට්ටිමහන දෙව් මැදුරේ සහායක පියතුමෙකු වූ ගරු කොන්ස්ටන් එමැනුවෙල් තියඩෝර් ලබුරේ (නි.ම.නි.) පියතුමා විසින්, නැවකඩ පදිංචිව සිටි වර්ලියානු කුරේරාගේ නිවසේ දිව්‍ය පූජාවක් පවත්වා ඇත. මේ වන විට දෙව් මැදුරක අවශ්‍යතාවය ඔවුන් වෙත දැනෙන්නට විය. එතෙක් ඔවුහු යැදුම් මෙහෙයයන් ඇතුළු ආගමික කටයුතු සංවිධානය කරගත්තේ වර්ලියානු කුරේරා මහතාගේ ප්‍රධානත්වයෙනි. ඔහු උඩුබද්දාව, බිබිලාදෙනිය, තල්ගහපොත්ත යන ගම්වල "අන්නවිරාල" ලෙස කටයුතු කොට ඇත.

මේ අතර කට්ටිමහන කුලියාපිටිය දෙව්මැදුරු භාරව කටයුතු කළ ගරු එව්ජින් කෝමස් (නි.ම.නි.) පියතුමා (1916-1930) උඩුබද්දාව දේවස්ථානය ඉදිකිරීමේ කාර්යයට අත තැබීය.

දෙව් මැදුර තැනීම සඳහා ඉඩමක් තෝරා ගැනීමට එවකට සිටි ගිහි නායකයන් අතර ඡන්දයක් පැවත්වීම සිදු වී තිබේ. ඒ නාත්තන්ඩිය - තබ්බෝව පදිංචි, කඳුනේ දොන් ස්ටීවන් ජයසූරිය නමැත්තා උඩුබද්දාවේ සහ කොස්කිරියාවේ (කරඋල්ල) පිහිටි ඉඩම් දෙකක් පරිත්‍යාග කිරීමට ඉදිරිපත් වීම නිසාය. මෙහි දී වැඩි ඡන්දයෙන් උඩුබද්දාව පිහිටි ඉඩම තෝරා ගන්නා ලදී. ''තවලම්පිටිය හේන" සහ ''බෝගහමුල්ල හේන" නම් දරණ ඉඩම් කට්ටිදෙක කොළඹ අගරදගුරු අන්තෝනි කුදේර හිමිපාණන් විසින් රු 100/- කට මිලදී ගන්නා ලදී.

දේවස්ථානය සෑදීම ඇරඹී ඇත්තේ 1925 දීය. ඒ සඳහා මුල්ගල තැබුවේ ගරු එව්ජින් කෝමස් පියතුමා අතිනි. මේ වකවානුවේ දී ගොම මැටි ගා වරිච්චි බිත්තියෙන් සැදූ පොල් අතු මඩුවක් දෙව් මැදුර ලෙස භාවිතා කරමින් සිට ඇත. කෝමස් පියතුමා සමග දෙව්මැදුර ඉදිකිරීමේ කාර්යභාරයට උරදුන් ගිහි පිරිස අතර පර්සි විජේකෝන්, පීටර් කුමාරසිංහ, නිකුලස් කුරේරා, ජුසේ අප්පුහාමි, ජුවන් අප්පුහාමි, සයිමන් අප්පුහාමි, ඇඩ්වින් අප්පුහාමි යන මහත්වරු මුලිකත්වය ගත්හ.

ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය කුලියාපිටිය සිට කරෙන් හා කරත්තයෙන් ද ගෙන ආහ. අල්තාරය ඇති ස්ථානය ගලෙන් බැඳ උළු සෙවිලි කොට ඉතිරි වහලය පොල් අතුවලින් ආවරණය කොට බිමට වැලි අතුරන ලදුව එම වර්ෂයේ දීම දේවස්ථානයේ මංගල්‍යය ද පැවැත්වීම, ජනතාවගේ උනන්දුවේ ප්‍රතිඵලයක් විය. විවාහ සිදුකිරීම සඳහා රජයේ ලියාපදිංචි කිරිමද 1925 සැප්තැම්බර් මස 09 වන දින සිදු කර ඇත.

දෙව්මැදුර කැප කරන ලද්දේ ප්‍රංශ ජාතික මුනිවරියක වන ශූ. ජොආනා ද ආර්ක් මුනිවරයටයි. කෝමස් පියතුමාද ප්‍රංශ ජාතිකයෙකු නිසාම එසේ තෝරා ගන්නට ඇතැයි සිතිය හැක. ප්‍රංශයේ නිපදවන

ලද එම මුනිවරියගේ ප්‍රතිමාවක්ද මංගල්‍යයට පෙර පෙරහැරෙන් වැඩම වන ලදී. 1932 - 1942 කාලය තුලදී, තවදුරටත් ඉදිකිරීම් කටයුතු සිදු විය. 1942 දී කට්ටිමහන මිසමට ගරු එඩ්වඩ් පීරිස් පියතුමාගේ පැමිණීමත් සමග උඩුබද්දාව දෙව්මැදුරේ ඉදිකිරීම් සිදුවන්නට විය. වහලය සෑදීම මේ අවධියේ දී නිමා විය. ඒ සඳහා මාර්ෂල් ප්‍රනාන්දු සහ බෙනඩික් ප්‍රනාන්දු යන දෙදෙනා දායක වූ බව තතු දත් අය පවසති. ඉදිකිරීම් කටයුතු සඳහා මුස්ලිම් ජාතික මේසන්වරු යොදා ගැනීම නිසා ඉදිරිපස මොගොප්පුව මුස්ලිම් පල්ලියක හැඩයගෙන ඇති බව ද; කියැවේ. 1945 වන විට ප්‍රධාන ගොඩනැගිල්ල සාදා නිම විය.

එම වර්ෂයේදීම හලාවත රදගුරු තැන්පත් අති උතුම් එඩ්මන්ඩ් පීරිස් හිමිපාණන් අතින් නව දෙව් මැදුර ආසිරි ගැන්වීණ. එතුමා පෙරහැරින් කැඳවාගෙන එන ලද්දේ දෝලාවක හිඳුවාගෙන බව සියැසින් දුටුවෝ පවසති. 'කබරි' නම් ඇතින්න පිට දේවමාතා ප්‍රතිමාව වැඩමවන ලද බව ද පැවසේ. විචිත්‍රවත් ගිනිකෙළි සංදර්ශණයක් සමග පළමු සන්ධ්‍යා මෙහෙය හා පසුදින මංගල උළෙලද එහි සැදැහැවතුන් විසින් පවත්වන ලදී. එහි දී මූලිකත්වය ගත්තේ ජේ.ඒ.පී. අප්පුහාමි මහතාය. ඉන්පසුව වසරක් පාසා සැප්තැම්බර් මස තුන්වන ඉරුදින අරක්ගත් මුනිවර්ය වෙනුවෙන් මංගල උළෙල පවත්වනු ලැබේ.

1987 කුරුණෑගල පදවිය බිහිවීමත් සමග අබිසෙස් ලැබූ පළමු රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ විශේෂ අවධානය, උඩුබද්දාව දේවස්ථානය වෙත යොමුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1996 ඔක්තෝබර් මස 13 වන දින ස්වාධීන මීසමක් බවට පත්කරන ලදී. එහි ප්‍රථම මීසම්පති වුයේ ගරු ලීනස් කුරුකුලාරච්චි පියතුමන්ය.

මෑත කාලීනව

එක් එක් පියතුමන්ලාගේ කාලවකවානු තුළ භෞතික වශයෙන් දේවස්ථානය ගොඩනැගුණ ආකාරය පහත පරිදි වේ.

- 1985 වසරේ දේවස්ථානයේ සේවය කළ ගරු ජෙරල්ඩ් විනීෂියස් පියතුමා විසින් ගීතිකා කණ්ඩායම ස්ථාපිත කරන ලදී.
- 1988 වසරේ දේවස්ථානයේ සේවය කළ ගරු රොජර් ක්‍රිස්ටෝපර් පියතුමාගේ නායකත්වයෙන් යුතු දායක සභාව විසින් දේවස්ථානයේ ඉදිරිපස මණ්ඩපය ඉදිකරන ලදී.
- 1994 වසරේ දේවස්ථානයේ සේවය කළ ගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමාගේ සමයේ නව මීසම් ගෘහය සෑදීම ආරම්භ කර 1995 සැප්තැම්බර් 14 වන දින කුරුණෑගල රදගුරු තැන්පත් අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් විසින් ආසිරි ගන්වා විවෘත කරන ලදී.
- ලීනස් කුරුකුලආරච්චි පියතුමාගේ සමයේ ජනසෙත ආයතනය මගින් මෙහෙයවන පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා පෙරපාසල පැවැත්වෙන ගොඩනැගිල්ල ඉදිකරන ලදී.
- 1997 සිට 1998 දක්වා කාලය තුළ කට්ටිමහන මීසමේ සිට උඩුබද්දාව මීසමේ වැඩ බලන ලද ගරු ජෝසප් තිසේරා පියතුමාගේ සමයේදී අල්තාරය උඩ වහලය වෙනස් කර සකස්කර සාදන ලද අතර කළුගලින් සාදා තිබූ අල්තාර මේසය ඉවත් කර ලී අල්තාර මේසයක් ඒ සඳහා භාවිතා කළ අතර, අල්තාරයේ බිමට ටයිල් අල්ලා අලංකාර කරන ලදී. දේවස්ථානයේ වහලය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීම මේ සමයේ සිදුවිය.
- වසර 2000 දී දේවස්ථානය ගොඩනගා වසර (75) ක් පිරීමේ ජුබිලිය ගරු ජෙරල්ඩ් විනීෂියස් පියතුමාගේ සමයේදී සමරන ලදී.
- 2001 සිට 2006 දක්වා කාලය තුළ මීසමේ සේවය කළ ගරු ජෝසප් තිසේරා පියතුමාගේ සමයේදී දේවස්ථාන භූමිය තුළ පමණක් ගමන් කළ වීදි පෙරහැර උඩුබද්දාව මංසන්දියේ සිට ගමන් කිරීම ආරම්භ විය. දුප්පත්, නිවෙස් අහිමි පවුල් සඳහා ආගම් භේදයකින් තොරව නිවාස සාදා දීමේ වැඩපිළිවෙලක් ද දියත් කරන ලදී.
- 2005 වසර අවසාන භාගයේදී ගරු ජෝසප් තිසේරා පියතුමාගේ අනුශාසකත්වය යටතේ මීසම් ජනතාවගේ පරිත්‍යාගයෙන් දේවස්ථානයට ලී බංකු සාදා අංග සම්පූර්ණ කිරීම ශුද්ධ වූ ජොආනා ද ආර්ක් සංවිධානය මගින් ආරම්භ කරන ලදී.
- 2006 මැයි සිට 2013 ජනවාරි දක්වා මීසමේ සේවය කළ ගරු බෘනෝ ගාමිණී පියතුමාගේ සමයේදී අල්තාරය වටා තිබූ ලී ගරාදි වැට ඉවත් කර සුදු යකඩ වැටවල් සවි කිරීම, ලූර්දු ගුහාව සැදීම, ඉදිරිපස වැට සෑදීම, ප්‍රධාන මාර්ගය අභියස දිව්‍යහෘදයේ සුරුවම ස්ථාපිත කිරීම, ශුද්ධ වූ ජොහානා ද ආර්ක් කුටිය සහ දිව්‍ය සත්ප්‍රසාද

කුටිය සෑදීම හා දේවස්ථාන භූමියේ අඹ ගස් සිටුවීම සිදුවිණි.

- 2013 පෙබරවාරි සිට 2015 මාර්තු දක්වා මීසමේ සේවය කළ ගරු උපුල් සිල්වා පියතුමාගේ සමයේදී වැසිකිලි පද්ධතියක් සෑදීම, මිනීපිටියේ වැට සෑදීම සහ ගේට්ටුවක් සවිකිරීම හා දේවස්ථානයට විශාල අඩුවක්ව පැවති දහම් පාසල් දෙමහල් ගොඩනැගිල්ල සඳහා මුල්ගල් තැබීම (2014.04.04) දින කුරුණෑගල පදවි එඬේරාණන් වන අති උතුම් හැරල්ඩ් ඇන්තනී හිමිපාණන්ගේ සුරතින් සිදුවිය.
- වින්සන්ද පෝල් සමිතිය, මරිය හමුදාව, වැඩිහිටි සමිතිය, විවාහ හමුව වැනි සමිති සමාගම් පිහිටුවීම ද සිදුවිය.
- 2015 මාර්තු සිට 2020 පෙබරවාරි දක්වා මීසමේ සේවය කළ ගරු සිඩ්නි රොෂාන් පියතුමාගේ කාලයේදී දහම් පාසල සඳහා ගොඩනැගෙමින් පැවැති දෙමහල් ගොඩනැගිල්ලේ වැඩ නිමවූ අතර 2016 බිනර මස 18 දින පදවි එඬේරාණන් වන අති උතුම් හැරල්ඩ් ඇන්තනී හිමිපාණන්ගේ සුරතින් ආසිරි ගන්වා විවෘත කිරීම සිදුවිය. ගොඩනැගිල්ල ''දොම්රේමී පියස'' නමින් නම් කරන ලදී. දේවස්ථාන ඉදිරිපස භූමිය සකස් කර අලංකාර කිරීම ශු. ජොආනා ද ආර්ක් එකමුතුවේ මුලිකත්වයෙන් සිදු කරන ලදි. දේවස්ථානයේ මුහුණත වෙනස් කර අලංකාර කිරීම, මීසම් ගෘහය අලුත්වැඩියා කිරීම, සිනු කුඩුවක් අලුතින් සෑදීම, මිනීපිටිය දකුණු පස තාප්පය ඉදිකිරීම ආරම්භ කිරීම, ප්‍රධාන මාර්ගයේ කානු පද්ධතිය සකස් කිරීමේ වැඩ ආරම්භ කිරීම සහ අලුතින් තවත් ගේට්ටුවක් ඉදිකිරීම සහ මණ්ඩපයේ සිවිලිම වෙනස් කර අලුත් වැඩියා කිරීමද සිදුවිය.
- 2020 පෙබරවාරි 16 සිට සේවය කළ ගරු ජෙරොම් පෙරේරා පියතුමන්ගේ සමයේදී ප්‍රධාන මාර්ගයේ කානු පද්ධතිය සකස් කිරීමේ වැඩ නිම කිරීම, දේවස්ථානයට තීන්ත ආලේප කිරීම, ශුද්ධවූ ජොආනා ද ආර්ක් මුනිතුමියගේ ප්‍රතිමාවක් දේවස්ථාන භූමියේ අලංකාර මණ්ඩපයක් සාදා ස්ථාපනය කිරීම සිදු විය.
- 2024 ජූලි 07 සිට 2025 ජනවාරි 17 දක්වා මීසමේ සේවය කළ ගරු ගයාන් හිරන්ත පියතුමාගේ සමයේදී 1925 වසරේ දී ප්‍රංශයෙන් ආනයනය කරන ලද ශුද්ධවූ ජොආනා ද ආර්ක් මුනිතුමියගේ ප්‍රතිමාව ප්‍රතිසංස්කරණය කර පින්තාරු කිරීම සිදු කරන ලදී.
- 2025 ජනවාරි 17 සිට මේ දක්වා සේවය කරන ගරු ටෙරන්ස් කන්නන්ගර පියතුමා විසින් 2025 මාර්තු 16 දින අලුතින් ලිදක් ඉදිකිරීම, දේවස්ථානයේ සියවස් ජුබිලි සැමරුම නිමිති කරගෙන දේවස්ථානයේ ඉදිරිපස මුහුණත අලංකාර ලෙස සෑදීම, වහලය සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීම, සම්පූර්ණ දේවස්ථානයටම තීන්ත ආලේප කිරීම සිදු කරන ලදී. ජුබිලි වසර තුළ භෞතික වශයෙන් පමණක් නොව ජනතාවගේ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසාද විවිධ වැඩසටහන් දියත් කරන ලදී.
- එක් එක් කාලවකවානුවල දේවස්ථානයේ සේවය කළ සියලුම ගරු පියතුමන්ලා ඔවුන්ට පැවරුණු කාර්යභාරයන් නිසි අයුරින් ඉටු කරමින් දෙවියන් වහන්සේ හා ජනතාව අතර මැදිහත්කරුවකු ලෙස කටයුතු කළ බව ගෞරවයෙන් සඳහන් කළ යුතුයි.

උඩුබද්දාව දේවස්ථානයේ හා එම කිතුණු සංඝයේ සියවස් ජුබිලිය ජය හඬින් හා බැති සිතින් සමරන ලද අප සැම එකම සංඝයක් හැටියට එකමුතු වී දෙවියන් වෙත හැරී මේ ගත වූ සිය වසර තුළ අපගේ දේවස්ථානය කේන්ද්‍ර කොට ගෙන අපට ඉහළින් ලැබුනු සකල දීමනාවන්ට දෙවිඳුන්ට තුති පුදමු. අපට පෙර මෙහි ජීවත් වූ අපගේම කිතුනු මුතුන් මිත්තන් බැතියෙන් සිහිපත් කරමු. ඔවුන් දහසකුත් අභියෝග ඉදිරියේ දී අභීතව කිතු සමිඳුන්ට සාක්ෂි දැරූ ලෙස සත්‍ය විශ්වාසයට විශ්වාස පක්ෂව සිටීමට අදිටන් කර ගනිමු. විශ්වාසයේ පහන ඔවුන්ගේ හදවත්හි දීප්තියෙන් බැබලිණි. දැන් එම පහන දෙදහස් විසිපහ වසරේ ජීවත් වන අපට බාරයි. එය එලෙසම ඉදිරියට ගෙනයාමට අපගේ වාරයයි.

මූලාශ්‍ර:
කනෝලික අපේ උරුමය හා සියවස් සමරු කලාපයේ පළවූ
ලක්ෂ්මන් ප්‍රියසාන්ත මහතාගේ ලිපිය.

සුවමිණි වදන්



"ජේසු ස්වාමිදරුවෝ තමන් ම වැය වෙලා - දුක් විඳලා කුරුස ගසේ උකුත් වෙලා අපට සහන සැලැස්සුවා. අපිට ජීවය දෙන්න උන්වහන්සේ මැරුණා. බඩගින්නේ සිටි අයට කන්න දුන්නා. පූප ප්‍රාතිහාර්ය කළා. උන්වහන්සේ සත්‍යය වෙනුවෙන් අපිවත් සත්‍යයට සාක්ෂි දරන්නන් බවට පත් කරන්නට එදා වගේ ම උන්වහන්සේ අදත් අපෙන් ආදරයෙන් ඉල්ලා සිටිනවා. ඒ ආශිර්වාදය තුළ ක්‍රිස්තුස් වහන්සේ වටා එක්වෙමු. උන්වහන්සේ අපේ ආලෝකය යි. උන්වහන්සේ අපේ සත්‍යයයි. උන්වහන්සේ අපේ මාර්ගයයි උන්වහන්සේ අපේ ජීවය යි. ඒ හැර වෙන කිසි කෙනෙක් මේ ලෝකයේ අපිට නැහැ. ඒ අදහස පෙරදැරි කරගෙන දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබමින් අපි ජීවත් වෙමු."

"උන්වහන්සේ පවසනවා, මනුෂ්‍යයා හරියට තණපතක් වගේ වියළී යනවා.මලක් පිපුණත් එම මල සුළඟට ගසාගෙන ගිහිල්ලා තිබුණ තැනත් නැතිවෙන්න පුළුවන් බව උන් වහන්සේ පවසනවා. මනුෂ්‍යයා කොයිතරම් දේ කිව්වත් සුළු මොහොතකින් අපේ හුස්ම ගියාම අපෙන් කිසිම අගයක් නෑ.වටිනාකමක් නෑ. ඒ නිසා වටිනාකම තිබෙන්නේ උන් වහන්සේ තුළ ජීවත් වුණොත් පමණයි. ඒ නිසා අපට දකින්නට, පෙනෙන්නට අවශ්‍ය නෑ. අපේ ක්‍රියාකාරිත්වයන් තුළින් උන්වහන්සේව දැකගන්න පුළුවන්.හැම මොහොතකම සතුටින් ජීවත් වන්නට, සතුටක් බලාපොරොත්තුවෙන් ජීවත්වන්නට පුළුවන් නම් ඒකයි ඉතාමත් වැදගත් වෙන්නේ.සමහර විට අපි දුකෙන් වේදනාවෙන් ඉන්න තාක් කල් අපට සතුටක් ළඟා කරගන්නට බැහැ. මනස මහා පුදුමාකාරයි.අප හිතන පතන දේ අපට උදාකර දෙනවා.යහපත හිතුවොත් අපට යහපතත්, අයහපත ගැන හිතුවොත් අයහපතත් අපට ළඟා කරනවා අපට රක්ෂාවක් නෑ.අපට රක්ෂාවක් ලැබෙන්නේ නෑ.අපට හරියන්නේ නෑ කියලා හිතනතාක් කල් අපට කවදාවත් හරියන්නේ නෑ. අපට හැමදේම ලැබෙන්න පෙනුනෙ නැතත් විශ්වාසය තුළ ඒවා අප හිමිකර ගන්න ඕනෙ."

"සතුට රදා පවතින්නේ ඇඳ, පුටු, මේසවල, විදුලි පංකා, චිත්‍රවල නෙවෙයි. සතුට තිබෙන්නෙ තමන්ගේ සිත තුළයි. ඒ මොනවා තිබුණත් හිතේ සතුට නැත්නම් ඉන් වැඩක් නැහැ. ඒ නිසා අපි මතක තබා ගනිමු යහපත් දේවල්වලින් අපේ සිත පුරවා ගන්න. හදවතින් වෛරය ඉවත් කරගන්න. කරදර වලින් සිත නිදහස් කරගන්න වැඩි වැඩියෙන් අනුන්ට දෙන්න. අපේක්ෂාවන් අඩුකර ගන්න.

(ගරු ස්ටැන්ලි ජීරිස් පූජාප්‍රසාදීන් වහන්සේගේ විසි පස්වන පූජකවර ජයන්තිය වෙනුවෙන් උන්වහනසේගේ දේශනා විසි පහක් අන්තර්ගත කොට සිරිල් පෙරේරා මහතා විසින් සකස් කළ "සුව මිණි වදන්" නැමති ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලදී.)

ඇතුගල මතින් පෑයූ සඳ...



කුරුණෑගල නගරය හා බැඳී පවතින ප්‍රසිද්ධ ස්ථානය වන්නේ ඇතුගල යි. ඇතුගල මුදුනට නැගුණු විට ඇතැම්විට අනුමාන වශයෙන් හෝ රිදී මහා විහාරය භූමි පරිශ්‍රයේ හරිත කලාපය පෙනෙන්ටද ද පුළුවන. මා මීට පෙර ද **"පහන් ටැඹ"** සඟරාවෙන් හෙළි කළ පරිදි දුටුගැමුණු රජතුමා ස්වර්ණමාලී චෛත්‍ය රාජයා ඉදිකිරීමේදී ඊට අවැසි රිදී සොයා ගත් ස්ථානයේ විහාරස්ථානයක් සාදා නිමකොට එය රිදී මහා විහාරය ලෙස සඟසතු කොට පූජා කරන ලද බව ඓතිහාසික තතු වලින් හෙළිදරව් වේ.

කුරුණෑගල කතෝලික රදගුරු පදවිය කෙරෙහි අවධානය යොමු කරනවිට ඊට ද ඇත්තේ ඈත ඉතිහාස කතාවකි. කුරුණෑගල රදගුරු පදවියේ පළමු රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වන්නේ අති උතුම් රේමන්ඩ් පීරිස් බිස්කුන් වහන්සේ ය.

එතුමෝ නූ උසේ ය. එතුමෝ නො කෙසඟය. එහෙත් උන්වහන්සේට තිබුණේ මහා පෞරුෂයකි. ඊට ම ගැළපෙන කාල වර්ණය ද පදමට තිතට ගැළපේ.

මා වෙසෙන්නේ දකුණු පළාතේ ය. කුරුණෑගල අයත් වන්නේ වයඹ පළාතට ය. වරක් මට එතුමෝ කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී හමු විය. ඒ ජාතික උත්සවයකදී ය. එදින නිමිත්ත වී තිබුණේ දහම් පාසල් ගුරු භවතුන්ට රජයෙන් නිළ ඇඳුම් රෙදි ප්‍රදානය කිරීමයි. එම උත්සවයට රාජ්‍ය ප්‍රධානියෙකු ලෙස සහභාගි වූයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග රජයේ හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ය. දකුණු පළාතේ ගාලු පදවියේ දහම් ගුරු භවතුන් භාරව සහභාගි වූයේ එවකට ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු කැමිලස් කුරේ පියතුමා ය.

උඩරට නැටුම් ශිල්පීන් හා ආරාධිත අමුත්තන් උත්සව ශාලාවට සහභාගි වන විට හැම දෙනාට ම තිබුණේ සතුට පිරුණු මුහුණු ය. එහෙත් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ශාලාවේ බිත්ති හා සිවිලිම දෙස බලමින් කල්ගත කළේ අදාල උත්සවයට කිසිදු රුචිකත්වයකින් තොරව ය.

කුරුණෑගල පදවි රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් බිස්කුන් වහන්සේ සභාව අමතන විට ශාලාවේ අසුන් ගෙන සිටි කාගෙත් නිදිමත දුරු විය. ඒ තරමට ම උන්වහන්සේ ගේ කථාව තියුණු විය.

''අද සමහරුන් එක එක පාට කණ්නාඩි වලින් ප්‍රශ්න දිහා බලනවා. එතකොට එකම ප්‍රශ්නය පේන්නෙ විවිධ පාට වලින්. අපි පුරුදු වෙන්න ඕන හැම විටකම ප්‍රශ්නයක් දිහා පියවි ඇසින් බලන්න. දහම් පාසල් ගුරුවර ගුරුවරියන්ට නිළ ඇඳුම් රෙදි ප්‍රදානය කිරීම අපි බෙහෙවින් අගය කරනවා. අපි ඒවාට ස්තුති වන්ත වෙනවා.

නමුත් තවම අපේ පාසල් දරුවන්ට ප්‍රමාණවත් කතෝලික පෙළ පොත් ලැබී නැහැ. පාසල් වල තවමත් කතෝලික ආගමික දරුවන්ට ප්‍රමාණවත් සම්පත් නැහැ. අපේ දහම් ගුරුවර

ගුරුවරියන් ට තම සේවයේ යෙදෙන්න ඉරු දිනට පමණක් නොමිලේ ප්‍රවාහන පහසුකම් සපයන ලෙස ඔබේ රජයෙන් අප එය බලාපොරොත්තු වෙනවා.''

හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සභාව අමතන විට එතුමා මහත් ආයාසයකින් සිනහ මුසු මුහුණක් මවා ගන්නට උත්සාහ කළද ඒ මුහුණේ තිබුණේ කෝපය පිරුණු ස්වභාවයකි. එහෙන් මෙහෙන් එකතු කරගත් වචන වල තිබුණේ 'පාට කණ්නාඩි' කතාවකි. එය ඉතා කෙටි කතාවකි.

මුලින් ගුරුවරියන් කිහිපදෙනෙකු නිල ඇඳුම් රෙදි අග්‍රාමාත්‍යවරයාගේ අතින් ලබාගත් විට ගාල්ල මීසමේ මගේ නම ද කියවුණේය.

"ඔන්න පළාතෙ අයත් ඇවිල්ලා."

රේමන්ඩ් පීරිස් බිස්කුන් වහන්සේ සමීපයෙහි සිටි අග්‍රාමාත්‍යවරයාට කීවේය. ඔහු කිසි හිනාවක් කලාවක් නැති මුහුණින් සිටියේ ය. ඒ මොහොතේ මගේ කටිනුත් වචන දෙක තුනක් පිට විය.

"මම ආවෙ ගාල්ලෙ ඉදන් සර්.."

මා එසේ කීවේ එතුමා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක වීමටත් පෙර තිබූ සම්බන්ධතාවයන් සිහිගන්වනු පිණිස ය.

අනපේක්ෂිත ලෙස ඔහුගේ හඬ ගැඹුරු විය.

''ඔව්, දැන් කියනකොට මම අහගෙන හිටියා.''

ඒ මොහොතේ මහින්ද රාජපක්ෂ මහතා කාගේ තරහක් කොහෙන් පිට කළේ දැයි දන්නේ ඔහු පමණ ය. එහෙත් රේමන්ඩ් පීරිස් බිස්කුන් වහන්සේ පෙර ලෙසම සිනහ මුහුණින් යුතු විය.

කුරුණෑගල පදවි හිටපු මහ එඬේරාණන් වන රේමන්ඩ් පීරිස් බිස්කුන් වහන්සේ සිය පදවි රාජගුරු දූතකාර්ය නිමාකොට සඟ සැපත් වී වසර අටක් ගත විය. උන්නාන්සේ එදා රටේ අග්‍රාමාත්‍යවරයා හමුවේ කළ යෝජනාව සුළඟේ පාවී ගිය සෙයකි. එහෙත් ඒ ඉදිරිපත් කළ යෝජනාව දහම් ගුරුවර ගුරුවරියන්ට ගෞරවයකි. රටේ කතෝලික සභාවට අභිමානයකි. එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක රජයට අභියෝගයකි, හිසරදයකි. උන්වහන්සේ බොහෝ විට නිහඬ පඬිරුවනකි.


රේමන්ඩ් පීරිස් බිස්කුන් වහන්සේ ජීවත්ව සිටි කාලයේ උන්වහන්සේ ගේ සැප දුක අසා විසීමට මා වඩාත් උනන්දු වන්නේ රටේ කොතැනකදී හෝ හමුවන හැරල්ඩ් ඇන්තනී පෙරේරා හිමිපාණන් වහන්සේගෙනි.

''අපි උන්වහන්සේව හොඳින් බලා ගන්නවා මංගල.'' ඒ වචන වල දෝරේ ගලායන ආදරයේ අරුත වන්නේ පුත්‍ර ස්නේහයක යුතුකම ඉටු කිරීමයි

සඟසැපත් රේමන්ඩ් පීරිස් රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ අවමංගල්‍ය දේව මෙහෙය හා අවසන් කටයුතු ඒ පිළිබඳව අන්තර්ජාලයෙන් දකින්නට ලැබුණි. සැබැවින්ම එය රාජකීය අවමංගල්‍ය උත්සවයකි. උන්වහන්සේ ගේ රූපකාය අප දෙනෙතින් මැකී වැසී ගියද ඇතුගල්පුර පදවි ප්‍රථම මහ එඬේරාණෝ අති උතුම් රේමන්ඩ් පීරිස් රාජගුරු හිමිපාණන් වහන්සේ ගේ නාමය පදවි ඉතිහාසය පුරා සදා අමරණීය වනු නො අනුමානය.

මංගල ජයවර්ධන
ගිංතොට







Prepositions (නිපාත පද)

English Without Tears

Used with the meaning "in the company of", "by means of", "Possession" or "Relationship"
("සමඟින් , "මඟින්, හෝ "සහිතව, ලෙස අර්ථ ගැන්වීමකදී)

1. Trust can be broken **with** dishonesty.
2. Nobody is born **with** good manners.
3. As long as I am **with** music I feel alive.
4. Don't come to school **with** an empty stomach.
5. My father helps me **with** my homework at home.
6. The teacher educates students **with** great patience.
7. Memories with right people **will** always remain priceless.
8. Your friends no matter how close, **will** disappear with time.
9. If you lie down with dogs, you **will** get up with fleas
10. She met **with** a nasty car accident and was hospitalized immediately.
11. Nobody can make you happy until you are happy **with** yourself.
12. A sympathetic doctor always treats his patients **with** great compassion.
13. This weekend I plan to relax and have fun **with** my family.
14. The sunset painted the sky **with** warm colours.
15. I intend to share my secrets **with** my trustworthy friend.
16. Forget the failure of yesterday and start **with positive** thoughts and expectations.
17. She cut the thread **with** a pair of scissors.
18. **with** every up and down you learn lessons that make you strong.
19. You can go ahead **with** your presentation.
20. My mother takes care of me **with** love when I am sick.
21. Go on **with** your studies and no yelling indoors!
22. The out comer left the village **with** all his belongings.
23. Do not be friendlier **with** anyone than necessary.
24. That lady **with** long hair is my sister in law.
25. You may either help **with** the dishes or clean the room,
26. What's wrong **with** you for being late for the practice?
27. The mountain peaks are covered **with** show in the morning during the season.
28. I have no money **with** me to pay for the hire.
29. Wishing you a fantastic day filled **with** good thoughts and happy moments.
30. Treat everyone in your family **with** respect.
31. Give me a pen to write **with.**



Using 'with'as Prepositional Phrases. (ක්‍රියා පද හෝ නාම පද හා සම්බන්ධව වෙනස්වූ අර්ථ ගැන්වීමකදී)



1. Would you **favour** me with an early reply?
2. I am **fed up with** the existing pattern of Sinhala cinema,
3. Do not **interfere with** me in my business.
4. Not to **keep company with** bad friends.
5. I am **disgusted with** him at his conduct.
6. The employees **pleaded with** the employer for justice.
7. The family members **quarrelled with** one another for the property.
8. The principal was **annoyed with** the teacher for being absent on parent's day.
9. This parcel should be **handled with** care as it contains glassware items.
10. You should always be in good **terms with** your neighbours.
11. The thug murdered the union header **in accordance with** the request of the minister.
12. **With reference to** your advertisement, I have the honour to tender my application for the mentioned post.
13. A mind **filled with** gratitude leads to a heartful of happiness.
14. He has fever **accompanied with** headache.
15. Travelling brings us into **contact with** different types of people and fills the minds with joy.
16. Man has become the master of the universe **with the help of** modern science.
17. She is **angry with** her classmate for giving an evidence against her.
18. Although the old man is in his nineties, he is **blessed with** good health.
19. Be **united with** your friends always.
20. She is **popular with** all for her good behaviour.
21. Be **happy with** little that you have as their.
22. People **with nothing** that still manage to smile.
23. The factory went on strike **in empathy with** the dismissed worker.
24. The newly appointed receptionist **deals well with** the customer.



Ransi



බෙත්ලෙහෙමේ kia,

යුද්ධ වූ දේශයේ ජෙරුසලමට දකුණින් කුම්රාන් (Qumran) හා එයින් කාරෙම් (Ein Karem) ගම්මානවලට මැදිව පිහිටි බෙත්ලෙහෙම ගැන ලෝකවාසී ජනතාවගේ අවධානය යොමු වූයේ ජේසු සම්භූන් බෙත්ලෙහෙමේදී ලොව දිනීමත් සමඟය. බෙත්ලෙහෙම මුල් කාලයේ හඳුන්වනු ලැබුවේ එප්‍රාත් (Ephrath) නමිනි. හිබෲ භාෂාවෙන් එහි අරුත ''පූපයේ ගෘහය'' (House of Bread) යන්නය.දෙවිපුත් ජේසු සම්භූන් බෙත්ලෙහෙමේදී ලොව දිනා මිනිස්වග වෙනුවෙන් පූජාවූ බව සලකා බලනවිට මෙම නාමය බෙහෙවින්ම අර්ථාන්විතය.

මෙම වන්දනීය පුරවරය ගැන ජේසු සම්භූන් ලොව දිනීමට පෙර සිටම ශුද්ධ ලියවිල්ලේ සඳහන් ය. පුරාණ ගිවිසුම අනුව ජාකොබ් තුමා සිය බිරිඳවූ රාකෙල් දරු ප්‍රසූතියේදී මිය ගිය කල මිහිදන් කරන ලද්දේ බෙත්ලෙහෙමේ ය. ඒ ඔවුන් බෙතෙල් නගරයේ සිට එප්‍රාත් දක්වා යමින් සිටියදී එහිදී ප්‍රසව වේදනා ඇතිවී මියගිය බැවිනි.(උත්පත්ති 35:19) පුරාණ ගිවිසුමේ සාමුවෙල් ග්‍රන්ථයෙන් ද බෙත්ලෙහෙම ගැන සඳහන් කරයි. එහි 17:12 අනුව දාවිත්, ජුදස් බෙත්ලෙහෙමේ ජෙස්සේ නම් වූ එප්‍රාතියගේ පුත්‍රයාය. ඒ අනුව බෙත්ලෙහෙම දාවිත්ගේ නගරයයි. ජුසේතුමාට ජන සංගණනය සඳහා මරි මවුන් සමඟ බෙත්ලෙහෙමට යාමට සිදුවූයේ එතුමා දාවිත්ගේ වංශයට අයත් බැවිනි.

බෙත්ලෙහෙමේ ගවහලක උපන් සම්භූන් මූලින්ම බැහැදුටුවෝ එඬේරු ය. ඔවුන් ඒ අනුව පළමු නත්තල අත්දුටු බෙත්ලෙහෙම් වැසියෝ ය. ඔවුන් බැටළුවන්ට තණ කවමින් සිටියදී දේවදූතයා දර්ශනය වී ජේසු උපන් මංගල පුවත සැලකරන ලද්දේ අද බෙට්සනූර් නමින් හඳුන්වන ගවහලට කි.මී. 2 ක් පමණ දුරින්වූ තණ බිමේදීය. ඒ අනුව ජේසු උපන් මුල් දිනවල සිටම බෙත්ලෙහෙමේ නත්තල සමරන බව කිව හැකිය.

උත්පත්තියේ දෙව් මැඳුර ගොඩනංවා ඇත්තේ සම්භූ උපන් ස්ථානයේය. ක්‍රි.ව. 335 දී පමණ එවක රෝම අධිරජ්‍යය වූ කොන්ස්තන්තීනු අග රජුගේ අනුදැනුම හා අනුග්‍රහය ඇතිව මුලින්ම මෙම දෙව් මැඳුර ඉදි කරන ලද්දේ එතුමාගේ මෑණියන්වූ හෙලේනා බිසව විසිනි. ක්‍රි.ව. 530 දී ජස්ටිනියස් අධිරාජ්‍යයා විසින් මෙම දෙව් මැඳුර නවීකරණය කෙරිණ. ක්‍රි.ව. 614 පර්සියානු ආක්‍රමණවලදී කිතුනු දෙව් මැඳුරු විනාශ වුවද මෙම දෙව්මැඳුරට හානියක් සිදු නොවීය. දේව මන්දිරය ඇතුළත මහා ගාම්භීර පෙනුමක් ගෙන දෙමින් අදත් පවතින අඩි 18 ක් උඩ දැවැන්ත කුලුණු 44 එදා සිටම පවතින ඒවාය. පිටත සිට බලනවිට මහා බලකොටුවක් ලෙස දිස්වන මෙම මහා දේව මන්දිරයේ පාලනය අද කතෝලික සභාව සතුව නොපවතී. පාලනය ඕතඩොක්ස් සභාව විසිනි. එබැවින් නත්තල් දා බෙත්ලෙහෙමේ කතෝලික දිව්‍ය පූජා යාගය උත්පත්තියේ දෙව් මැඳුරේ නොපැවැත්වේ.

ලොවපුරා කතෝලික ජනතාව වෙත නත්තල් දේව මෙහෙය විකාශනය කෙරෙන්නේ උත්පත්තියේ දෙව් මැඳුරට යාබදව පිහිටි ශාන්ත

කැතරින් දේව මන්දිරයේ සිටය. ඒ රූපවාහිනිය හා ගුවන්විදුලිය මගිනි. 2012 දී යුනෙස්කෝව විසින් මෙම දෙවි මැදුර ලෝක උරුමයක් ලෙස නම් කරනු ලැබීය. කතෝලික සභාවට අයත් වන්නාවූ ද ප්‍රැන්සිස්කානුවන් විසින් පාලනය කරන්නාවූද මෙම දෙවිමැදුර ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශා. කැතරින් තුමිය නමින් කැප කර තිබේ.

අදත් බෙත්ලෙහෙමේ නත්තල් සැමරුම ඇරඹෙන්නේ දෙසැම්බර් 24 වෙනිදාය. එදින සවස උත්පත්තියේ දෙවි මැදුර ඉදිරිපිට ඇති ගවලෙන් චතුරස්‍රයට දහස් සංඛ්‍යාත සැදැහැවතුහු රැස්වෙති. ඒ අතර කතෝලික පමණක් නොව ඕතඩොක්ස් ආදී අනෙක් කිතුනු නිකාය වලට අයත් වූවෝද වෙති. කතෝලිකයෝ මැදියම් රෑ දිව්‍ය පූජාවට ශාන්ත කැතරින් දෙවි මැදුරට ද අනෙක් කිතුනු නිකායිකයින්ගේ උත්පත්තියේ දෙවි මැදුරටද පිවිසෙති.

නත්තල් උළෙලට පැමිණෙන ප්‍රැන්සිස්කානු නිකායික පූජකතුමා පලස්තීන බාලදක්ෂ තූර්ය වාදකයන් විසින් පිළිගනු ලැබේ. දිව්‍ය පූජාවෙන් පසු ජේසු බිළිඳු ප්‍රතිමාව රැගත් පෙරහැර වීදි සංචාරය කරයි. ලෝ දසදෙසින් රැස්වූ විවිධ කිතුනු නිකායික වන්දනාකරුවෝ නත්තල් බැති ගී ගයමින් ජේසු උපත සමරති. පෙරහැර වඩාත් විචිත්‍රවත් වන්නේ දැල්වූ ඉටිපහන් නිසාය.

කතෝලික සභාවට අයත් නොවූවද උත්පත්තියේ දෙවිමැදුරේ ජේසු උපන් ස්ථානය වන්දනා කිරීමට කතෝලිකයන්ට කිසිඳු බාධාවක් නොමැත.

කලානුෂ්ඨා **කැලිස්ටස් ජයමාන්න**
විල්ගෙදර

මෙරට කිතුනු ඇදහීමේ ආවර්ජනයක්...

සිතන්නට... සාකච්ඡා කරන්නට!



අතීතය සත්‍ය අයුරින් ආවර්ජනය කර ගැනීම, වර්තමානය තේරුම්ගැනීමට මෙන්ම අනාගතයට මුහුණ දීමට ඉමහත්සේ උපකාරී වන බව කවුරුත් පිළිගන්නා සත්‍යයකි. එසේ නම් ශ්‍රී ලංකා දේශයේ කිතුනු ඇදහීම හා සම්ප්‍රදායයන් පිළිබඳව **"අතීත කතාව"** ගැඹුරින් විපරම්කිරීම, කතෝලික සභාවේ වර්තමානය අවබෝධ කරගැන්මට මෙන්ම එහි අනාගතය පිළිබඳ නිවැරදි ප්‍රමුඛතා තීරණය කර ගැනීමටත් මහෝපකාරී වන බව පැහැදිළි ය. මෙරට කතෝලික සභාවේ මූලාරම්භයේ දී, 15-16-17 යන ශතවර්ෂවල මෙරට සහ යුරෝපයේ පැවති දේශපාලන, සමාජීය හා සංස්කෘතිධාරාද, ඒ සියලු ඓතිහාසික හැඩතලවලට කතෝලික සභාව ප්‍රතිචාර දුක්වූ අන්දම ද ගැඹුරින් අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය කොන්දේසියකි.

සභාවේ අධිකාරී තල එනම්, රදගුරු, පූජක, පැවිදි උතුමන්ලා බොහෝ දෙනෙකු එම ඓතිහාසික කරුණු නොදැනීම, බැරෑරුම්ව, නොසිතීම, වගකීමක් නොමැතිව අඩු කත්සේරුවකින් පසුවෙතැයි සඳහන් කිරීම වැරදි නොවේ. පොදුවේ කතෝලික සභාව තුළ මේ පිළිබඳව පවතින මන්දගාමී ස්වභාව, සභාවේ අනාගතය පිළිබඳව බලාපොරොත්තුවක් නැති තරමට කතෝලික සභා ජීවිත අප්‍රානිකව ඇති බව ද කණගාටුවෙන් සඳහන්කළ යුතු ය.

ජගත් සභාව වේවා පදවියක, මීසමක සැදහැවතුන්දේව ප්‍රාණයෙන් පුරවන හෝ ලෞකිකත්වයෙන් සෝදා පාලුපත්වන මීසම නමැති

ජීවමාන මුල්ගල (Living cell) පිළිබඳව කරුණු කාරණා කෙතරම් සැදහැවතුන් පිරිසක් තේරුම්ගෙන තිබේද? පදවිය / මීසම යන පදාර්ථයන් සදාකාලයටම පැවතීම සඳහා මූලාරම්භයේ සිට ම යාවේ දෙවියන් වහන්සේ සභාව තුළ නිර්මාණය කරන ලද පරිපාලන බල ව්‍යුහයක් යයි සිතන්නෝ ද බොහෝ ය. කතෝලික සභා විද්‍යාවේ සඳහන් වන අන්දමට පදවිය / මීසම මෙම පරිපාලන බල ව්‍යුහයන් ඉමහත්සේ බලගතු ය. එයින් පිට සභා පැවැත්මට විකල්පයක් නැත. සෑම ඇදහිලිවන්තයෙකු ම මීසමකට එමගින් පදවියකට අයිති විය යුතු ය. එම ආකෘතියෙන් පිට සභාව හා සම්බන්ධකමක් නැති ය. දෙවියන් වහන්සේගේ සියලු වරප්‍රසාදයන් කතෝලික සභාවේ අනුග්‍රහයන් එකම 'චැනලයක් ලෙස ගලා එන්නේ මීසම තුළින්ය. එයින් පිටතින් කතෝලික කමක් නැත. දේව ජනතාව සමඟ සහභාගිත්වයක් නැත.

සරලව සඳහන් කළොත් මිසමක ලියාපදිංචි නොවී මහ පවුල්පොතට නම ඇතුල් වී නොමැති නම් එදිනෙදා කතෝලික ජීවිතයට අවශ්‍ය දේව ප්‍රසාද නිධාන ලබා ගත නොහැක. සභාවෙන් සපයන අනුග්‍රහයන්ට සහ උපකාරයන්ට අයිතියක් නොමැත. බොහෝ මීසම්වල සමහර විට කතෝලික මිනි පිට්ටනියක භූමදාන වීමට ද අයිතියක් පවා නොමැත. අනෙක් පැත්තෙන් වර්තමානයේ ජීවත්වන කතෝලික සැදාහැවතුන් ඇත්තෙන්ම වාසනාවන්තය. ''කතෝලික සභාවෙන් පිට ගැලවීමක් නැත."මෑතක් වනතුරු ම එම වගන්තිය සභා ඉගැන්වීම්වල ප්‍රබල සිද්ධාන්තයක් විය. 1960 ගණන්වල ශුද්ධාත්ම බලයෙන් මුළුදුන් 2 වන වතිකානු සභාවේ ඉගැන්වීම්වලට පිං සිදුවන්නට දේව කරුණාව පාලනය කළ එවැනි සභා සිද්ධාන්ත තවත් වලංගු නොවේ. එහෙත් එවැනි ''අධර්මිෂ්ඨ වූ'' මතයන් සභා ජනතාව තුළ, අධිකාරීන් තුළ තවමත් දෝංකාරය වේ.

දේව අනුග්‍රහයෙන් කතෝලික සභාවේ ප්‍රධාන වූ සම්භාවයක් වන්නේ, නිරන්තරයෙන්ම සභාව පරිවර්තනය වීමය.

මෑත කාලයේ 1962 සිට 1965 දක්වා මුළුදුන්2 වන වතිකානු සමුළුව අවසාන යුගයේ ඇති වූ සභා පෙරළිය, නව දැක්ම, ශුද්ධාත්මයාණන්ගේ සුළි කුණාටුවක්, ''ශ්‍රී වචනයේ සුනාමියක්" ලෙසින් හැඳින්වීම යුක්ති සහගත ය. එදා මෙදා වසර 60 ක් ගත වෙමින් තිබියදී එම සුළි කුණාටුව වර්තමානයේ සභාව තුළ හමා යන්නේ සිසිල් සුළඟක් මෙන්ය. ශ්‍රී වචනයේ සුනාමිය වර්තමාන සභාව තුළ නිසල මුහුදේ කුඩා රැල්ලක් ලෙස සඳහන් කිරීම උචිත ය. කරුණු මෙසේ නම් 6% ක් පමණ වූ කතෝලික ජනතාවගෙන් ශ්‍රී ලංකා ජනතාවට කිසියම් වූ විමුක්ති පණිවිඩවක් ක්‍රිස්තු සාක්ෂියක් වර්තමානයේ ලැබේ දැයි සැක උපදවන සුළුය. මෙරට ජනතාවට සත්‍යයේ සහජීවනයේ ප්‍රබල සාක්ෂියක් වනවා තබා තම මීසමේ ජනතාව තුළ අවංක වූ සහෝදරත්වයක් හා සහජීවනයක් ගොඩනැගීමට තරම් ධර්ම ශක්තියක් නැති වී ඇත්තේ ඇයි දැයි සොයා බැලීමට සියලුදෙනාම වගකිව යුත්තෝ ය. එම කාර්ය භාර්යය පැවිදි, පූජක රදගුරු තුමන්ලාගේ වගකීමක් ලෙස තවත් සැලකීම පාපකාරී සිතුවිල්ලකි. දෙවියන් වහන්සේ බෞතිස්මයේ දී, එකිනෙකාට පවරන ලද දිවැසි කාර්යභාරය අතහැරීමකි

මෙම ලිපිය ආරම්භ කළේ කතෝලික ඇදහීම පිළිබඳ සත්‍ය අතීතාවර්ජනයකින්, ලංකා ශුද්ධ සභාවේ වර්තමානය තක්සේරු කර අනාගතය ගැන යම්කිසි බලාපොරොත්තු සහගත ධනාත්මක දැක්මක් ලබා ගැනීමටයි. මේ දක්වා ඉදිරිපත්කළ කරුණු එම ගමන් මඟට ආලෝකයක් වේවායි සිතමු. අපගේ කිතුනුකම ගැන "කණ්ණාඩියක බලන්නා සේ විමර්ශනය කර ස්වයං ඇගයීමක් සඳහා මෙම සඟරාවේ ද ඔබේ නිදහස් අදහස් ඉදිරිපත් කරන්නැයි ආරාධනා කරමි.

ශුද්ධ බයිබලයේ දෙවියන්වහන්සේ තමන්ගැන ම අනාවරණය කරන ලද, එතුමන් පිළිබඳ විශ්වාසයේ තිළිණය තවමත් අපට ලැබී නැතැයි මගේ මතය යි. කතෝලික ඇදහීම ලෙස තවමත් අපට ලැබී ඇත්තේ කුමන ආගමක හෝ වේවා දැකිය හැකි චාරිත්‍ර, චාරිත්‍ර සම්ප්‍රදායයන් ය. ඒ සියලු කාරණා එකතු කර කතෝලික ආගමත් මෙසේ යැයි අපි කල්පනා කරන පිරිසක්වී ඇත්ද? 1543 පමණේ දී ශ්‍රී ලංකාවට පැමිණි ෆ්‍රැන්සිස්කානු නිකායක ධර්මදූතයන්ද, ඒ කාලයේ ම මෙරටට පැමිණි ජේසු නිකායික අගෝස්තීනු දොමිනිකානු නිකා ධර්මදූතයන්ද ස්වදේශිකයනට හඳුන්වා දුන් විශ්වාසය කුමක්ද? 1687 දී පමණ මෙරටට රහසින් පැමිණි ජුසේ වාස් පියතුමන් සහ ඔරතෝරියානු

පූජක තුමන්ලා බාහිර ආටෝප නැති ජනතා විශ්වාසයක් වසර 150 ක් තිස්සේ ජනගත කිරීමට උත්සාහ කළ "ජුසේ වාස් ක්‍රමවේද" වර්තමානයේ ක්‍රියාත්මක කිරීම තබා මතකයක්වත් ඇත්ද? ශු.ජුසේ වාස් මුනිතුමන්ගේ ශුද්ධවන්තකම, මර්ධන ක්‍රියා, එතුමන් මූණ පෑ විවිධ බාධක කරදර ගැන සඳහන් කරමින් ධර්ම දේශනා මංගල්ල පැවැත්වීම හා ලිපි ලේඛන පල කරනවා මිස එතුමන් මෙරට කතෝලික සභාවට හඳුන්වා දීමට දිවි හිමියෙන් උත්සාහ කළ ''ගිහි කේන්දය සභා ජීවිතය'' වර්තමාන සභාවේ ක්‍රියාත්මක කිරීමට පූජක, පැවිදි හා ගිහි පිරිස් කවුරුත් නැතුවා සේ ය.

ශ්‍රී ලංකා දේශයට දැන් ශුද්ධවරයෙක් ලැබී ඇත. එතුමන්ගේ උපකාර ඉල්ලා, සහ එතුමන්ගේ ගෞරවය සඳහා මහා දේවස්ථාන, බැසිලිකා ඉදි කරනවා හැර එතුමන්ගේ ධර්මදූත කියාවලිය සහ සේවා ප්‍රමුඛතා අනුගමනය කිරීමට මෙරට සභාවේ නියමුවන් මෙන්ම ශු. ජුසේ වාස් භක්තිකයන්ට වුවමනාවක් තිබේ ද? කොවින් පදවි පරිපාලනය අවසන්කර ශ්‍රී ලංකාව කෙලින්ම රෝම පරිපාලනයට සම්බන්ධ වූ පසු 1860 ගණන්වල ප්‍රංශයෙන් මෙරටට පැමිණ මරිය ගැති නිකායේ පූජකවරු හා රදගුරුවරු ශු. ජුසේ වාස් ක්‍රමවේද ජනතාවගෙන් අමතක වන්නට ඉඩ හැර 'ඉතාලි, ප්‍රංශ මරිය භක්තිය' ආගම ලෙස ස්වදේශිකයන්ට පුරුදු කළහ. පසුගිය වසර 500ක - කාල පරාසය තුළ ස්වදේශික කිතුනුවන්ට හුරු වී ඇත්තේ ශු. බයිබලයේ, මහෝත්තම වූ යාවේ දෙවියන්වහන්සේ කෙරෙහි තැබිය යුතු තිර විශ්වාසයක්ද? නැතහොත් සෑම ආගමක ම පාහේ දක්නට ලැබෙන පොදු බාහිර භක්ති අභ්‍යාසයන්, සිරිත් විරිත්, සම්ප්‍රදායන් පමණක් යන්න මාගේ අදහසයි. මෙය අධි තක්සේරුවක් හෝ කරුණ හරි හැටි නොදැන පලකරන මත වාදයක්ද? ශ්‍රී ලංකා සභාවේ අතීතය ගැන විද්‍යාත්මකව පර්යේෂණ කරන්නට වුවමනාවක් මෙරට සභාවට තිබේ ද?

ශ්‍රී ලංකා දේශයේ සිදු කරන ලද ධර්ම සේවාව වෙනුවෙන් දෙවියන්වහන්සේ විසින් ශුද්ධවරයට ඔසවන ලද ශු.ජුසේ වාස් මුනිඳුන් 1687 මෙරට ධර්මසේවයේ යෙදෙමින් තම දුක්බර අත්දැකීම් 1695 ගෝවට ලියන ලද හසුනකින් කොටසක්මෙහි සඳහන් කරමි. එතුමන් අත්දැක ඇත්තේ සත්‍ය විශ්වාසයෙහි හීන කතෝලික ආගමක් ද?"

මෙහි (ලංකාවේ) සිටින සමහර කිතුනුවෝ ඉතා අපචාර ලෙස ජීවිත ගත කරති. නිත්‍යානුකූල බිරිඳ අතහැර දමා අන්‍ය ස්ත්‍රීන් සමඟ වාසය කරති. පුද්ගලිකව හා ප්‍රසිද්ධියේ කෙතරම් අවවාද කළත් ඔවුන් ජීවිත වෙනස්කර නොගනිති. එහෙත් තමන් රෝමානු කතෝලිකයන් හා යහපත් ක්‍රිස්තියානින් බවට අප ඉදිරියේ පුරසාරම් දොඩති. සිතේ කිසි කහටක්, අධර්මිෂ්ඨ හැඟීමක් නැතුවා සේ දේවස්ථාන බැහැ දකිති. දිව්‍ය පූජාව අසති. යාච්ඤා ආරාධනා ප්‍රසිද්ධියේ පවත්වති. අනෙකුත් ආගමික සිරිත් විරිත් ද අමතක නොකරති. පාපොච්චාරණය කර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ද ලබා ගනිති. එසේ නමුත් ඔවුන්ගේ විශ්වාසය ගැන මගේ පැහැදීමක් නැත. තමන්ගේ නිදහසට හේතු ඉදිරිපත් කරන කාරණා මුසා වන්නේ කිසි කමකට නැති දේ ය. නියමිත දිනවල ඔවුන් දන්නා මර්ධන ක්‍රියා ම ඉටු කිරීමට අමතක නොකරති. තමන් ඒවා කරන්නේ මරණෙන් පසු දඬුවම් නොලබන පිණිස යයි කියති.

නිල වශයෙන් ඔවුන් සභාවෙන්පිටු දැකීමට නොහැකි වී ඇත්තේ මෙහි (ලංකාවේ) සිටින පිරිස ස්වල්ප දෙනෙකු බැවිනි. අනෙකුත් කතෝලිකයන්ට ඔවුන් අවාදර්ශයක් වුවත් ඔවුන් අයින්කර තැබීමට ඉවසීමෙන්, කරුණාව පෙන්වීම යහපත් වේ යැයි සිතමි. සමහර කතෝලිකයන්ගේ දෙබිඩි ජීවිත ලෙහෙසියෙන් අතහැර දමාවි යයි සිතීමට බැරිය. දිව්‍ය පූජාව හා අනෙකුත් ආගමික වතාවත්වලට සහභාගී වීම ඔවුනට තහනම් කළොත් යහපත් ජීවිතයකට ඔවුන් එළඹෙතැයි ඔබතුමා සිතනවාද? එසේ නැති නම් ස්ථිරවම ඔවුන් සභාවෙන් පිට දැමිය යුතු ද? මගේ සිත පෙළෙන මෙවැනි ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීමට හෝ උපදෙසක් ගැනීමට මේ රටේ කවුරුවත් නැත. ශ්‍රේෂ්ඨතුමනි, ඔබ තුමන් සමඟ සිටිනා ධර්මවේදීන් සමඟ සාකච්ඡා කර මගේ සිත සැනසීම සඳහා අනුශාසනා කර මඟ පෙන්වන්න.

(ශු. ජුසේ වාස්මුනිතුමන් ගෝවේ ඔරතෝරියානු තාපසාරාමයේ ශ්‍රේෂ්ඨ තුමන්ට 1695 ජූලි 25 වනදා මහනුවර සිට යැවූ හසුනෙන් කොටසකි.)

මාතෘකාවට අදාළව මෙම බයිබල් කොටස්ද කියවා ගන්න.

1. ද්විතීය කතාව 6:4-9 2. ද්විතීය කතාව 30:15-20
3. මතෙව්සුපුටක 19:16-21 4. මාක්සුපුටක 12:28-31

ගරු ලෝරන්ස් ආනන්ද පියතුමා

මනෝවිද්‍යාත්මක උපදේශනය තුළින් පුද්ගල හා සමාජ සංවර්ධනය ඇතිකරයි.



මනෝවිද්‍යාත්මක උපදේශනය විද්‍යාත්මක හා අධ්‍යාපනික මෙන්ම චිකිත්සක ක්‍රියාවලියකි. උපදේශනයේදී චිත්තවේගී ගැටළු වලට පිළියම් ලබා දෙයි. ඒසේම අන්තර් පුද්ගල සම්බන්ධතාවන්ට අදාළ ගැටළු නිරාකරණය කරයි. උපදේශනය යනු නිවැරදි තීරණ ගැනීම සඳහා උපකාර කෙරෙන ක්‍රියාදාමයකි.

තවද උපදේශනය විද්‍යාත්මක විධි ක්‍රම ඇතුළත් මානසික සෞඛ්‍යය හා බැඳුණු වෘත්තීමය සේවාවකි.

පුද්ගල ජීවිතය හා බැඳුණු ඕනෑම ආකාරයේ පීඩාකාරී, ගැටළුකාරී අවස්ථාවකට මුහුණ දීමට ශක්තිය ලබා දිය හැකි මනෝවිද්‍යාත්මක ක්‍රමවේද ඇතුළත් සේවාවකි.

පුද්ගලයෙකු හෝ පවුල් සංස්ථාවක් ඍණාත්මක ආකල්පවලින් මුදවා ධනාත්මක ආකල්ප ඇති කර යහපත කරා ගෙන යන සංවර්ධනාත්මක විධි ක්‍රම ඇතුළත් සේවාවකි.

යහපැවැත්මෙන් යුතු තෘප්තිමත් ජීවිතයකට ඇති බාධක ඉවත් කළ හැකි මනෝවිද්‍යාත්මක ශිල්ප ක්‍රම ඇතුළත් විශේෂිත ශිල්පයකි.

තම සිතුවිලි හා ක්‍රියාවන් හේතුවෙන් තම ජීවිතයට හා දියුණුවට බාධා පමුණුවන පුරුදු, ජීවන රටා හා ආකල්ප වෙනස් කළ හැකි විශේෂිත වැඩ පිළිවෙලකි. ආත්ම ශක්තිය, ආත්ම සම්මානය වර්ධනය කරනු ලබන ක්‍රමවේදයකි

උපදේශනය යනු පුද්ගලයා දෙස විවේචනාත්මක ඇසකින් බැලීම හෝ විනිශ්චය කිරීම නොවේ. මානුෂීය කෝණයකින් ඔහුගේ ගැටළුව දෙස බලා එය නිරාකරණය කර දීම සඳහා සහාය වීමයි. උපදේශනය පෞරුෂ වර්ධන ක්‍රියාවලියකි. පුද්ගලයා සතු බාහිර අභ්‍යන්තර ශක්තීන්, ඵලදායී කාර්යයන් සඳහා ප්‍රජා වර්ධනය හා පුද්ගල වර්ධනය සඳහා යොදා ගැනීමකි.

මනෝවිද්‍යාත්මක උපදේශනයේදී පුද්ගලයාගේ යථාර්ථවාදී නොවන චර්යාවන්හි අරමුණු ගැන සොයා බලා ඒ අරමුණු අවබෝධ කරගෙන එම පුද්ගලයාට සහාය විය හැක. ඔහුගේ චිත්තවේගී ගැටළු වලින් මිදීමට උපකාර කිරීමෙන් ප්‍රචණ්ඩත්වය, ආත්ම හානිය, සිය දිවි නසා ගැනීමේ ප්‍රවණතාවය අඩු කිරීම මගින් පුද්ගලයාට සහාය විය හැක. එවිට එම අයගේ ''පවුල'' යන ව්‍යුහය ශක්තිමත් වේ. එමගින් ඔහු ජීවත්වන සමාජය ශක්තිමත් වේ. ගෘහස්ථ ගැටුම් වලදී උපදේශනය හේතුවෙන් ළමුන්ට සිදු වන හානිය වැළකී ඔවුන්ගේ ආතතීන් මග හැරේ.

සමාජ ප්‍රචණ්ඩත්වය, බීමත්කම වැනි දේ අඩුකිරීම උපදේශනයෙන් වන තවත් වැදගත් කාරණාවකි. මෙමගින් සමාජ සංවර්ධනය වර්ධය වේ. ශ්‍රම ඵලදායීතාව වැඩි වීම, සේවා ස්ථාන වල ගැටුම් අවම කිරීම තුළින් ආර්ථික සංවර්ධනය සීඝ්‍ර ලෙස ඉහළ යාම මගින් සමාජයට ධනාත්මක හැඟීම් ලබාදේ.

මිනිසුන් තුළ ප්‍රීතිමත් බවක්, පරිපූර්ණ බවක් ඇති වී ජීවත්වීමේ ආසාව මිනිසුන් තුළ ඵලදරයි.තවද මිනිසා විසින් නිර්මාණය කරන ව්‍යසනය මඟහරවා ගැනීමට ක්‍රමවත් උපදේශනය ඉවහල් වන අතර, මෙයද සමාජයට අත්වන ප්‍රතිලාභයකි.මිනිසුන්ගේ කුසලතාවයන් වර්ධනය කිරීමට උපකාරීවීමෙන් සමාජ වර්ධනයත්, අන්තර් සබඳතා ධනාත්මකව වර්ධනය වීමත් සිදුවේ.

තවද, උපදේශනය තුළින් සමාජයේ මානසික සෞඛ්‍ය යහපත් අතට වර්ධනය වන අතර, එමඟින් කායික සෞඛ්‍යයද ඉහළ නැංවේ.එබැවින් සෞඛ්‍ය සංරක්ෂණයටද මහත් පිටුවහලක් වේ.

මේසා විශාල ප්‍රතිලාභ රැසකට මඟහසර සලසා දෙන්නේ මනෝවිද්‍යාත්මක උපදේශනය තුළින් බව අපට නිතරගයෙන් පැවසිය හැකි සත්‍යයක් වන අතර එමගින් පුද්ගල හා සමාජ සංවර්ධනය කෙරෙහි විශාල බලපෑමක් සිදු කරනු ලැබේ.

තරංගා ප්‍රනාන්දු
වල්පිටිය දේවස්ථානය

රැසියානුන් කියන කතාවක්



එක්තරා අවන්හල් හිමියෙක් ශීත කාලය නිසා ජනතාව නොපැමිනෙන නිසාද සේවකයන්ට වැටුප් ගෙවීමට ආදයමක් නොලැබෙන නිසාද තම අවන්හල වැසීමට දැඩි අකමැත්තෙන් තීරණය කළේය. මේ අතර එදින හවස හිම වැටෙන අතරතුර අවන්හලට මහලු ස්වරූපයක් පෙන්නුම් කළ මුහුණ පුරා රැවුල වවාගත් පුද්ගලයෙක් පැමිණ පැවසුවේ කෑමට යමක් දී රාත්‍රී නවාතැන් දෙන්න පුළුවන් ද මට හොඳටම බඩගිනියි කියාය. නවාතැන් දෙන්න පුළුවන් ගාන රුබල් තුනක් කියා නවාතැන් හිමිකරු පැවැසිය, ''අනේ මන් අතෙ සල්ලි නැනේ'' අමුත්තා එවිට පැවැසිය. ''කමක් නෑ ඉන්න.'' යැයි පැවැසූ අවන්හල් කරු පාන් ගෙඩියක් දෙකට කපා කොටසක් අමුත්තාට දුන් අතර ඔහු එය අනුභව කළේ දැඩි කුස ගින්නෙන් සිටි බව අගවමිනි. බීමට බීට් රුට් වලින් සෑදූ සුප් එකක් දුන් අතර එය පානය කරන අතර බීට්කෑලි රැවුලේ වැටී තිබීම නිසාද රැවුලට රතු පෙනුමක් ලැබීම නිසා ඇතිවූ විකට



පෙනුම නිසා අවන්හල් හිමිකරුට හිනා පහල විය.

කළ උපකාරයට තුති පිදූ අමුත්තා මන් ඔයාගෙ රුබල් තුන ඔයාට මන් කවදා හරි දෙනවා. නමුත් ඔයාට මාව ආයේ කවදාවත් දකින්නට වෙන්නේ නෑ. මන් හෙට උදේ ම මෙහෙන් යනවා කියා නින්දට ගියේය.

ටික දිනක් යනවිට මොහුගෙ ව්‍යාපාරය නොසිතූ ලෙස දියුණුවට පත් වුවේ ඉඩෝරයේ සරුවට වැවෙන ගසක් සේය. කාගෙත් ව්‍යාපාර කඩා වැටෙන මේ කාලයේ තමාගේ ව්‍යාපාර දියුණු වීම නිසා දේවස්ථානයට ගොස් දෙවියන් වහන්සේ ට තුති පිදීමට සිතී පල්ලිය ට ගිය ඔහු ඒ කටයුතු හමාර කර එහි ඇති පින්තූර නරඹමින් සිටි විට සුපුරුදු මුහුණක් එක් පින්තූරයක තිබුණි. ඒ දෙසට යනවිට යමක් පයේ වැදි බැලුවිට රුබල් එකේ කාසියක් බව පෙනිනි. තව ටිකක් ඉදිරියට ගිය විට ඒ මුහුණෙ රැවුලේ සමහර තැන් රත්ත වර්ණයෙන් දිස්වූ අතර එදා අවන් හලට ආ අමුත්තාගේ මුහුණ හා සමාන බව පෙනුනි. මේ පින්තූරයේ සිටින කෙනා වෙනුවෙන් යාච්ඤා කරන්න සිතූ ඔහු ඉටිපන්දමක් ගේන්න යන්න හදන විට ඔහු දුටුවේ රුබල් දෙකේ කාසි දෙකක් එතන ඇති බවයි. ඉටිපන්දමක් ගෙන අවුත් ඔහු එතනට යාච්ඤාවක් කරන්නට නැවත ආ විට ඔහු දුටුවේ පින්තූරයේ රැවුලේ තිබූ රක්ත වර්ණය අතුරුදහන් වී ශාන්තව ඔහු දෙස සිනාසෙමින් ශෝභමානව බලා සිටින ඒ මහලු මනුෂ්‍යයාගේ පින්තූරයයි. එහි යටින් ශාන්ත නික්ලස් මුනිතුමන් ලෙස සඳහන් වූයේ, ආදරේ කරන නත්තල් සියානේ.

අමිල සිල්වා
ලියනගේමුල්ල

පුරසාරම්



මේ සැරේ අපේ පල්ලියෙ මංගල්ලෙ නරිම ජයට තිබුණනෙ. අපේ පල්ලියේ සුවාවින්, දේශනා කාරන්න ආපු සුවාවිලුත් හොඳ...ට අහිව දැනුවත් කළා. සමහරු නම් කෂ්ටවත් ගත්තද දන්නෑ, ඒත් සමහරු හොඳට එකමුතු උනා. තරුණ වෙලා හිටිය උදවියත් එක එක්කෙනා බදාගෙන සුබ පැතුව.

නැබැයි මංගල්ලවලට සමහරු ඇඳපු ඇඟුම් ගැන නං කියල වැඩක් නැහැ. සමහරු නාන්න යන්න වගේ හිටිය. උඩටත් නැහැ. පහළටත් නැහැ. නනේ... මොන ලස්සනක්ද? වැඩිහිටියො විශේෂයෙන් නාත්තලා දානගන්න එහයැ ඔය දිය හෙද්ද ඇඳපුවාම මොන ලස්සනක්ද?



ඒ විතරක්යැ. අපේ ඒකකේ නුවානෙ දවසෙ අල්තාරෙට ගිහිං ප්‍රාර්ථනාව කියාපු කෙනාගෙ ඇඟුම..? ජනවන්දනාවෙ නියම කාරපු ඇඟුමවත් දාගෙන අල්තාරෙට යන්න එහයැ. සුවාවින් මීක් නැහැ. ඉස්සර නං බෝඩ් දැම්ම සංවර ඇඟුම් ඇඳ, පැමිණෙන්න කියලා. ඒව දැං රටෙත් නැහැ. බලන්නකෝ පේය දවසට පන්සලක් ලඟට ගිහිං ඒ අය කොච්චර සංවරව ආගම අදහගන්න එනවද කියල. සම්පූර්ණ නිර්වස්ත්‍රයෙන් ආවත්, අපේ තැන්වල නං කථා කාරන්න කෙනෙක් නැහැ. එහෙම ඇවිල්ල පස්සෙ පූරසාරං කියයි.

බලධාරින්ගේ අවධානය යොමු කාරන්න වෙයි මේවට. නැත්නං දෙවියන්ට අගෞරවයක්, පල්ලියට ලැජ්ජාවක්.

සොඳුරු සෙවණ

එඩේරාගේ කටහඬ



සිහින ලොවක අතරමං වූ මේරි තම එකම දියණිය සමග මිදුලට බැස්සේ හිතේ දෙගිඩියාවෙනි. සුවනි ගැන තමන් කෙතරම් සිහින මාලිගා තැනුවා ද? වැලි මත තැනූ ගෙයක්මෙන්සියල්ල කාබාසිනියා විය, පසුගිය දිනෙක පියතුමා වැලිමත ගෙයක් තනන මෝඩ මනුෂ්‍යයකු ගැන කළ දේශනය ඇයගේ මතකයට නැගුනි. මෙය ඊට භාත්පසින්ම වෙනස්ය, ගෙයක් තනන්නට ලැබුණේද නැත. ගොඩ නැඟීමට සිතුවා පමණි මේරිගේ සිතේ දෙගිඩියාවකි. තම ඇස මෙන් බලා ගත් දියණියගේ අත අල්ලාගෙන පුදසුන වෙත කැටුව යන්නේ කෙසේ ද? සුවාමි පූජාව පටන් අරගෙන තිබුණොත් තමන්ගේ පමාව ගැන බැනුම්වරුසාවක් ඇතිවිය හැක. පූජාව පටන් අරගෙන, නොතිබුණහොත් තමන්ගේ හෘද සාක්ෂියෙන් බේරුමක් නැත. පාසලේ දී ඉගෙනගත් පිරුළක් ඇයට මතක් විය.

''මඟ හිටියොත් තෝ නසී. ගෙදර ගියොත් අඹුව නසී,'' වෙලාවට ගියොත්,, ''වෙලාවට නොගියත්,,,''

නිවසේ සිට දේවස්ථානයට ඇත්තේ හූ හඬක දුරකි. නමුත් අලුත් පොහොසතුන්ගේ තාප්ප හා වැට කඩොලු නිසා තරමක වටරවුමක් යා යුතුය.

''සුවනි දුවේ..

දැන් වේලාව හරි, තවම ලෑස්තිවෙලා ඉවර නැද්ද ? මම කාමරයට එන්න ඕනද කුමාරි හාමිව වැඩම්මවා ගෙන එන්න...

මේරිගේ කටහඬ තුළ ඇත්තේ වෙනදා නැති රළු ස්වරයකි,

''හා යං යං වරෙන්කෝ.''

ඇය තම දියණියගේ අත අල්ලා ගත්තා ය. ඥාතිවරියක් වතුර වීදුරුවක් ඉස්සරහට ගෙනාවා ය. මේරිගේ සිතේ මෝදුවේගන එන දුක මිශ්‍ර හැඟීම ඇයටම තේරුම්ගත නොහැකිය.

''බලපන් එලියට බහිද්දිම මගෙ කකුල පැටලුණා මොන බාධාවක්ද මේ,,!''

තම බෑනා වෙන්නට සිටින රැම්සි කොලු, දින කිහිපයකට පෙර කිවූ කථාවක්ද ඇගේ මතකයට ආවේ ය. ඔය කථාව ඇත්තක්ද? මගේ දුව මට එහෙම වංචාවක්කරයි ද? ඇය ගතකරන්නේ දෙබිඩිජීවිතයක් ද? නැත්නම් රැම්සි කොලුවගේ බේගලයක් ද? ඇය දියණිය සමඟ යනවා නොව යැවෙනවා ය. ගාටනවාය. කමක් නැහැ. කමක් නැහැ. මං ඉක්මන් වුණේ නැහැ. සුවාමිට ඒක සැළකරන්න. සුවාමි කීවානේ මා කරන්න ඕනා දේ. තමන්ගේ දුව සුවනි පුංචි අවධියේ ගායනා කණ්ඩායමේ සමහර චවන තනියම ගායනා කරද්දී ඇතිවුණේ පුදුමාකාර සතුටකි. එවිට සුවනිගේ සරණ මංගල දිනයේ ගායනය ගැන මේරි සිහින මැව්වා ය.

''ගාට ගාට ඉන්නේ නැතුව, ඉක්මනින් එන්නකෝ අම්මේ,,''

ඒ සුවනිගේ හඬය.

''මමයැ ගාටන්නේ, උඹනේ ලණුව කඩාගත්ත එළුවෙක් වගේ දුවන්නේ, හෙමින් පලයන්කෝ, උඹට කොදිච්චිය ද? කඩි කුලප්පුව ද? ''

ඇයි අම්මේ මිනිස්සු තවම කවුරුවත් පේන්න නැහැ,,''

''උඹ කුලප්පු නොවී ඉඳින්, මිනිස්සු තවම ගෙවල්වල වෙන්නැති,,''

''අම්මා දන්නේ නැහැ. සුවාමි නීතිකාරයා. වෙලාවට පූජාව පටන්ගනියි, ''

''රැම්සි අයියා නම් මෙලහකට පල්ලියට ගිහින් ඇති.''

''මොනවද උඹ ඔය කල්පනා කර කර යන්නේ ආකාසෙයි, මහ පොළවයි ගැට ගහන්න.'' ''ඔන්න පල්ලිය වත්තේ ගේට්ටුව ලඟටම ආවා. අර අර මිනිස්සු පල්ලියේ පිරිලා. පස්ස හැරි හැරි සමහර අය බලනවා,''

''ලෝකාග්‍ර දෙවිස්වාමිනි,, අප මේ පුදන පූජය,,,'' ඒ පියතුමාගේ කටහඬය. දිව්‍ය පූජාවේ පඬුරු පුදන අවස්ථාව ය.

''ඔය අම්මේ, දැන්හොඳටම පරක්කු වෙලා. බන්දන වෙලාව පහුවෙලා,,, සුවාමී වෙලාවටම පටන්ගන්නවා කියලා මං අම්මට කිව්වා නේ. අපේ ගායනා කණ්ඩායමේ හිටිය, බැසිලිකා අක්කත්පරක්කු වෙලා ඇවිත් පූජාවට පස්සෙයි බැන්දුවේ,,,,''

''ඇන්දුවේ උඹත් හිත හදා ගනින්,,, පූජාවට පස්සේ සුවාමි බන්දයිනෙ,''

සුවාමිගෙ උපදෙස් ඒ ආකාරයෙන්ම පිළිපැදීමට සිදුවීම ගැන මේරි සැනසුම් සුසුමක් හෙලුව් ය. සුවනි දුව හූල්ලනවාට සියුම් දුකක් ඇතිවිය.

''මේරි ඇන්ටි මං කියන විදියට කරන්නකෝ, අපි මේ වගේ අවස්ථාවන්වලදී තැනට සුදුසු නූවණ පාවිච්චි කරන්න ඕන නම් මිනිස්සු මටත් බනියි. ටිකක් බැලුවේ නැහැ කියලා. සුවනිව වෙලාවට ගෙනාවේ නැහැ කියල ඇන්ටිටත් බනියි. ඒත්,,,! !! ඒත්,,!!! පියතුමාගේ වචන මේරිගේ හද තුළ දෝංකාර දුන්නේ ය.

(ස්වර්ගස්ථ වීමට ටික දිනකට පෙර "පහන් ටැඹ" සඟරාවට එවන ලදි ලිපියකි.)

ගරු සාර්ටෝ නෝනිස් පියතුමා "පහන් ටැඹ" සඟරාවට නිරතුරුව ඉතා වසවත් ලිපි සපයමින්, වසර ගණනාවක් පුරා ලබා දුන් දායකත්වය අගය කරමින්, උන්වහන්සේට සමිඳු සෙවනේ නිත්‍ය ආනන්දය ප්‍රාර්ථනා කරන්නෙමු.

සාර්ටෝ නෝනිස් පියතුමා

මා කුඩා කළ නත්තල සැමරූ හැටි



මගේ උපන්ගම වන්නේ පුංචි රෝමය නමින් හැඳින්වුණු පමුණුගම ප්‍රදේශයේය. කතෝලික ආගම වැළඳගත් කිතුනු බැතිමතුන් මෙම ප්‍රදේශයේ ජීවත්වන අතර නත්තල් උත්සවයට මුල්තැනක් දීමට අමතක නොකළහ. ඔවුනු දෙසැම්බර් මස ලබනවාත් සමඟම කිතු උපත සැමරීමට සූදානම් වෙති. එදා ජීවත් වූ කිතුණු ජනතාව මහපොළොවට සහ පරිසරයට ආදරය කළ අතර නත්තල් සැරසිලි සඳහා මහ පොළොවට අහිතකර කිසිම දෙයක් ගත්තේ නැත.

වර්තමානයේ ශ්‍රී ලාංකික ජනතාව පුරුදු වී ඇත්තේ පොලිතීන් සහ ප්ලාස්ටික් නිෂ්පාදන පරිහරණය කිරීමටයි. මගේ ළමා කාලයේ ඒවා දැක ගැනීමට නොලැබුණු අතර වැඩිහිටියන් අපිව යොමු කළේ ඒ සඳහා අමුද්‍රව්‍ය අවට පරිසරයෙන්ම යොදා ගැනීමටයි. නත්තල් ගසට මුල්තැන දුන් අතර එය නිමකිරීම සඳහා අප ජීවත්වූ ප්‍රදේශයේ කලපුව අද්දර කඩොලාන ගසකින් විශාල ප්‍රමාණයේ අත්තක් කපාගෙන මුවහත් පිහියකින් සුරා පිරිසිදු කරගෙන නත්තල් ගස සඳහා යොදා ගත්තෙමු. එය අලංකාර කර ගැනීම සඳහා සුදු සව්කොළ හා රතු සව්කොළ ද ගත්තෙමු.

තරු සෑදීම සඳහා සිගරට් පැකට් වලින් ඉවත දමන ඊයම් කොළවලින් තරු සාදා ගතිමු. නත්තල මතක්වූ විට ගවලෙන අමතක කිරීමට බැරිය. ගවලෙන නිර්මාණය කිරීම තුළද පරිසරයට අහිතකර කිසිම ද්‍රව්‍යයක් නොගත් බව අපට මතකය.

අද අපට බොහෝ විට දැකගන්නට හැකිවන්නේ පොලිතීන් ප්ලාස්ටික්වලින් පිරුණු නත්තලක් වන අතර මෙයට ප්‍රධාන හේතුව වන්නේ යහපත් දේවල් අතහැර නරක පැත්තට යොමු වී තම තමන්ගේ වත් පොහොසත්කම් පෙන්වීමට නත්තල් උත්සවය යොදාගෙන තිබීමයි.

ලංසගේ මඩු කුමාර
කුලියාපිටිය



ආච්චියි. සීයයි..

"සන්තානං මෑණියනි, දැන් මේකට මොකද කරන්නේ? අපේ නෝනෙත් ගෙදර නෑ අහන්නවත්. අද නං එනවා ඇති. හ්ම්,, අපේ කාලේ නං ඉතිං අපි දැනගෙන හිටියා විවාහෙ කියන්නෙ. ජීවිතේට එක වරක් ලැබෙන දේව දීමනාවක් ය, වෙන් කරන්න එපා කියල තියෙනවය. කියලත්, ඒත් දැන් සමහර අය හිතනව ඇති කාලයේ වෙනසත් එක්ක දේව වචනයත් වෙනස් වෙනව කියල. ඒකයි මේ වැරදි දේවල් සාමාන්‍ය දේ බවට පත් කරගෙන ඉන්නෙ. හ්..ම්... ඒකෙන් මේකෙන් කෑම හදාගන්නත් බැරී උනා. නෝනෙ ගෙ අගේ තේරෙන්නෙත් නැතිව ගියාම තමයි.

"සී..යේ, සී..යේ,," "ඒ අච්චස්සෙ කවුද? ආ, මේ,, උඩහ ගෙදර ළමය නේ, ඇයි පුතේ,,"

"අනේ සීයේ අපේ අම්මයි තාත්තයි සල්ලි කතාවක් කිය කියා රණ්ඩු වෙනවා. එපා කියන්න කෝ මට බයයි."

"හරි පුතේ මං මොකක් හරි රණ්ඩුව නවතින විදියෙ දෙයක් කියල කෝල් කරන්නං පුතා බය නැතිව යන්න."

"අනේ අපොයි මේවා කාට කියන්නද ළමයි කියලා පිරිසකුත් ඉන්නවා කියලා මෙයාලට තේරෙන්නෙ නැති හැටි. එළිවෙන්නෙ - රෑ වෙන්නෙ රේඩියෝ, ටීවී වල මෛත්‍රී භාවනාවෙන්, පල්ලිවල හත් දවසම ප්‍රේමය, දයාව පැතිරෙනවා. ඒත් අපට මොකද මේ වෙලා තියෙන්නෙ,,,"

"අපේ මහත්තයා තනියම කතා කර කර මොකද කරන්නෙ. කෑම හදා ගත්තද? කෑවද?"

"ආ,, නෝනෙ ආවද කෑමක් කොහෙද මේ සිද්ධ වෙන ඒව එක්ක."

"ඇයි මොකද? වෙලා තියෙන්නෙ."

"මම මේ කල්පනා කරකර හිටියෙ අපේ මිනිබිරී ගැන."

"නෝනෙ මට හිතුව ඔහොම වෙයි කියලා. අපේ දුව ඔය ළමයි හදාපු හැටි එච්චර සුබ නෑ කියල මට තේරිලයි තිබුණෙ. ළමයින්ට කියල දෙන්නෙ තමන් ගැන හිතන්න විතරයිනෙ."

"ඇයි මොකද අපෙ මහත්තයා වෙලා තියෙන්නෙ."

"නෑ මං කියන්නෙ නෝනෙ, ගෑණු ළමයි හදනකොට අම්මලා මොළේ කල්පනා කරන්නෙ ඕන."

"අයියෝ මොකද මිණිබිරීට වෙලා තියෙන්නෙ හතර බීරි නැතිව කියන්න කෝ."

"ඊයේ අපේ දුව කතා කරලයි කිව්වෙ, මට නං තේරෙන්නෙ නෑ.මොනව කරන්නද කියලා."

"අනේ පිං සිද්ද වෙයි අපෙ මහත්තයා වෙච්චදේ කියනවද?"

"ඔහොම තමයි නෝනෙ, විවාහ වෙන්න ඉස්සෙල්ලා ගිරවයි-ගිරවියි වගේ ඉන්නවා. විවාහෙන් කලකට පස්සෙ මියන්න නැතිවෙලා එපා වාහෙට හොදි බෙදන කොට වාහෙටත් එපා වෙනවා."

"මේ මහත්තයෝ තේරෙන සිංහලෙන් තියනවද සිද්ධ වෙච්ච දේ."

"එදා ඉතිං දෙවියන්ටත් පොරොන්දුවෙලා අලුත් ජීවිතයක් පටන් ගන්න ගිය කෙල්ලනෙ. නෝනෙ මට හිතාගන්න බෑ මොකක්ද හේතුව කියලා."

"මේ ඕයි මනුස්සයෝ, මගෙ යකා අවුස්සන්නෙ නැතුව කියනව කොෙ මොකද අපේ දුව කිව්වේ,,"

"අන්න හරි නෝනෙ, ඔහොම තමයි වෙන්න ඇත්තෙ, අපේ එකී ඒයි,ඕයි ගාගෙන කට ගහගෙන යන්න ඇති. කොල්ලටත් තද වෙලා ප්‍රතිචාර දක්වන්න ඇති. කෙල්ලගෙ වාරෙ තමයි ආයෙ නොයන්නම ගෙදර ආපු එක. එහෙම හොඳ නෑ. පිරිමි කියන්නෙ ගරු කළ යුතු අය."

"අනේ මොකටද මගෙ කට, එතකොට ගෑණු කියන්නෙ පොල් කුඩු ද?"

"හා..හා.. හරි අපූරුයි දෙන්නගෙ සද්දෙ, ඇයි මේ අම්මයි, තාත්තයි කෑගහන්නෙ." පාරටත් ඇහුණා."

"ආ... දුව ආවද? මේ ළමයි දෙන්නත් ඉන්නෙ. මොකද දුව උනේ."

"මං තාත්තට කිව්වා දුව ගෙදර ආවා, ආයෙ යන්නෙ නෑ කියල. තාත්ත කලබලේට හරියට අහගත්තේ නෑ. අපේ දුව කියලා තියෙන්නේ එයාගෙ මහත්තයා ගමන ඉවරවෙලා එනකල් යන්නෙ නෑ කියල. තනිවම ඉන්න බැරී නිසා, මේ බෑණා දුව එක්ක යන ගමන් මෙහාටත් ගොඩවෙලා යන්න ආවා,,"

ප්‍රැන්සිස්කා ලිලියන්
පැල්ලන්දෙණිය

විශ්වාසය කොතැනද?

අසව්...!
අසව්...!!

ඇත්තටම අපි සැබෑවූ එකම දෙවියන්වහන්සේ අදහන කතෝලිකයෝද?

මොකද ඉර දින දිව්‍ය පූජාවට සහභාගි වන, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන කතෝලිකයන්වූ සමහරුන්ගේ විශ්වාසය කොතැනද?

උපතින් බෞද්ධ ආගමිකයින් වී සිට තම කතෝලික සහකරු හෝ සහකාරිය නිසා ප්‍රසාද ස්නාපනය, ආශීර්වාදකාර බන්ධනය නැමැති සක්‍රමේන්තු තුළ සැබෑවූ එකම දෙවියන් වහන්සේ අදහන, උන්වහන්සේව විශ්වාස කරන, උන්වහන්සේට ගෞරව කරන බොහෝ පිරිස් අද අප අතර ඇත.



සමහරෙක් දිව්‍ය පූජාවට සහභාගිවූවන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූවන් පන්සලේ වත් පිළිවෙත් වලටද සහභාගී වෙයි. දේවස්ථානයේ දහම් පාසලේ ඉගෙනුම ලබන තම දරුවාද පන්සලේ වත් පිළිවෙත් වලට සහභාගි කරවයි. මේ ගැන ඔවුන්ගෙන් විමසූවිට තමන් කැමති ආගමක් අදහන්නට නිදහස තිබෙන බව පවසයි.

බොහෝවිට දේවස්ථානයේදී හා කිතුනු ඒකක එකතුවීම් වලදී ඔවුන්ගේ හැසිරීම අනුව නම් ඔවුන් වැඩිපුර ඇල්මක් දක්වන්නේ බෞද්ධ ආගමට. කුමක් හෝ එක ආගමක්, එක විශ්වාසයක් තුළ ජීවත් විය යුතුයි නේද?

කියා දන්වන වගතම්...

හොරු, හොරු..
පඬුරු හොරු,,

හොර, මැර, දූෂණ, වංචා මුළු රටම ගිලගෙන, ලොකු මිනිස්සු, පොඩි මිනිස්සු කියලා භේදයක් නැතුව කවුරු කවුරුත් කිසිම බයක්, ලැජ්ජාවක්, හිරිකිතයක් නැතුව හොරකමට පුරුදු වෙලා. අනුන්ගේ දේ අයුතු අන්දමින් ලබා ගැනීම පැහැර ගැනීම හොර රහසේ ගැනීම මේ හැම එකක්ම හොරකම් පස් වැනි පණතට විරුද්ධ මරණීය පාපයක්.

ඒත් කවුද එහෙම හිතන්නේ. මහා පරිමාණයෙන් සමාජයම ගිලගත්තු මේ හොරකම දැන් පල්ලියටත් බෝවෙලා. කියන්නත් ලැජ්ජයි. තැන් තැන් වලින් ආරංචි වෙනවා "පල්ලියේ කණු" කියලා. ඉන්න අයත් මේවට හවුල් කියලා සමහර තැන්වලින් ආරංචි වෙනවා.

ඒ ගොල්ලෝ හොරකම් කරන්නේ, මිනිස්සුන්ගේ දේවල් නෙවෙයි. දෙයියන්ගේ දේවල් පාපෙට බයක් නැහැ. දෙවියන්ට බයත් නැහැ ඒ උදවිය. හැබැයි ඉතිං සමහර අය දඬුවමක් විඳිනවා. ඒත් දන්නෙ නැහැ. දේව උදහසද කියල. අපි පල්ලියේ මේ තරං වැඩ කරනවා. ඒත් අපට ඇයි මෙහෙම වෙන්නෙ. කියනව. ඇත්තෙන්ම දන්නෙ නැහැ හේතුව. මේවට හේතුව සමහර තැන්වල සුවාමිල නම් පහදල දෙනව දේශනාවේදී ප්‍රසිද්ධියේම. ඒත් සමහර සුවාමිල නම් දන්නෙ නැහැ.

උන්වහන්සේල හිතන්නෙ අනිත් අයත් තමන් වගේ අවංකයි කියල.එහෙම හරියන්නෙ නැහැ.දැං කාලෙ හුඟක් වෙනස්.

පඬුරු පෙට්ටිවලට අත දාන උදවියත් ඉන්න අතරේ ඔය පඬුරු සල්ලියි, පඬුරු බඩු මුට්ටුයි අතටම ගත්තාම නිකං ඉඳියිද? ආධාර දෙන්න හදලා තියෙන බඩු මලු වලිනුත් අඩියට බේරෙන්නම ගත්තු පල්ලියේ කණු ගැනත් අහලා තියෙනවා.

මේවයේ දී හොරුන්ට දඬුවම් දීම නෙවෙයි කරන්න තියෙන්නෙ.දෙවියන්ගෙ දේ හොරකං කරන අයට ලැබෙන දේව උදහස ගැන දැනුවත් කිරීම තමයි. එක්තරා තැනක නං එහෙම උනා කියලත් තෝල්ක තැනට ආරංචියි.

මේ ගැන කාගෙත් අවධානය යොමු වෙනවා නං හොඳයි.

▪ තෝල්ක තැන ▪

ධර්ම ප්‍රදීපය

විශ්වාසයේ ජීවිත බලගන්වන ජපමාලය



කිතුනු පවුලේ ප්‍රධානම යාච්ඤාව ජපමාලයයි. ජපමාලය ගායනා කීමේදී අපි භාවනා කරනු ලබන්නේ දේව වචනයයි. නමෝ මරිය යාච්ඤාව සෑදුවේ ගාබ්‍රියෙල් දේවදූතයාද, එළිසබෙත් තුමීද, ශුද්ධ වූ සභාවද එකතුවයි.සෑම බලවේගයක් තුලම සුවයේ බලය, ඖෂධය ජපමාලය වේ.

මරියතුමිය පාතිමා නුවර, ලූර්දු නුවර දර්ශනයවූ විට ඉල්ලා සිටියේ පව්කාරයන් වෙනුවෙන් ජපමාලය යදින ලෙසය. දෙවිඳුන්ට ලංවන විට සහෝදර ජනතාවට ආදරය, කරුණාව, උදව් උපකාර කිරීමට පෙලඹේ. දකින සහෝදරයාට ප්‍රේම නොකර නොදකින දෙවියන් හට ප්‍රේම කරන්නේ කෙසේද? කියා ශු.ජුවාම් තුමා ප්‍රශ්න කරන්නේ ඒ නිසාය. අප යාච්ඤාව තුළින් ලබන ආලෝකයත්, මඟපෙන්වීමත් සොයුරු පෙමින් එකිනෙකාට ආදරය කිරීමෙන්, තේරුම් ගැනීමෙන්, සමාව දීමෙන් සාධාරණත්වයෙන් ජීවත්වීමට බලය හා සවිය දෙවිඳුන්ගේ අනුහසින් අපට ලැබේ.

සාමයේ රැජින වන මරි මව් යදින විට සාමයේ රැස් අප තුලින් විහිදේ. අපට හිරිහැර කරන සිත් රිදවන අයට සමාව දීම තුළින් සාමයේ අත්වැල් බැඳගන්නට හැකිවේ. ජපමාලය තුළින් අප මෙනෙහි කරනුයේ ජේසුස් වහන්සේගේ මුළු ජීවිතයයි. කුරුස ගසේදී වැරදි කළ අයට සමාව දුන් ජේසු ''පියාණෙනි, ඔවුන් කරන දේ නොදැන කරන නිසා ඔවුනට සමාව දුන මැනව.'' සතුරන්ටද ප්‍රේම කළේ වම් කම්මුලට ගැසූ විට දකුණු කම්මුලත් හරවන්න. කිතු සම්දෑණන්ගේ ජීවමාන වචනවේ.

ශු.දොමිනික් තුමා විසින් දේශනා කළ සම්ප්‍රදායානුකූලව පැවතුන භක්ති අභ්‍යාසයකි. ජපමාලයේ ඉතිහාසය 12 වන ශත වර්ෂය දක්වා ඈතට විහිදී යයි. දැනට ඇති අයුරින් එය උච්චාරණය කිරීම අරම්භ වී ඇත්තේ 13 වන ශත වර්ෂයේ දී 1200 ගණන්වල ය. මේ අවධිය කිතුනු විශ්වාසයට දැඩි පීඩාකාරී යුගයක් විය.

සභා භේදය නිසා සභාවට මහත් දුක්පීඩාවලට මුහුණ දෙන්නට සිදු විය.ඔවුන් හා සටන් කරන්නට ජය ගැනීම සඳහා දෙව්මවුන් දුන් ආරක්ෂ පලිහ වනුයේ ජපමාලයයි. 1858 ප්‍රංශයේ ලූර්දු නුවර බර්නදෙත් දැරියට දර්ශනයවූ එතුමිය පව්කරුවන්ගේ සිත් හැරීම පිණිස ජපමාලය අයදිමින්, පාතිමා නුවර ප්‍රැන්සිස් ලුසී සහ ජසින්තා යන කුඩා දරුවන් තිදෙනාට දර්ශනය වූයේ 1917 වසරේ පළමුවන ලෝක යුද්ධයෙන් ආරම්භයත් සමඟය. අද සභාව විසින් ශුද්ධවන්ත භාවයට ඔසවා ඇති ගරු දොමිනික් පියතුමාට දර්ශනයවූ දෙව් මවුන් එතුමාගෙන් කළ ඉල්ලීම වූයේ ''මගේ පුත්‍රය ජපමාල භක්තිය ගැන දේශනා කරන්න. ජපමාලය උච්ඡාරණය කිරීමෙන් වේද, භේද සුණු විසුණුවේ. වරප්‍රසාද බොහෝ අත්වේ. පව්කරුවන්ගේ සිත් ධර්මයට හැරෙන ජපමාලය උච්ඡාරණය කිරීම මගේ බලවත් ආශාව බව ලෝකයට පවසන්න.'' යනුවෙනි.

කාමන් සකුන්තලා
විල්ගෙදර

ගැලවීමේ හේතුව වූ මරියාවෝ



මෙසියස් තුමන් මෙලොවට බිහි කිරීමේ ආශාව සෑම ජුදා තරුණියක තුළම විය. දාවිත්ගේ වංශයට ඉතා සුළු නෑකමක් දැරූ යුවතියෝ මේ මහඟු ගෞරවය පැතූහ. ඒ සඳහා යාච්ඤා කළහ. නාසරෙත් නුවර දුගී නිවසක එක්තරා ළඳක් ගෙන් සුරපුර තෙක් ඉහළ කොට දෙවිඳුන් යැදීමේ යෙදී සිටියේ සුරදූතයෙක් දෙව් පුවතකින් ඇයට ආචාරය පිරිනැමීය.ශුද්ධ ලියවිල්ල පිළිබඳ හොඳින් දැනසිටි ඇය මරියාය. ඇගේ යැදුම වූයේ රෝම වහල්කමින් ඊශ්‍රායලය මුදාගන්නට එන මෙසියස් තුමන්ගේ පැමිණීම කඩිනම් කිරීමටය.

ඒ කෙසේ වුවද සුරලොවින් පිළිගන්වනු ලැබූ පුවතද අනෙකක් නොව මෙසියස් වහන්සේගේ ලොවට බිහිවීම ගැනමය.''නමෝ මරියනි, ප්‍රිය ප්‍රසාද පූර්ණවන්තියනි, සියලු ස්ත්‍රීන් අතරෙන් ආශිර්වාද ලද්දී ඔබවහන්සේය. ''බියෙන් සැකයෙන් පැකිලුණු ඇය මේ අරුම පුදුම වැකියේ අරුත විමසීය. ''මෙන්න, ඔබ කුසෙහි දරුපලක් ගැබ්ගනී. ඔබ පුත්රුවණක් ප්‍රසූත කරන්නීය.ඔහුට ''ජේසුස්'' නාමය තබන්න. (**ලූක්** 1:31)

මෙසියස්ගේ මව වීම සිහිනෙකුදු නොසිතූ ඇය ගාබ්‍රියෙල් දේවදූතයාගේ වචන අසා කැළඹුනාය.ඇය දෙවියන් අවිශ්වාස නොකළ නමුදු මෙය කෙසේ සිදුවේදැයි විමසුවද දේවදූතයා දුන් පිළිතුරෙන් ඇය සන්සුන් වූවාය. ස්ත්‍රීතූ සාන්තුවහන්සේ ඔබ වෙත ආවරණය වන සේක. එබැවින් ඔබගෙන් උපත ලබන ශුද්ධ වූ තැනැන්වහන්සේ දේව පුත්‍රයායයි කියනු ලබන සේක. (**ලූක්** 1:35) දේව කැමැත්තට හිස නැමීමට මෙම නිහතමානී තරුණිය පෙළඹුනේ ඇය තුළ ශුද්ධ ලියවිල්ල ගැන තිබූ ගැඹුරු දැනීමත් පැහැදීමත් නිසාය. පොළව තෙක් පහත්වූ නිහතමානී බවෙන්ද නොසෙල්වන ගැඹුරු විශ්වාසයෙන් ද බලවත් ප්‍රේමයකින්ද පිරී හදපතුළින් නැගුණ, මුවින් බිහිවූ ''මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි.'' යන පිළිතුරත් සමඟම ශුද්ධාත්මානුභාවයෙන් ශු.ත්‍රිත්වයේ දෙවන තැනැන්වහන්සේ මනුකය ගෙන සිය කැමැත්ත ප්‍රකාශ කළ මරියතුමියගේ කුසෙහි ගැබ්ගත් සේක. වචනය තෙම මාංශ ගතවීමේ අභිරහස ලෝකයට සන්නිවේදනය වූ උතුම් මොහොත එයයි. ලොවට ගැළවීම එවිට උදා විය.

ස්වභාවික නීති අනුව මනුෂ්‍ය ආශ්‍රයකින් නොව ශුද්ධාත්ම ප්‍රේමයේ ආවරණයෙන් දේව ත්‍රිත්වෙක අනුහස් බලයෙන් මරියතුමියගේ පිරිසිදු මාංශයේ නිකැලැල් ලෙයින් තනනලද මනුබව, ශුද්ධ ත්‍රිත්වයේ දෙවන තෙම තම දෙවීකයට සංයෝග කරගත් සේක. එබැවින් ක්‍රිස්තුස් වහන්සේ ස්ත්‍රියකගෙන් තනනු ලදැයි ශු.පාවුළු තුමා අපට උගන්වයි. මරියාවන්ගෙන් මාංශය ගත් ඒ පුත්,

නොවළහාම දෙව්පුත් බැවින් මරියතුමිය නිසැකවම දෙව් මව්ය.(ලූක් 1:35)

බෙත්ලෙහෙමේ සතුන් ලගින ගවහලක වුවද ලොවට බිහිවුන ළඳරුවා දෙවියන්වහන්සේද ලෝක ගැළවුම්කරුවාණන්ද වූ බව දැනගත් මරියතුමිය තුළ පහළවූ ප්‍රීතිය, භක්තිය, ආදරය සුළුපටු නොවන්නට ඇති. ඒ ගවහළ වටාවූ තැතිකළාවේ මැදියමේදී පැතිරුණු නිහඬතාවය මැදින් නැගී ආ **''උසස් මඬලෙහි දෙවියන්වහන්සේට මහිමයද මෙලොව සුසිත් ජනහට සාමයද වේවා.''** යන ගී හඬද දුගී එඬේරුන්ගෙන් තම පුතුට ලැබුණු වැඳුම් පිදුම් ද පෙරදිග ශාස්ත්‍රවන්තයන්ගෙන් ලැබුණ අගනා තිළිණද ගැනද සතුටුවූ දේව මාතාවෝ ඒ සියල්ල සිත්හී නිදන් කර ගත්හ. නිර්වාචික නිහඬතාවය තුළින් එතුමිය ගැඹුරු පණිවිඩයක් ලෝකයට සන්නිවේදනය කළාය.

මෙසේ සිදු විය 13 වන දා

1917 මැයි 13 - දේව මාතාවන් ලුසී, ප්‍රැන්සිස්කො, ජසින්තා නම් දරු තිදෙනාට දර්ශනය වීම.

1930 ඔක්තෝබර් 13 - පාතිමා දර්ශනය ලෝකෝත්තර සිද්ධියක් ලෙස ප්‍රකාශ කිරීම.

1942 ඔක්තෝබර් 13 - පාතිමා මෑණියන්ගේ දර්ශනයේ රජත ජයන්තිය සිදුකිරීම.මෙදින මුළු ලෝකයම මරිය තුමියගේ නිර්මල හෘදයට කැප කිරීම.

1946 මැයි 13 - පාතිමා ප්‍රතිමාවට ඔටුණු පළඳවා පාතිමා මෑණියන් ලෝක රාජේශ්වරී නමින් ප්‍රකාශ කිරීම.

1946 ජූනි 13 - පාතිමා පණිවිඩය වෙනුවෙන් විශ්ව ලේඛනයක් නිකුත් කිරීම. (xii වන පියුස් ශුද්ධෝත්තම පියතුමා)

1956 ඔක්තෝබර් 13 - xii වන පියුස් ශුද්ධෝත්තම පියතුමා එව්ජින් ටිසරන්ට් කාර්දිනල් තුමාගේ මාර්ගයෙන් පාතිමාවේ නිල හමුදා ජාත්‍යන්තර මධ්‍යස්ථානය ආසිරි ගන්වා කැප කිරීම.

1962 දෙසැම්බර් 13 - 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා විසින් පාතිමාවේ අප ස්වාමිදුගේ මංගල්‍යයක් නම් කර එය මැයි 13 වන දිනට නියම කිරීම.

1965 මැයි 13 - ii වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා පාතිමා සිද්ධස්ථානයට රන් රෝස කුසුමක් ප්‍රදානය කර මුළු සිද්ධස්ථානයම පාතිමාවේ අප ස්වාමිදුවගේ රැකවරණයට භාර කිරීම.

1965 මැයි 13 - ii වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා පාතිමා දර්ශනයේ සංවත්සරයට සාමාන්‍ය වන්දනාකරුවෙකු ලෙස සහභාගිවීම සහ ලෝක සාමය සඳහා යැදීම.

1981 මැයි 13 - ii වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා පළමු පාතිමා දර්ශනයේ සංවත්සරය නිමිත්තෙන් පාතිමාවට පණිවිඩයක් යවමින් තමා ආත්මීකාකාරයෙන් ඊට සහභාගිවන බව දන්වා යැවීය. එදිනම සාන්ත පීතර චතුරස්‍රයේදී අල් අග්කාගෙන් වෙඩි පහරක් එල්ල වියී

1984 මැයි 13 - ii වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමාගේ නියමය පරිදි ලීරියේ රදගුරු පදවිය, පාතිමා රදගුරු පදවිය නමින් නම් කිරීම්

1989 මැයි 13 - පාතිමා දර්ශනලාභී ප්‍රැන්සිස්කෝ හා ජසින්තා භාග්‍යාවන්ත තත්වයට පත් කිරීම්

1991 මැයි 13 - පාතිමා කෝවාද ඊරියාහි සර්ව රාත්‍රික මෙහෙයකට සහභාගිවූ ii වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා දිව්‍ය පූජා යාගයේදී මුළු ලොව නැවතවරක් මරියතුමියගේ නිර්මල හෘදයට කැප කිරීම අලුත් කිරීම.

1992 මැයි 13 - පාතිමා දර්ශනයේ 75 වන සංවත්සරයට ශුද්ධෝත්තම පියතුමා නියෝජනය කරමින් අති උතුම් ආන්ද්‍රේ සූසා කාර්දිනල් තුමා සහභාගීවීම.

(මෙම තොරතුරු සඟරාවක් ඇසුරෙනි.)

රීටා සේනානායක
කුලියාපිටිය



නත්තල", මේ වචනය ඇසෙද්දීත්, අපේ සිත් මහත් වූ ප්‍රබෝධයකින් පිරෙනවා නේද ? ඔව්, ඇත්තෙන්ම, අප ජේසු සමිදාණන්ගේ උත්පත්තිය සැමරීමට කිතුනුවන් පමණක් නොව, නොකිතුණු ජනී ජනයා පවා දක්වන්නෙ ඉමහත් වූ ආශාවකි. අප සැවොම දන්නා පරිදි, ලෝ වාසී බහුතරයක් ජනී ජනයා නත්තල සමරනු ලබන්නේ දෙසැම්බර් මස 25 වන දිනයි. නත්තල සමරන ඔබ කෙදිනක දී හෝ කල්පනා කර බැලුවා ද, දෙසැම්බර් 25 වන දිනටම නත්තල යෙදුණේ කෙලෙසද කියා ?

"දෙසැම්බර් 25" වන දිනට නත්තල යෙදුණේ කෙලෙසද? යන පැනයට පිළිතුරු සැපයීමේදී මුලින්ම පැවසීමට තිබෙන කරුණ නම්, ශුද්ධවූ බයිබලයේ කොතැනකවත්, ජේසුස් වහන්සේ ඉපදුණේ දෙසැම්බර් 25 යැයි සඳහන් නොවන බව ජේසුස් වහන්සේගේ උත්පත්තිය පිළිබඳව ශුද්ධවූ බයිබලයේ, ශුද්ධ වූ ලූක් තුමා ගේ සුවිශේෂයේ දෙවන පරිච්ඡේදයේ සඳහන් වන පරිදි, **"ඔගස්ටස් අධිරාජ්‍ය"**, රෝමය පාලනය කරන සමයේ, "කුරේනියස්" සිරියාවේ ආණ්ඩුකාරයා ව සිටියදී, ජුදයේ **"බෙත්ලෙහෙමෙහි"** උන්වහන්සේ උපත ලබා ඇත. මෙලෙස බෙත්ලෙහෙමෙහි ජේසුස් වහන්සේ ඉපදිය යුතු බවට, මීකා දිවැසිවරයා විසින් පුරාණයේ දිවැස් වැකි පවසා ඇත. (මීකා 5: 2-5) ඉතින්, ඉහත විස්තරය තුළ කිසිවිටෙකත් ජේසුස් වහන්සේ උපන් දවසක් සඳහන් නොවීම සුවිශේෂී වෙයි. ඒ අනුව දෙසැම්බර් 25 වන දිනට නත්තල සැමරීම, "බයිබලීය මූලාශ්‍ර" මගින් ඇරඹුණු දෙයක් නොව, "ශුද්ධවූ සභා සම්ප්‍රදාය" තුළ ඇරඹුණු දෙයක් බව සඳහන් කළ යුතුමය.

එසේනම්, දෙසැම්බර් 25 වන දින නත්තල සමරන සම්ප්‍රදාය ඇරඹුණේ කෙලෙසද?

ඇත්තෙන්ම නත්තල සැමරීම ආරම්භ වී ඇත්තේ සතර වන සියවසේ පමණ සිටයි.ඊට පෙර සියවස් කිහිපයේදී රෝම අධිරාජ්‍යය තුළ දැඩි කිතුනු පීඩන සමයක් තිබූ බැවින්, එකල කිතුනුවන් රහසිගතව සමරනු ලැබුවේ "පාස්කු මංගල්‍යය'' පමණකි. එහෙත්, පසුකාලීනව කිතුනුවන් කෙරෙහි තිබූ දැඩි පීඩනය නිමා වූ බැවින්, නත්තල සැමරීම සතර වන සියවසේ පමණ සිට ආරම්භ වූවා යැයි සඳහන් කළ හැකිය. ඉතින්, මෙලෙස නත්තල සැමරීම ඇරඹුණු පසු, ඊට දිනයක් යොදා ගැනීම සිදු වූයේ පහත පරිද්දෙනි.

ක්‍රි.ව. 274 දී අවුරේලියස් නම් රෝම අධිරාජ්‍යයා, රෝමයට අළුත් උත්සවයක් හඳුන්වා දෙන ලදී.එම උත්සවය නම් "සිරියානු එමේසා නම් හිරු දෙවියන්ගේ උපන් මංගල්‍යයයි". එම උත්සවය ලතින් බසින්, "**Natalis Solis In'icti**" යන නමින් හැඳින්විය. ඇරේලියස් අධිරාජ්‍යයා එම උත්සවය සැමරීමට නම් කරන ලද දිනය වූයේ දෙසැම්බර් 25 වන දිනයි. පසුකාලීනව රෝම අධිරාජ්‍යය, ක්‍රිස්තියානිකරණය වූ පසු, මෙම උත්සවය සැමරීම නවතා දැමූ කිතුනුවන්, ඒ වෙනුවට "දෙසැම්බර් 25" වන දිනට ජේසුස් වහන්සේගේ උපත සැමරීම ආරම්භ කරන ලද්දේ, "සැබෑ ආලෝකය හා සැබෑ හිරු" වන්නේ එමේසා නම් මිථ්‍යා දෙවියන් නොව

42 පිටුවට...

සගපුරි චැසියෝ

කාලෝ අකුටිස් මුනිඳුන් සහ භාග්‍යවත් පියර් ජෝර්ජියෝ ෆ්‍රොස්සට්ටි මුනිඳුන්



[ඇන්ටෝනියෝ සල්සානෝ [මව] සහ ඇන්ඩ්‍රෑ අකුටිස් (පියා) සහ සහෝදර, සහෝදරියන් පඹුරු පුදමින්.]

4 ති උතුම් **xiv** වැනි ලියෝ පාප්වහන්සේ සිය පදවි ප්‍රාප්තියෙන් පසු ප්‍රථම වරට සගපුර වාසීන් දෙදෙනෙකු ශුද්ධවන්ත භාවයට ඔසවමින් පසුගිය සැප්තැම්බර් මස 07 වෙනි දින ශාන්ත පීතර බැසිලිකාවේ විවෘත පීඨිකාවේ 80000 ක පමණ සැදැහැවතුන් සමඟ දිව්‍ය යාගය පුද කළ බව වාර්තා විය.

භාග්‍යවත් කාලෝ අකුටිස් මුනිඳුන් සහ භාග්‍යවත් පියර් ජෝර්ජියෝ ෆ්‍රොස්සට්ටි මුනිඳුන් එදින ශුද්ධවරයට ඔසවනු ලැබූ භාග්‍යවතුන් දෙදෙනාය.

මෙහි විශේෂත්වය වන්නේ, කාලෝ මුනිඳුන්ගේ දෙමාපියන්, සහෝදරයින් ජීවමාන සමයේදීම භාග්‍යවරය හා ශුද්ධවරයට එසවීමේ දුර්ලභ සිද්ධිය සියැසින් දැක ගැනීමේ භාග්‍යය ඔවුනට හිමි වීමය. එම දිව්‍ය යාගයේ දේව ප්‍රකාශනය කියැවීම කාලෝ තුමන්ගේ සොහොයුරු මි.ලේ විසින් සිදු කරනු ලැබිණ.

1991 මාර්තු මස 03 වෙනි දින ඉතාලියේ මිලානෝ නගරයේ මොන්සායි ප්‍රදේශයේ බැතිමත් පවුලක උපත ලද කාර්ලෝ කුඩා වියේ පටන්ම දේව මාතාවන්ට හා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට අසීමිත ප්‍රේමයත්, ගෞරවයත් දැක්වීය. වයස අවුරුදු 7 දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම විශේෂ අවසරයක් මත සිදු විය.

දිනපතා දිව්‍ය පූජාවට සහභාගි වීම, ජපමාලය උච්ඡාරණය කිරීම, සතිපතා පාපොච්චාරණ සක්‍රමේන්තුව ලබා ගැනීම දින චර්යාවේ විශේෂ අංගයක් කරගෙන දේව සබඳතාවය තුළ දිවි ගෙවීය.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ **"ස්වර්ගයට යන අධිවේගී මාවත"** ලෙසින් හඳුන්වා දුන් කාලෝ දරුවා යහපත් ගුණාංග නිසා කාගේත් ආදරයට ලක්විය. පාපන්දු ක්‍රීඩාව, සුරතල් සතුන් ඇතිකිරීම, අසරණ ළමුන්ට උපකාර කිරීම ඔහුගේ විනෝදාංශ විය. වයස අවුරුදු 9 දී පමණ විශේෂයෙන් පරිගණක ක්‍රීයාවන්ට නැඹුරු වූ අතර, පරිගණක විද්වතුන් පව අභිබවා යන පුළුල් දැනුමක් ඔහු සතු විය.විශ්ව විද්‍යාල සිසුන් පරිහරණය කරන පරිගණක විද්‍යා අත්පොත තනිවම හැදෑරීය. පරිගණක සජීවීකරණය සහ වීඩියෝ සංස්කරණය විනෝදාංශයක් විය.වයස අවුරුදු 11 පටන් සිය දෙමාපියන් සමඟ දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යයන් සිදුවූ, ස්ථානයන් වෙත ගොස් රූගත කොට **"යුකරිස්ටික් මිරකල්"** නමින් වෙබ් අඩවියක් නිර්මාණය කළේය. එයට ප්‍රාතිහාර්යයන් 150 ක් පමණ අඩංගු විය.

ලෝකය පුරා සිදුවූ දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යයක් නැරඹීමට යාම ඔහුගේ ආශාව වූවත් යොවුන් වියේදීම ලියුකේමියා රෝගයට ගොදුරුවීමට සිදු විය. එම වේදනාවන් විශ්වීය සභාව හා එහි නායකයාණන් වෙනුවෙන් ඔප්පු කරන බව පවසා ඇත.

පහලොස්වන වියේ පසුවූ අකුටීස් තරුණයා 2006 ඔක්තෝබර් මස 12 වෙනි දින දිවියෙන් සමුගත් අතර දේහය අසීසියේ තැන්පත් කරනු ලැබිණ.

ඔහු ගත කළ ශුද්ධවන්ත ජීවිතය සැලකිල්ලට ගෙන 2013 පෙබරවාරි මස 15 වන දින කාදිනල් ආන්ජලෝ ස්කොලා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් එතුමා ශුද්ධවරයට එසවීමේ ක්‍රියාදාමය ඇරඹිණ. ඒ අනුව 2013 මැයි 13 වන දින පළමු අදියර වශයෙන් **"දේව සේවක"** ලෙස නම් කෙරිණි.

2018 ජූලි මස 05 වෙනි දින අති උතුම් ෆ්‍රැන්සිස් පාප් වහන්සේ විසින් දෙවන අදියර වූ **"වන්දනීය"** භාවයට ඔසවනු ලැබිණ. 2020 පෙබරවාරි 21 දින **"භාග්‍යවරයට"** එසවීමේ අවසරය ෆ්‍රැන්සිස් පාප් වහන්සේ විසින් දෙන ලද්දේ කාලෝ තුමන්ගේ මැදහත් කමින් සුව වූ ප්‍රාතිහාර්යය විශේෂඥ වෛද්‍යවරුන් විසින් තහවුරු කිරීමෙන් පසුවය.

අකුටිස් තුමන්ගේ කෙටිකාලීන ජීවිතාදර්ශය නිතරම අගය කරමින් **"අන්තර්ජාලයේ සාන්තුවරයා"** ලෙස නම් කර භාග්‍යවරයට ඔසවනු ලැබූ අකුටිස් තුමන් 2025 මැයි මස මස **ශුද්ධවන්ත භාවයට** එසවීමට ෆ්‍රැන්සිස් සසුන් පියාණන් විසින් දැනුම් දී තිබිණ. උන්වහන්සේ ස්වර්ගස්ථ වීමත් සමඟ එම සුවිශේෂී කාර්යභාරය xiv ලියෝ පාප්තුමන් විසින් ඉටු කරනු ලැබිණ.

ශු. කාලෝ අකුටිස් තුමන්ගේ දේහය නොදිරා පවතින අතර, ඒ අසල සුවය පතා යාච්ඤා කරන පිරිස් බොහෝය.



පියර් ජෝර්ජියෝ පස්සානි

ඉතාලියේ ටියුරින් නගරයේ විසූ ධනවත් පවුලක 1901 අප්‍රේල් මස 06 වන දින ජන්ම ලාභය ලැබූ පියර් ජෝර්ජියෝ කුඩා කල පටන්ම අධ්‍යාත්මික මග පෙන්වීම අගය කරමින් දේව භක්තිය හා ගෞරවය පෙරදැරිකරගෙන තම දිවි මඟ සකසා ගත්තේය.

සාන්ත වින්සෙන්ති ද පාවුලා සමිතියට සම්බන්ධවී රෝගීන් බැලීම, අසරණ වූවන් හා පිහිටෝපකාර අවශ්‍ය පුද්ගලයන් සොයා ඔවුන්ට සහනය සැලසීම සඳහා කාලය කැප කළෝය. ඒ අතර කඳු නැගීමද විනෝදාංශයක් කර ගත්තේය.

ටියුරින් නුවර විශ්ව විද්‍යාලයට ඇතුලත්ව අධ්‍යාපනය ලබමින් කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය තුළ දිළිඳුන්ගේ සුබසාධනය සඳහා කැප විය. රෝගීන්ට උපස්ථාන කිරීමද ඔහුගේ දයා සේවාවේ අංගයක් විය. ආගමික භක්ති අභ්‍යාසයන් වෙත නිතරම යොමුවූ ඔහු ඒ සඳහා සිය මිතුරන්ද උනන්දු කරවීය. තමා අයත් ප්‍රභූ පැළැන්තිය වෙත නොව අසරණයන්, පීඩිතයන් උදෙසාම නැඹුරුවූ ඔහුගේ ජීවිත කාලයද වයස 24 කට සීමා වූයේ සුව කළ නොහැකි රෝගී තත්වයත් හේතුවෙනි.

1925 ජූලි මස 24 වෙනි දින ස්වර්ගස්ථ ජෝර්ජියෝ මුනිඳුන්ගේ දේහය භාග්‍යවරයට එසවීමේ ක්‍රියාවලිය සඳහා 1981 දී ගො. ගන්නා විට නොදිරා තිබිණ. දැනට ටියුරින් නුවර ආසන දෙව්මැදුරේ තැන්පත් කර ඇති එම දේහය ඉදිරිපිට යාච්ඤා කරමින් සිටින තරුණ පිරිස් බොහෝය.


එතුමන් භාග්‍යවරයට ඔසවන ලද්දේ ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු පාප්තුමන් විසිනි.ශු.කාලෝ අකුටිස් මුනිඳුන් හා ජොජියෝ ප්‍රාස්සට් මුනිඳුන් වෙනුවෙන් ශුද්ධාසනයේ තැපැල් හා මුද්දර කාර්යාංශය විසින් මුද්දර දෙකක් නිකුත් කිරීමටද කටයුතු යොදා තිබිණ.

අන්තර්ජාලයේ සුදුවරයාණන් වන ශු.කාලෝ අකුටිස් මුනිඳුනි, අන්තර්ජාලයේ මං මුළා වන යොවුන් පරපුර නිසි මඟ ගැන්වුව මැනව.

තාරුණ්‍යයේ සාන්තුවර ශු.පියර් ජෝර්ජියෝ මුනිඳුනි, අසරණයන් පීඩිතයන් උදෙසා සේවය කරන්නට තරුණ පරපුර යොමු කළ මැනව.

සිරිල් ඩී. පෙරේරා
වල්කඩුවාව

ශු. තෝමස් මුනිතුමා



මෙතුමා ක්‍රිඃ පූඃ 1වන සියවසේ මුල් කාලයේ ඊශ්‍රායලයේ ගලිල මුහුදු අසල යුදෙව් පළාතේ උපත ලැබූ අතර ග්‍රීක භාෂාවෙන් ' තෝ ආම්"යන තේරුම ඇති " නිවුන් දරුවා "නම් අර්ථයට අනුව මෙතුමාට "තෝමස් "යන නම යොදා ඇත. ජේසුතුමාගේ ශ්‍රාවකයින් දොළොස් දෙනාගෙන් හත්වන ගෝලයා ලෙස ශු.තෝමස් මුනිතුමා කැඳවාගත් අතර එම කාර්යයට නොබියව ජේසුතුමන් සමඟ සිටිමින් කැපවීමෙන් තම සේවය හොඳින් ඉටු කළේ ය. ජේසුතුමන් උත්ථාන වී තම ගෝලයන්ට දර්ශනය වූ බව පැවසූ විට තෝමස් මුනිතුමා එය විශ්වාස නොකළ අතර "උන්වහන්සේගේ අත්වල ඇණ කැළැල් දැක, ඇණ ගසා තිබූ තැන්වල මාගේ ඇඟිල්ල තබා උන්වහන්සේගේ ඇලයෙහි මාගේ අත දමා බැලුවොත් මිස විශ්වාස නොකරමි"යි කීය.

ජේසුස් වහන්සේ උත්ථාන වී දින අටකට පසු තෝමස් මුනිදුන්ට දර්ශනය වී ''ඔබේ ඇඟිල්ල මෙහි බහා මාගේ අත් බලන්න; ඔබේ අත දිගුකර මාගේ ඇලයෙහි තබන්න."යැයි වදාළ සේක. එවිට තෝමස් මුනිතුමා පිළිතුරු දෙමින්, ''මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි"යැයි පැවසීය. එවිට ජේසුස් වහන්සේ උත්තර දෙමින්, ''ඔබ මා දුටු බැවින් අදහා ගත්තෙහිය, නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය."යි වදාළ සේක.

වර්තමානයේ ද සෑම දිව්‍ය පූජාවකදීම පූප සහ මිදිරස ඔප්පු කරන අවස්ථාවේ දී තෝමස් මුනිතුමා වදාළ වදන් අපි ද උච්ඡාරණය කරමු.

''මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි."

ඉන්දියාවේ දිවැසිවරයා ලෙස හඳුන්වන ශු.තෝමස් මුනිදුන් ඊශ්‍රායලයේ සිට ඉන්දියාවේ කේරළ ප්‍රදේශයට ඉතාමත් දුෂ්කර මුහුදු මාර්ගයෙන් පැමිණ ජනතාවට කතෝලික දහම දේශනා කරමින් ඔවුන් කතෝලික දහමට හරවාගත් අතර මෙතුමා විසින් දකුණු ඉන්දියාවේ කේරළ ප්‍රදේශයේ කතෝලික දේවස්ථාන හතක් ඉදි කළේ ය.

දෙවිමවුන් මෙලොව ජීවිතයෙන් සමු ගනිද්දී ශු.තෝමස් මුනිතුමා සිටියේ දකුණු ඉන්දියාවේ දහම් දෙසමින් ය. දේව දූතයෙකු පැමිණ ශු.තෝමස් මුනිතුමා ඊශ්‍රායලයට ගෙන ගියේය. ඒ වන විට දේවමාතාවන්ගේ ශරීරය සොහොනෙහි තැන්පත් කර හමාරය. පසුව මෙතුමා සොහොන බැලීමට ගිය ද දෙව්මවුන්ගේ ශ්‍රී ශරීරය එහි නොතිබුණි. එවිටම දෙව්මවුන් ස්වර්ගාරෝහනය වන බව මෙතුමා දුටුවේය. දෙව්මව් තම බද පටිය ගලවා මෙතුමාට ලබා දුන්නාය. ශු.තෝමස් මුනිතුමා තමන් මිය යන තුරුම එම බද පටිය තමන් සන්තකයේ තබා ගත්තේය.

ඉන්දියාවේ අපෝස්තුලු ලෙස පිළිගත් මෙතුමා මික් දෝනියා නම් බිසව මුණගැසි ඇයට ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ දේශනා කළ පසුව ඇය කතෝලික දහම වැළඳ ගත්තාය. එම ප්‍රදේශය බාරව සිටි රජු වන ඇයගේ සැමියා මෙයට විරුද්ධ විය. මේ නිසා ශු තෝමස් මුනිතුමාගේ අත් පා බැඳ තමන් ඉදිරියට ගෙන එන ලෙස එම රජු අණ කළේය. අත්පා බැඳ රජු ඉදිරියට ගෙන ආ පසු ශු.තෝමස් මුනිතුමාගේ දෙපා යටින් රත් වූ යකඩයක් තබන ලෙස අණ කළේය. දෙපා යටින් රත් වූ යකඩ

කැබැල්ල තැබූ සැනින් එම ස්ථානයෙන් දිය උල්පතක් ඇති වී එම ජලය නිසා රත් වූ යකඩ කැබැල්ල නිවී ගියේ ය. **(එම උල්පතින් අද දක්වාම ජලය නොසිදී ගලා ගෙන එයි.)** මෙයින් රජතුමා තව තවත් කෝපයට පත් විය.

රජතුමා නැවතත් රත් වූ ගිනි උදුනක් තුළට ශු.තෝමස් මුනිදුන් දමන ලෙස අණ කළේය. මෙතුමා රත් වූ ගිනි උඳුනකට දැමූ සැනින් ගිණි උඳුන නිවෙන්නට විය. මෙම ප්‍රාතිහාර්යය දුටු රජතුමා තව තවත් කෝපයට පත් විය. ශු.තෝමස් මුනිතුමාගේ බලය නැති කර දෙවිඳුන් හා කෝපයක් ඇති කිරීමට ඔවුන්ගේ සූර්ය දෙවියන්ගේ පිළිමයට වන්දනා කරන ලෙස රජ බල කළේය.

''මා මෙම සූර්ය දෙවියන්ගේ පිළිමය ඉදිරියට ගිය ගමන් මෙම පිළිමය දෙවියන් වහන්සේ විසින් කඩා දමන සේක."යි ශු.තෝමස් මුනිතුමා රජුහට පැවසුවේය. එතුමා පැවසූ ලෙසම පිළිමය ඉදිරියට ගිය විගස එය කැබලිවලට කැඩී බිදී ගියේය. ඒ අසල සිටි රජුගේ පූජකයා දැඩි ලෙස කෝප වී ඒ අසල තිබූ හෙල්ලයක් ගෙන ශු.තෝමස් මුනිතුමාට ඇන්නේය. එතුමා වැටී මිය ගියේය. එම ස්ථානය අද ශු.තෝමස් කන්ද ලෙස හඳුන්වයි.

ඉන්දියාවේ චෙන්නායි නගරයේ ශු.තෝමස් මුනිදුන්ගේ දේහය තැන්පත් කර ඇත. එය ශු.තෝමස් දේවස්ථානය ලෙස නම් කර ඇත.

ඉන්දියාවේ අපෝස්තුලුවරයා වන මෙතුමා ශ්‍රී ලංකාවට පැමිණ දහම් දෙසූ බවට සාක්ෂි සොයා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ශු.තෝමස් මුනිදුන්ට කැප කළ දේවස්ථාන කීපයක් ඇත. මහව, මාතලේ, කෝට්ටේ, මහව, මාදගල්, පේදුරුතුඩුව ඒ අතර වේ. ශු.තෝමස් මුනිදුන්ගේ මංගල්‍යය සෑම වර්ෂයකම ජූලි මස 3 වන දින උත්කර්ෂවත් ලෙස සමරනු ලබයි.

''ශු.තෝමස් මුනිදුන්ගේ ගීය ''

ශුද්ධ වූ තෝමස් අපෝස්තුලුතුමෙනි,
අදහිල්ලේ බල දෙසූ උතුමේනි
දෙවි ආසිරි වැසි ගෙන දුන් හිමියේ
සැබදේ සැමදා සුදුවර මුනිදේ
ගලීලයේ කිතු හිමි සමිදුන්
සුකෘත දහමින් දිවි සරසා ගත්
ආශ්චර්ය පෑ සුදුවරයාණෝ
අදහිල්ලේ බල පෙන්වනු මැනවි
අවදි කළා සත්‍යය දහමෙන්
මළවුන් නැගිටු බෙර දුක් නැතිවූ
යාචිකදාවේ මහිමය පෑ මුනිදේ
අපහට නිබඳව සරණවනු මැනේ.

එරන් වීරසිංහ
b ශ්‍රේණිය
ශු.තෝමස් අපෝස්තුලුතුමන්ගේ
දහම් පාසල - මහව

---

38 පසු පිටුවෙන්...නත්තල දෙසැ....

"ජේසුස් වහන්සේ" බව පවසමිනි. විශේෂයෙන්ම ශුද්ධවූ බයිබලයේ, පුරාණ ගිවිසුමේ යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථයේ 9:2 තුළ දක්නට ලැබෙන පරිදි අනාගත සාමයේ රජාණන් ලොවට වඩින විට, "අන්ධකාරයේ ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දක්නා බව" සඳහන් වීමත්, ඒ අනාගත සාමයේ රජාණන්, ජේසුස් වහන්සේ වීමත්, මෙලෙස හිරු දෙවියන්ගේ උපත සැමරූ, දෙසැම්බර් 25 වන දිනට ජේසු සමිදාණන්ගේ උපත සැමරීමට පාදක කරගත් කරුණක් ලෙස සඳහන් කළ හැකිය.

එබැවින් දෙසැම්බර් 25 වන දිනට ජේසු සමිඳුන් ගේ උපත යොදාගැනීමට පදනම් වූ ප්‍රධානතම කාරණාව වන්නේ, "ලොවට උදා උදාවන්නා වූ සැබෑ ආලෝකය, ජේසු සමිදාණන්ය" යන කිතුනු අපගේ විශ්වාසයයි.ඉතින් එම මහා ආලෝකයේ උදාව සැමරීමට සූදානම් වන අපි, අපගේ ජීවිතත් එම මහා ආලෝකයෙන් පුරවා ගනිමු. එසේ පුරවාගත් ආලෝකය, මෙම නත්තලේදී ලොව පුරා බෙදා හැර, මුළු ලොවම අන්ධකාරයෙන් මුදවා ගනිමු.

(අන්තර්ජාලයෙනි)

රෝෂන් සුමේධ ජයසිංහ
කොහිලේගෙදර දේවස්ථානය

නිරතුරු දෙවිමව් පසසමු



සාන්ත සභාවේ මූලාරම්භයේ සිටම අති උත්කෘෂ්ඨ ස්ථානයක වැ. හිඳින මරිය වහන්සේ තරම් ලෝක වාසීන්ගේ ගෞරවාභිමානයට පාත්‍රව වෙන කිසිඳු කාන්තාවක් මෙලොව බිහිවී නැත. එතුමිය වෙනුවෙන් එතුමිය වෙනුවෙන් රචිත ගැයුම්, යැදුම් හා ග්‍රන්ථ ද, සෑදෙන චිත්‍ර හා මූර්ති එතුමියගේ ගෞරවය උදෙසා ඉදි කෙරුණු දෙව්මැදුරු සිද්ධස්ථාන දක්නට ලැබීමේදී පෙනී යන්නේ ශු.ලියවිල්ල තුළ එතුමියම ප්‍රකාශ කරන හැම පරපුරක්ම මෙතැන් සිට භාග්‍යවන්ති යැයි මට කියනු ඇත. (ලූක් 1:48) යන්නය.

එකල සමාජයේ පැවති තාඩන පීඩන අභියෝග මැද තම දිවි වුවද පරදුවට තබා එතුමිය ජේසු සමිඳුන් මෙ ලොවට දායාද කළාය. එදා ජේසු සමිඳුන් ගව ඔරුවක සැතපූ එකම මවද, දුක් විඳ කුරුස ගතවූ ජේසු පුතණුවන්ගේ ප්‍රාණය නිරුද්ධ වූ පසු නිසල වූ ශ්‍රී දේහය තම උකුල මත හොවා ගත් මාතාවද ඇයම වූවාය. ආදරයෙන් රැකබලාගත් තම එකම පුතාව මුළු මිනිස් පරපුරට පරිත්‍යාග කරමින් මාතෘත්වයේ නොමැකෙන මව් පදවියේ පිවිතුරු බව මුළු ලොවට හඳුන්වා දුන් එකම කතද ඇය වන්නීය. වත්මන් ලෝකය තුළ කාන්තා ප්‍රතිරූපය අපයෝජනයට ලක්වන චරිතයකි. දරිද්‍රතාව, විරැකියාව, හේතුවෙන් ද යොවුන් ගැබ් ගැනීම නිසා මිනීමරුමකට වඩා බරපතල පාපයක් සේ සලකෙන ගබ්සාවක් කිරීමට නූතන තරුණ මව්වරුන් උත්සුකවී ඇත. පවුල් දිවියේ වටිනාකම වෙනුවට ආත්මාර්ථය මුදුන් පමුණුවා ගනිමින් ක්‍රියා කරන මාතෘත්වයක් අප හමුවේ දිස් වන්නේය.වත්මන් කාන්තා පරපුර වෙත ශු.සභා මාතාව ගෙනහැර පාන සරල සුගම ලකුණ වන්නේ ''නාසරෙත්හි විසූ මරිය වහන්සේය. '' එදා එතුමිය ඉටු කළ ගැලවීමේ කාර්යයේ ආදර්ශයෙන්ද, වත්මන් වනිතා පරපුරද ලවණක් වී මුහුන් මෙන් ක්‍රියා කරන්නට වෙර දැරිය යුතුය.

සමයාන්තර සබඳතා හා ගත් විට එතුමිය බොදු සිරිතේ එන යසෝදරාවක, මහාමායාවක, කිසාගෝතමියක, ප්‍රජාපතියක නොවන්නීය. හින්දු දහමේ එන කාලීයක, ලක්ෂිමියක, දුර්ගාවියක, සරස්වතියක නොවන්නීය. ලාංකේය ඉතිහාසයේ දක්නට ලැබෙන විහාර මහා දේවියක අනුලාවක, සෝමා දේවියක නොවන්නීය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම දේව සැලැස්මට අවනතවූ වචනයේ දාසියකම වන්නීය. නොපියවන දෙනුවන් තුලින් අපගේ ජීවිත අවශ්‍යතා දුෂ්කරතා, බාධක වේදනා දෙස ඉල්ලන විට එය ලබාදෙන වෙළෙන්දෙක් මෙන් නොව එතුමියට අප පැවසිය යුත්තේ දෙවිඳුන් වෙතට ඔබ සැමට අපව ලංකරන ලෙසයි. මරියාවන්ගේ කැපවීම හා මුළු මනින්ම දෙවිඳුන්ට සිය පූජාවීම අදටත් අවැසි දෙයක් ලෙසින් සැලකේ. කාන්තාව තරම් මිනිස් අයිතිවාසිකම් අහිමිවූ හා බිරිඳක් ලෙසින් මහා කුරුසියක් උසුලාගෙන පවුලේ ස්වාමියා හා දරුවන් වෙනුවෙන් ඇප කැප වෙන තවත් මිනිස් ආත්මයක් ගැන සිතිය නොහැක.මරියාවන්ගේ දිවියම අද බොහෝ කාන්තාවන් විසින් එකම පිය දෙවිඳුන් වෙනුවෙන් සිය ජීවිත කැපකර ඇති බවට ඔවුන් ජීවමාන සාක්ෂිකරුවන්ය.

දේව අම්මා කොතරම් දුක්ගැහැට කම්කටොළු, දුක් වේදනාවන්ට මුහුණ දෙන්න ඇත්ද? බැලූ බැල්මට මනුෂ්‍ය මට්ටමින් මවක් ලෙස එතුමිය බොහෝ වේදනාකාරී අත්දැකීම්වලට මුහුණ දී ඇත. තමන් ආදරයෙන් ඇති දැඩි කළ එකම පුතා බොහෝ ප්‍රාතිහාර්යයන් සිදු කර, ලෙඩ රෝග සුව කර යකුන් දුරුකර සෑම කරදරයකදීම අන් අයට පිහිටවූ තම ආදරණීය පුත්‍රයා තම දෑස ඉදිරිපිටදී කෲර වද දී මරණයට පත්කරද්දී ඒ අම්මා, විඳි වේදනාව කෙසේ වන්නට ඇත්ද? දේව අම්මා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවී සාමාන්‍ය මනුෂ්‍ය ප්‍රතිචාර අභිබවා ඉතා ඉහළ අත්දැකීමකට ඇතුළු වූවාය. දෙවිඳුන්ගේ දාසිය වූ එතුමිය දෙවිඳුන් වෙත සිය දෑස් අයා බලාපොරොත්තුවෙන් දිවි ගෙව්වාය. දේව වචනය පිළිපදිමින් වේදනාවල් සියල්ල සිත්හී නිධන් කර ගත්තාය. සෑම සිදුවීමක් තුළම දෙවිඳුන් විශාල ලෙස දුටු එතුමිය අන්ධකාරය,

ඊළඟ පිටුවට...

එදා සහ අද නත්තල්
සැමරුම අතර සංසන්දනයක්



නත්තල ලොව පුරා සමරන ජනප්‍රිය උත්සව සිරියෙන් පිරි, නිවාඩු සමයකි. සියවස් ගණනාවක් පුරා, එය සමරන ආකාරය සැලකිය යුතු ලෙස විකාශනය වී ඇත. අපගේ නත්තල් සැමරුම්වල ස්වභාවය කාලයත් සමඟ පරිණාමය වී ඇති ආකාරය ගැන මෙනෙහි කිරීම කුතුහලය දනවන කරුණකි. මෙහිදී, අපි අතීතයේ නත්තල් සැමරුම්, අපගේ නූතන උත්සව සමඟ සංසන්දනය කරමු.

නත්තල විශ්වීය වශයෙන් ප්‍රීතියේ සහ එකමුතුකමේ කාලයක් ලෙස පිළිගැනෙන අතර, අපට පුරුදු දෛනික කාර්ය බහුලත්වයේ, සිට අපට අවශ්‍ය විවේකයක් ලබාදෙන සමයෙකි. මෙම උත්සව සමයේ දී, අපි අපගේ ගේ දොර, අලංකාර කර නත්තලට සූදානම් කරමින්, අපි එය සමරන ආකාරය සියවස් ගණනාවක් පුරා සැලකිය යුතු පරිවර්තනයන් පෙනෙන්නට තිබේ.

පෙර අවුරුදුවල නත්තල් සැමරුම්, අපගේ නූතන උත්සව සමඟ සංසන්දනය කිරීමට ආපසු හැරී බැලීමේ දී, සැරසිලි, තෑගි දීම, ආහාර, විනෝදාස්වාදය සහ නත්තලේ ආගමික නිරීක්ෂණය කාලයත් සමඟ වෙනස් වී ඇත්තේ කෙසේද? නත්තල් සම්ප්‍රදායන් එළිදක්වන විට එදා සහ අද නත්තල තුළ විශාල අමුත්තක් සිතට නැගෙයි.



නත්තල් සැරසිලි

එදා: නත්තල් ගස් සාමාන්‍යයෙන් ගමේ ගොඩේ බට පඳුරක අත්තක්, කස ගස් අත්තක් හෝ නුවරඑළියෙන් ගෙන එන නත්තල් ගස් සමඟ අතින් සාදන ලද ආභරණ, ඉටිපන්දම්, ඇට වර්ග සහ රස

පසු පිටුවෙන්...

අසාර්ථකත්වය, බලාපොරොත්තු කඩවීම හා මරණය වැනි අසීරු අත්දැකීම් තුළ පවා දෙවිඳුන් විශාල ලෙස දුටුවාය.

තාක්ෂණික මෙවලම් නිසා පවුල් ජීවිත තරුණ, ළමා, වැඩිහිටි ජීවිත විනාශය කරා යොමුවන අවධියක ඉවසීම, බැහැපත්කම, සංවේදීතාවය, අනුකම්පාව, පිළිගැනීම හා නිහතමානීකම සෑම ජීවිතයක් තුළම ඇති කරගනිමින් අපගේ අවශ්‍යතා මැණියන් පාමුල තබා දෙව් මව් රැකවරණය, පිහිට නොඅුව පතමින් නිරතුරු දෙව්මව් පසසමු.

දේව දයාවේ පැවිදි නිකායේ
ගරු ප්‍රින්සි කනිෂ්ඨා සොයුරිය
නාලවලාන විසම



කැවිලි, පලතුරු වලින් සරසා තිබුණි. අද: නත්තල් ගස් විවිධ ප්ලාස්ටික් ගස්, වෙළඳසැල් වලින් අධික මිලට ලබා ගෙන ආභරණ, ගෘහ විදුලි පහන් සහ සරුව පිත්තල වලින් සරසා ඇත. ඊට අමතරව, බොහෝ නිවාස සහ පොදු ස්ථාන පිම්බෙන සැරසිලි, විස්මිත ආලෝක සංදර්ශන සහ කෘතිම හිම වලින් සරසා ඇත.

නත්තල් තෑගි දීම

එදා: අතීතයේ තෑගි බෝග බොහෝ විට සරල සහ අතින් සාදන ලද ඒවා විය. නත්තල් ගස මත තෑගි එල්ලීම පොදු සම්ප්‍රදායක් වෙලා තිබුණා. අද: තෑගි දීම නත්තල් සැමරුම්වල කේන්ද්‍රීය අංගයක් බවට පත්ව ඇත. දැන්, තෑගි බොහෝ විට සාප්පුවකින් මිලදී ගෙන, සංකීර්ණ ලෙස ඔතා, නත්තල් ගස යට තබා ඇත. තාක්ෂණය, ඇඳුම්, සෙල්ලම් බඩු සහ තෑගි කාඩ්පත් පොදු තෑගි වේ.

නත්තල් භෝජනය

එදා: නත්තල් රාත්‍රී භෝජන සංග්‍රහයකට රසවත් මස් සමග සරු බත් වේළක්, කොණ්ඩා කැවුම්, අතිරස, කොකිස්, මුං අලුවා සහ කෙසෙල් සමග කේක් වලින් කෑම මේසය හැඩ වුනා. අද: සමහර අය තවමත් සාම්ප්‍රදායික කෑම වර්ග රස විඳින අතර, තවත් සමහරු විවිධ සංස්කෘතීන්ගෙන් ලැබෙන කෑම වර්ග ඇතුළත් වඩාත් විවිධාකාර සහ ගෝලීය මෙනුවකට කැමැත්තක් දක්වති. එපමණක් නොව, විශේෂ නත්තල් කේක් සහ නත්තල් සීයා සඳහා කුකීස් වැනි කැන්ඩි සහ අතුරුපස ජනප්‍රිය වී ඇත.



නත්තල් ක්‍රීඩා විනෝදාස්වාදය

එදා: නත්තල් සැමරුම්වලට බොහෝ විට කැරොල් ගායනය, දෙමාපියන් නැමදීම සහ නෑදෑ හිත මිතුරු පවුල් බැහැදැකීම් ආදාය කෙරෙහි අවධාරණය කිරීම ඇතුළත් වුණා. අද කැරොල් ගායනා සහ විශාල පවුල් රැස්වීම් තවමත් භුක්ති විඳින අතර, චිත්‍රපට නැරඹීම, රහසිගතව එන නත්තල් සීයා ක්‍රීඩාවලට සහභාගී වීම සහ තේමා සාදවලට සහභාගී වීම ඇතුළත් විනෝදාස්වාදය පරිණාමය වී ඇත. බොහෝ අය සාප්පු සවාරිය සහ විනෝද චාරිකා වැනි උත්සව ක්‍රියාකාරකම් ද භුක්ති විඳිති.

නත්තල් සමයේ ඇදහිල්ල

එදා: නත්තල ඉතා වැදගත් ආගමික උත්සවයක් වුනා. දෙව්මැදුරට යෑම සඳහාම ඇඳුම් පැළඳුම් සූදානම් වුනා. දෙව්මැදුරට පැමිණීම ඉහළ මට්ටමක පැවතුණා, දවසේ බොහෝ ක්‍රියාකාරකම් ක්‍රිස්තුස් වහන්සේගේ උපත ගැන පමණක්ම අවධාරණය කෙරුණා. අද බොහෝ දෙනෙක් තවමත් නත්තල් උත්සවය එහි ආගමික වැදගත්කම සැමරුවත්, එය තෑගි දීම සහ උත්සව සැරසිලි සහ ඇඳුම් ආයිත්තම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉතා වාණිජකරණය වූ නත්තල් සමයක් බවට පරිවර්තනය කරගෙන ඇත. එය ඉතා වැදගත් ආගමික සමයක් බව මුළු ලෝකයම අමතක කර දමා ඇත.

ජේ. ඇන්තනී

අසීමිත වූ දේව ප්‍රේමය



''ප්‍රේමය ලොව හැමතැනම ඇති - හැමදෙනටම හමුවෙලා ඇති
එනමුදු ප්‍රේමය කිමැයි කියා - හඳුනාගත් කිසි කෙනෙකු නැති''

ප්‍රේමය යනු කුමක්ද?

අපි නිරන්තරයෙන් ම ප්‍රේමය ගැන කථා කරමු. ප්‍රේමයේ විවිධ පැතිකඩ ගැන අසන්නෙමු.එතෙක් ඒ අතර අපි සැබෑ ප්‍රේමය හඳුනනවාද? සැබෑ ප්‍රේමයටත් නිර්වචන සමාජයේ බොහෝ ය. එනමුදු සැබෑ ප්‍රේමය අපට හමුවී තිබෙනවාද? අප අත්දැක තිබෙනවාද?

"ප්‍රේම නොකරන්නා දෙවියන් වහන්සේ නොහඳුනයි.මන්ද, දෙවියන් වහන්සේ ප්‍රේමය ය."

(1 යොහාන් 4:8)

දෙවියන් වහන්සේගේ ස්වභාවය ප්‍රේමය ලෙස හඳුන්වමු. එබැවින් සැබෑ ප්‍රේමය අපට අත්දැකිය හැකි වන්නේ උන්වහන්සේ තුළයි. යම් පුද්ගලයෙක් කිතු සමිඳුන්ගේ ප්‍රේමය අත්දැක නොමැතිව ඔහු අන් අයට ප්‍රේම කරන්නේ කෙසේද? අප තුළ ඊර්ෂ්‍යාව, කුහකකම, උඩඟුව වැනි දුර්ගුණවල බීජ වර්ධනය වන්නේ ඒ දේව ආදරය හදවතට දැනී නැති නිසා නොවේද? කිතුනුවන් ලෙස අපගෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන්නේ උන්වහන්සේට ආදරය කිරීමයි. එහෙත් මනුෂ්‍යයා සිදු කරන්නේ උන්වහන්සේට අනදර කරමින් පාපය රජ කරවීමයි. ලෝකයේ පව්කාරකම තව තවත් සපථ කරමින් දෙවියන් වහන්සේට පිටුපා යමින් ප්‍රසිද්ධියේ පාප සිදු කිරීමයි. ඒ නිසා මිනිසාට මේතරම් ආදරය කරන උන්වහන්සේට කොතරම් වේදනාවක් ඇතිද? එයට යම් සැනසීමක් ලබාදිය හැකි වන්නේ අපගේ ආදරයෙන් නොවේද? උන්වහන්සේ බලාපොරොත්තු වන්නේ එය නොවේද?

''දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක.එසේ කෙළේ, උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය.'' (ශු.ජොහාන් 3:16)

දෙවි සමිඳාණන් වහන්සේ උන්වහන්සේව නොහඳුනන, නොසොයන උන්වහන්සේව ප්‍රතික්ෂේප කරන ලෝකයාට කොතරම් ප්‍රේම කළාද යන්න මෙයින් පැහැදිලි වෙයි.

උන්වහන්සේ තමන්වහන්සේගේ ප්‍රේමණීය එකම පුත්‍රයාණන්ව ඔබේ මගේ පාපය වෙනුවෙන්, ඒ පාපයේ මිල ගෙවා අපට ගැලවීම උරුම කර දීම වෙනුවෙන් එකල සාපයක් ලෙස සැලකුණු කුරුසයේ මරණයට දීමට තරම් පරිත්‍යාගයක් කළ සේක.එතැනින් ද නොනැවතී උන්වහන්සේ අදත් අපව රැකගන්නා සේක.අපට ආහාර හා අවශ්‍ය සියලු දෑ සපයන සේක. නිරන්තරයෙන් ම දිව්‍යමය ආහාරය වන දිව්‍ය සත්ප්‍රසාදය මගින් අප ආත්ම ද පෝෂණය කරන සේක. ශු.පාවුළුතුමා රෝමවරුන්ට ලියූ හසුනෙන් එය මනාව පැහැදිලි වෙයි.

''උන්වහන්සේ තමන්ගේ ම පුත්‍රයාණන් වුව ද ඉතිරි කර නොගෙන, අප හැම උදෙසා පරිත්‍යාග කළ සේක. එසේ නම්, ඒ දීමනාව සමඟ උන්වහන්සේ අන් හැම දෙයක් ම අපට නොමසුරුව නොදෙන සේක් ද? (රෝම 8:32)

ප්‍රේම කළ යුත්තේ කාටද?

අපි සියල්ලෝම දෙවියන් වහන්සේ විසින් කැඳවනු ලැබූ ප්‍රේමයේ ජනතාවක් වෙමු. අන් අය අතර කිතුනු අප වෙනස් විය යුත්තේ ප්‍රේමය මඟිනි. අපත් අන් අය සේ ඇසට - ඇස, දතට - දත කියමින් එකට එක කරන්නේ නම් අපේ කිතුනුකමින් ඇති ඵලය කුමක් ද? එබැවින් සතුරාට පවා අප ප්‍රේම කළ යුතු වෙමු.

''ප්‍රේමවන්තයෙනි, අපි එකිනෙකාට ප්‍රේම කරමු.මන්ද, ප්‍රේමය දෙවියන් වහන්සේගෙන්ය. ප්‍රේම කරන සෑම දෙන ම දෙවියන් වහන්සේගෙන් උපත ලබා සිටින බැවින් උන්වහන්සේ අඳුනති.''

(1 යොහාන් 4:7)

අපි අන් අයගේ ඇප්පු හොයනවානම්, අන් අයට පහත් කොට සලකනවානම්, කොන්වූවන් පිළිනොගෙන ඒ අයව හෙළා දකිනවා නම්, අපේ ප්‍රේමය කොහිද? යාච්ඤා කළත්, දිව්‍ය පූජාවට ගියත් තත්වය මෙසේනම් අප කොතැනද? ක්‍රිස්තු ආදර්ශයෙන් අපිත් පැණවතුන්, නැණවතුන් නොව බාලයන් සොයා ගොස් ඔවුන්ට ආදරය කරමු.

යේසු සමිඳුණෝ අපට ආරාධනා කරන්නේ කුමකට ද?

''පියාණන් වහන්සේ මට ප්‍රේම කළාක් මෙන් මම ද ඔබට ප්‍රේම කෙළෙමි.මාගේ ප්‍රේමයෙහි පවතින්න.

(ශු.යොහාන් 15:9)

සමිඳුණන් වහන්සේ තුළ ප්‍රීතිමත්ව දිවි ගෙවීම සඳහා උන්වහන්සේගේ ප්‍රේමය තුළ පවතින්නට අපට කරන ඇරයුම මෙයින් පැහැදිලි වේ.

ඒ සඳහා අප කළ යුත්තේ කුමක්ද?

''මා, මාගේ පියාණන් වහන්සේගේ ආඥා පිළිපැද උන්වහන්සේගේ ප්‍රේමයෙහි පවතින සේ ම, ඔබත් මාගේ ආඥා පිළිපදින්නහු නම් මාගේ ප්‍රේමයෙහි පවතින්නාහු ය.''

(ශු.යොහාන් 15:10)

ආඥා පිළිපැදීම තුළ අපට සමිඳුන්ගේ ප්‍රේමයෙහි සිටිය හැකි වෙයි.ඒ ආඥාව නම් එකිනෙකාට ප්‍රේම කිරීමයි. ඔබත් දන්නා පරිදි ව්‍යවස්ථාවේ උතුම් ම ආඥා දෙක වන්නේ මුළු හෘදයෙන්, මුළු සිතින්, මුළු බුද්ධියෙන් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීමත් එමඟින් සහෝදයාට ප්‍රේම කිරීමත් ය.

ප්‍රේමය පාරමිතාවක් ද?

සැබැවින්ම ප්‍රේමය අන් සියලු දීමනා, ගුණාංග වලට වඩා ශ්‍රේෂ්ඨ ය. ප්‍රේමය සදාතනිකය. එය පාරමිතාවක් ලෙස හැඳින්වීමෙහි වරදක් නොපෙනේ. ශු.පාවුළු තුමා ප්‍රේමය පිළිබඳ මෙසේ දක්වා ඇත.

''මා මිනිසුන්ගේ ද දේව දූතයන්ගේ ද භාෂාවලින් කතා කරතත් ප්‍රේමය මට නැත්නම් මම ඝෝෂා කරන ඝණ්ඨාරයකට හෝ කටුක රාවය දෙන කෙතාලමකට හෝ සමාන වෙමි.''

(1 කොරින්ති 13:1)

ප්‍රේමය අප හදවත් තුළ නොමැතිව අප කොතරම් යාච්ඤා කළත්, දන් දුන්නත්, කුමන පූජාවක් කළත්, කුමන හැකියා තිබුණත් පලක් නැත.

අප ප්‍රේම කරන බව හඳුනාගන්නේ කෙසේ ද? මේ සඳහා ශු.පාවුළු තුමා දැක්වූ මාර්ගය යොදාගත හැකි යැයි සිතමි. ''ප්‍රේමය, ඉවසිලිවන්තය, කරුණාවන්තය

ප්‍රේමය, ඊර්ෂ්‍යා වන්නේ නැත. පාරට්ටු කරගන්නේ නැත. උඩඟු වන්නේ නැත.

ප්‍රේමය, අවිනීත නොවේ. ආත්මාර්ථකාමී නොවේ. හනික නොකිපේ. නපුර සිතේ ධාරණය කර නොගනියි,

ප්‍රේමය, අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවී, හරි දේ ගැන ප්‍රීති වෙයි.

ප්‍රේමය, සියල්ල උසුලයි. ප්‍රේමයෙහි විශ්වාසයට ඉමක් නැත, බලාපොරොත්තුවට නිමක් නැත. ඉවසීමට අගක් නැත.

(1 කොරින්ති 13: 4-7)

මේ තරම් උසස් ලෙස ප්‍රේම කිරීම අප ශක්තියෙන් පමණක් නිසි දිනෙක කළ නොහැකි වනු ඇත.අපි සැම දුබල පව්කාර මනුෂ්‍යයෝ වෙමු.එබැවින් ඒ සඳහා අපට බලය ලැබෙන්නේ සමිඳුණන් වහන්සේ ම මා තුළට වැඩම කර මා හා ඒකාත්මික වන ආදරයේ භෝජනය වන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මඟින් ම ය. මෙවන් අසීමිත වූ දේව ආදරය සීමිත මනුෂ්‍යයන් වන අපට කියා නිම කළ නොහැක. ඔබටත් මේ මහඟු ප්‍රේමයෙහි පංගුකාරයෙක් වෙමින් අන් අයට ප්‍රේම කරන ලවණක් වෙන්නට ආරාධනා,,

ප්‍රේමය පතමු - ප්‍රේමය විඳිමු - ප්‍රේමය බෙදමු අපි එක් වී

මේ නත්තලේදී,,

සොනාලි හිමාෂිණී
පැල්ලන්දෙනිය වීසම

නිමල් අල්මේදා



වසර ගණනාවක් පුරා දහම් කෙත අස්වැද්දීම වෙනුවෙන් නිහඬ සේවයේ යෙදුනු පුද්ගලයන් ඇගයීමට ලක් කිරීම ඔවුන්ගේ සේවය අගය කිරීමට කළ හැකි මහඟු සේවයකි. මෙවර ඔබ හමුවට එන්නේ මැල්සිරිපුර මීසමට අයත් ගිහි දූතසේවාවන් වල නිරතවූ නිමල් ඒ. අල්මේදා මහතායි.

ඔහුගේ පියාගේ ගම කටාන කඳවල ප්‍රදේශය යි. ඔහු වයඹ පළාතේ පොල් වතු නියාමනය හා සම්බන්ධ වතු පාලකවරයෙකු වශයෙන් සේවය කර ඇත.

මැල්සිරිපුර ද මැල් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ නිමල් අල්මේදා මහතා පසුව කුරුණෑගල ශාන්ත ආනා විදුහලේ උසස් අධ්‍යාපනය හැදෑරීය. එහිදී ක්‍රීඩා වලට සහභාගි වී දුර දිවීමේ තරඟ සඳහා ජය සංකේත ලබා ඇත.

ඔහුගේ ජීවිතයේ අමතක නොවන සිද්ධියක් ලෙස 1988 - 1989 වර්ෂවල පැවති උග්‍ර භීෂණයන්ට මුහුණ දීම පෙන්වා දෙයි.

පාසල් අධ්‍යාපනයෙන් පසු මැල්සිරිපුර දෙව් මැදුරේ සහ දෙව් මැදුර වත්තේ පාලන කටයුතු වලදී තම පියාට සහය දැක්වීය.

1978 වර්ෂයේ රජයේ වතු පාලක වරයෙකු ලෙස සේවය අරඹා 35 වසරක සේවා කාලයක සේවය කිරීමෙන් පසු විශ්‍රාම ලැබීය.

1984 වර්ෂයේදී විවාපත් වූ ඔහු සාර්ථක පවුල් ජීවිතයක් ගත කරයි.

ඥානාර්ථ ප්‍රදීපය පුවත් පත අලෙවි කිරීමේ කාර්යය එවකට සිටි ගරු පියතුමන් විසින් මොහුට පවරා තිබුණි. ඥානාර්ථ ප්‍රදීපය ලේඛක සංසදයේ සාමාජිකත්වය 2016.12.17 වෙනි දින ලබා ගත් අතර වසර 50 ක පමණ කාලයක සිට ඥානාර්ථ ප්‍රදීපය පුවත් පතට ලිපි හා විවිධ නිර්මාණ සැපයීම සිදු කරයි. ප්‍රදීපය පුවත්පතේ ප්‍රාදේශීය වාර්තාකරණයට ද යොමු විය. 2010 වර්ෂයේ පවත්වනු ලැබූ කුරුණෑගල පදවියේ ''සියඹට දියත් කරමු'' දහම් සේවා වැඩ සැලැස්ම එවකට මැල්සිරිපුර මීසම් භාර ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමාට පැවරී තිබූ අතර වැඩසැලැස්ම සකස් කිරීමේ කාර්යය නිමල් මහතාට පැවරී තිබුණි.

ඒ මහතා ඇතුගල්පුර ජනසන්නිවේදන පර්ෂදයට සම්බන්ධ වූ ආකාරය දක්වන්නේ නම් එවකට මැල්සිරිපුර මීසම් සේවක ගරු ගෝමි දිවාකර පියතුමා පදවි ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු ආනන්ද වීරකෝන් පියතුමා හමුවූ අවස්ථාවක මැල්සිරිපුර දෙව් මැදුරේ ජනසන්නිවේදන නියෝජිතයක් නොමැති හෙයින් ප්‍රදීපයට වාර්තා සපයන නිමල් ඒ. අල්මේදා මහතා රැස්වීම්වලට සහභාගි කරවන ලෙස ප්‍රකාශ කර ඇත.

වාර දෙකක් මීසම් සභාවේ නිලතල දැරූ මේ මහතා මරිය හමුදාව, විසෙන්ති ද පාවුළු සමිතිවල සාමාජිකත්වය දැරීය.

ඇතුගල්පුර පදවි ජනසන්නිවේදන පර්ෂදයේ උප ලේකම් ධූරයද දරා මේ වනවිට සුළු අසනීප තත්වයන් හේතුවෙන් සමිති සමාගම්වලට සහභාගි නොවන අතර නැවතත් ක්‍රියාකාරී ලෙස දහම් කටයුතුවල නියැලෙන්නට දෙව් මව් ආශිර්වාදය පතමු.

කුරුණෑගල කතෝලික රදගුරු පදවි නිර්මාතෘ අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ 8 වන වර්ෂ පූර්ණ ගුණ සැමරුම පසුගිය සැප්තැම්බර් මස 29 වෙනි දින සවස 5.00 ට කුරුණෑගල ශාන්ත ආනා ආසන දෙව් මැදුරේ දී පවත්වනු ලැබිණ.

සැමරුම් දිව්‍ය යාගය, කුරුණෑගල පදවි කුඩා කිතුනු සංඝ අධ්‍යක්ෂ ගරු ලයනල් ප්‍රනාන්දු පූජාප්‍රසාදීන් වහන්සේ විසින් පුද දෙනු ලැබිණ.

මෙම අවස්ථාවට රදගුරු හිමිපාණන් ගේ ඥාති පිරිසද සහභාගි වූහ. ගරු ලයනල් ප්‍රනාන්දු පූජාප්‍රසාදීන් වහන්සේ විසින් සිය දේශනයේදී කුරුණෑගල පදවිය තුළ රේමන්ඩ් පීරිස් හිමිපාණන් විසින් කුඩා කිතුනු සංඝ සංකල්පය ජීවමාන කරන ලද ආකාරය පැහැදිලි කරන ලදී.

පත්තිනිඳ

පිහිට වුව මැනව දෙවි ස්වාමිනි

බලාපොරොත්තු කඩ වී ගොස්
ඇතිවන කණගාටුව තුළ
මගේ සිත සුවපත් කරන්නට
පිහිට වුව මැන
දෙවි ස්වාමිනි

අවුල් වූ මගේ මනස
දිරිය දී සවිමත් කරන්නට
ජයග්‍රහණය ගොඩ නඟන්නට
සතුට සැනසුම ලබා ගන්නට
පිහිට වුව මැන
දෙවි ස්වාමිනි

වේදනාව අබියස මා තනිවන විට
උදව්වට කිසිවෙකු නැතිව
මට සහනය ලබා ගන්නට
පිහිට වුව මැන
දෙවි ස්වාමිනි

ප්‍රශ්න වලින් මා වුදවා ගෙන
ඔබ ඉදිරියේ සහනයෙන් ඉන්න
තරයේ ඔබ විශ්වාස කරන්න
පිහිට වුව මැන දෙවි ස්වාමිනි

මගේ මරණය ලංවන විට
විශ්වාසයෙන් ඔබ තුරැළේ
මා භදවා ගෙන සැනසුම දෙන්නට
පිහිට වුව මැන දෙවි ස්වාමිනි

රමණී මංගලිකා
හෙට්ටිපොළ විසව

කඳුලේ සතුට තුත්තල



සිනහ ඉතිරෙන
පැතුම් පූදින
විඩා දුරලන
සාමයේ...
කඳුළු අතරින්
සිනහ පූදින
උතුම් ඉමිහිරි
නත්තලේ...
දුගී බව නැති
දිළිඳු කම් නැති
සෝ තැවුල් නැති
නත්තලේ...
සැවොම එක්වෙමු...
සාමෙ පතුරමු...
මේ උතුම් හද මන්දිරේ...

දිළිඳු ගවලෙන් ගැබේ ඉපදී
ලොවට පෙන්වූ සාමයේ
අරුත වටහා ගන්න සැම හට
කාලයයි මේ ලෝ සතේ...
සැවොම එක්වෙමු...
සිනහ උතුරමු...
සුන්දරයි මේ...
ලෝ තලේ...

මල්ෂා රෝෂිණී
බිංගිරිය

"පිය සෙනෙහසක අරුමය"

දෙව් බව පසෙකලා මිනිසත් බව ගත්තේ
මෙතරම් සෙනෙහසක් ඇයි දෙව් තාත්තේ
දැන දැන කිසිම ගුණයක් නැති මිනිස් සිතේ
ඔබ පිය සුවඳ දැවටෙයි සැම විට දසතේ

මැව්වේ මිනිස් රුව සමකර ඔබ රුවට
මැව්ලොව බාර දුන්නේ දියුණුව වෙත යන්ට
කිසි අඩුවක් නැතුව අයිතිය දුන්නාට
පාපය ඉදිරියේ දණ නැමුවා යකුට

එනමුදු නොනැවතුනු ඔබ පිය හදෙහි සෙනේ
මැව් දරුවන් වෙතටම සැම දින ඇදුනේ
බිදිනට යකුගෙ මායම් කළ රුදුරු විනේ
ගැලවුම් කාරයෙකු එවනට සපථ වුනේ

දාවිත් රජ පරපුරෙන් ආ පුතු ජෝසෙප්ය
ඔහු හට ගිවිස දුන් කුමරිය මරියාය
දිළිඳු නිමල යහගුණ දම් දැරුවාය
දෙව් පුතු ඒ නිමල කුස පිළිසිඳුනාය

ලොව මැව් දෙවිඳු මිනිසත් බව අරගත්තේ
කිරි සහ ගොම සුවඳ පැතිරේ සෑම අතේ
යහපත් අයහපත පිරි මේ ලොව මත්තේ
නව හැඟුමකින් ගවලෙන සිරියකි ගත්තේ

සුරදුතු ගී හඬින් මුළු ලොව එකළු වුනා
රජවරු එඬේරුන් පුතු ලග වැද වැටුනා
දෙව් මව් හදවතේ මේ සැම නිධන් වුනා
අඳුර බිඳන් දෙව් පුතු ලොව පහළ වුනා

කේ. නිලන්ති ප්‍රියදර්ශණී



පව් බරින් අප බිඳු ජේසුනී

ගවපාලක ඉපදී
මිනිසත් බවගෙන
මෙලොවට ආවේ
පාප බරින් අප මුදවා ගන්නයි
නිර්දෝෂී ඔබහටම
නැති වරද පටවා
දසවධ සියල්ලම දී
දුෂ්ඨ ජුදයෝ කුරුසිය පිට බාවා
ඇණ තුනකින් එල්ලුයේ
අප පව් කරටගත් නිසාමයි
නම දිවි පුදා
ලොවට විමුක්තිය උදාකර දුන්
ජේසුනී අපි ඔබතුම හට
ණයගැති වෙමු සදා


හිල්ඩා කුමාරපේරු
දඹදෙණිය විසව



ඒ දවස

ඒ දවස,,
සීත උඳුවප් මහේ
කිතු සමිඳුන් උපත සමරන රැයේ
දුගී ගවහල අරා
බෙත්ලෙහෙම් පුර'ඹරේ
පහන් තරුවක් නැඟී
දැල් වී තියේ
ඒ පහන් රැස් කඳින්
මිනිස් වග සිත් සතන්
ගණ අඳුර මැකී
සහන් සැනසුම් එළිය
දැල් වී තියේ

චමින්ද රොෂාන්
දුනකදෙණිය විසව



ස්ටැන්ලි පියාණෝනි..!

සමිඳු රුව - ඔබ රැවෙහි විය
සමිඳු හඬ - ඔබ මුවග විය
සුව සහනය - සැමට බෙදූ
සමිඳු සුරත - ඔබ වෙනම විය
දහස්, සුවහස් දනන්
සුවපත් කළ - දෙවි වෙදැදුරාණ
ඔබ අසල විය
ඒ නිසයි ඔබ සොයා
ඇදී ආවේ පොදි බැඳුන්
දුක කඳුල !

ඉනින් ආදර පියාණෙනි
සමිඳුන් තුරුලේ සැනපී
නිති ආලෝකෙන් සැනසී
අප වෙනුවෙන් මැදහත්වී
සුවපත් කළ මැන
ඔබ වෙනුවෙන් හඬනා හදවත්!

අපේ නත්තල



සාමේ කුමරුගෙ උපතෙ සිහි — කරන
නත්තල් කියා ප්‍රේමය ඇවටෙ — බෙදන
උතුවස් මාසේ සීතල සුළඟක් — රිදෙන
ළඟිනවා ඇසේ නත්තල් සිරි — ගලාගෙන

නත්තල කියන වචනයේ ඇති සිරු — ඇතුරු
ඇමතෙක කරන්නට බැහැ කීවත් — කවුරු
දෙවි බැතුරට ගොසින් පුදලා ඇසෙ — පසුරු
දෙවි සමිඳුට ගයමුද ගීයක් — මියුරු

කුල බල බේද සැඟෙන්නේ ඇමතෙක — කරලා
සෑම දෙනා හට සාමයෙ බෙත් — වබලා
නැති බැරී ඇයගේ දුක් ගින්දර ටික — නිවලා
සමගමු ඇසේ නත්තල ප්‍රේමය — වබලා

සාමයෙ කුමරු සිහිකර නත්තල — සමරා
ඒක ඇම්මගේ කුස තුළ ඇති ඒකට — දරා
සාමයේ පෙම් වතුර දෙනවා ඇසට — පෙරා
සාමය බෙදා ගමු ඇති සැම ඒකට — උරා

ඡේසු තුමා ඉපදුනු ඇද වගෙ — අවසේ
දෙවි බැතුරට යමු දරුවන් හා — සුවසේ
ඔබ හට තිබේ කරුණාක් කීමට — රහසේ
ඔතට තින තඹන්නෙකො නත්තල් — අවසේ

සමාහර දෙනෙක් නත්තල් ඇද — කියාගන
ඔන් වතුරෙන් බඩ කට සෙඹ — පුරවගන
සල්ලි ඔට්ටු වා සූදුව පටන් — ගෙන
ඒකා දෙන්න බැරෙනව ඇන කොටා — ගෙන

බේ දුසිරිනෙන් ඔබලා හැම — ගැලවෙන්න
ඔන් රහසාට ඒවා කවදත් — රිවටෙන්න
දුසිරිත තුරන් කොට නත්තල — සමරන්න
ඔබටත් හැකිය කිතු සමිඳුන් — දැකගන්න

මහේන්ද්‍ර රාජපක්ෂ



කෙටි කතාව

පරිත්‍යාගය

''මොනව....? ඉර නැගිලත් දැන් හෝරා දෙකක් විතර ගත වෙලා..., මොකද මේ කට්ටිය තවම නැගිටලා නැත්තෙ...? වෙනද ඉරමල පීදෙන්ට කලිං, ගෙදර දොරේ වැඩ පටන් ගන්නවනෙ.....?''

''ඇයි...මේ...අද තවම..''

රෑ මැදියම පසුවී, අලුයම් යාමය ඇරඹෙත්ම ගමන අරඹා හෝරා කීපයක ඇවෑමෙන් සිය කුටුම්භය දෙසට ඈත සිටම නෙත් විහිදා හළ දීනාම් ගේ සිත තුළ මහත් කුතුහලයක් ජනිත විය. වියලි කොළ අතු වලින් සාදා ගැට ගසා තිබූ පැළැලී දොර තවමත් වැසූ ගමන්ම ය. ඔහුගේ කුතුහලය එන්න එන්නම වැඩි වූයෙන් දෙපා අඩපණ වූවාක් මෙන් දැනිණ.

පෙර දින විස්මිත රාත්‍රියේ වූ අමුතුම අත්දැකීම් සිය බිරින් දෑ හා සොයුරිය සමඟ බෙදා ගන්නට නොඉවසිල්ල විසින් කඩිනම් ගමනෙක යෙදූ ඔහුගේ දෙපාවලට ක්ෂණිකව ජවයක් දෙමින් වහා පැන පැළලි දොරට තට්ටු කරමින් මොරදුන්නේය.

''සායිදා....! සායිදා...''

ඔහුගේ වේගවත් හඬ සායිදාගේ නිදි සුවය බිඳ දැමීමට සමත් විය. තද නින්දේ සිට හදිසියේ අවදි වූ ඇයට, තම සැමියාගේ හඬ හඳුනා ගැනීමට හැකිවූයේ තරමක් ප්‍රමාදවී ය.

''මොනව..., දීනාම්? අද? මේ වෙලාවෙ...?

තනිව කියාගත් ඇය තම නෑණන්ඩියට අතින් සන් කොට අවදි කළාය.

''දෙදෙනාට මැදිව සුව නින්දේ පසුව බිළිඳු පුතුගේ නින්දට බාධාවක් නොවන පරිදි,

''ආ... මල්ලිනෙ, නංගි ගිහිං දොර අරින්නකො.''

සිය සොහොයුරාගේ හඬ හඳුනාගත්, ඇයගේ විධානයෙන් පසු සංසුන් සිතෙන්, එහෙත් කුතුහලයෙන් පැළලි දොරේ ගැට ලියන්නට වූයේ, ඔහු නොඇසූ පැණයට පිළිතුරු ද සපයමිනි.

''අද නින්ද ගියානෙ. අපට දවල් වෙන කල්.''

''දැං ඉර පායල සෑහෙන වෙලාවක්නෙ.'' කියමින් වට පිටාවට නෙත් යැවූ, දිනාම්

''අනිත් ගෙවල් වලත් කට්ටිය නිදි වගේ තවම. මොකද මේ..?'' යි කුතුහලයෙන් විමසීය.

සායිදාගේ සිතද කුතුහලයෙන් සලිත වී ඇත්තේ, දීනාම්ගේ හදිසි ආගමනය නිසාය.

''ඔයා මොකද අද මේ වෙලාවේ..? ඔයා මගෙ ප්‍රශ්නෙට උත්තර දුන්නෙ නැහැනෙ තව.., කෝ අක්කන්ඩි..?'' ඇයගේ පැනයට පිළිතුරු නොදුන් දිනාම්, පිලිකන්නෙ මත වාඩිවී දෙපා පිරිමදිමින් ගේ තුළට දෙනෙත් විහිදවීය.

''එයා බබා ළඟ... දැං එයි.''

''ඒක නෙවෙයි දිනාම්, ඊයේ... රෑ හරිම අමුතුම රාත්තිරියන්නෙ.. ජීවිත කාලෙටම මෙහෙම දෙයක් නං දැකලා නැහැ. මුළු රාත්තිරියේම අපි ඇහැරගෙන ඉදලා, උදේ තමයි නින්දට ගියෙ..''

''අක්කන්ඩි'' දිනාම් වහා පිල්කඩ මතින් නැගිට, හිස වටා බැඳ තිබූ ජටාව ලිහා අතට ගත්තේය. ඒ සමඟම කරේ තිබුන සළුපට බුරුල් කර හිස ආවරණය තරමින් පැළලි දොරෙන් මෑත්වූ සොයුරිය වෙත සමීප වූයේ ය.

''ඉතිං...ඉතිං... මොකද උනේ''

''මල්ලි දන්නෑ... හම්මෝ.. එක පාරටම අමුතු එලියක් විහිදෙන්න ගත්ත. හරියට දවාල වාගෙ. ඒත් එක්කම අහසෙ ගිගුං දෙන්න ගත්ත.

අමුතුම සාද...තාල... නිමක් නැහැ.. ජීවිත කාලෙට අහල නැති ගායන... වාදන...''

''ඒ එක්කම සෙනඟත් හරියට යන්න පටං ගත්ත. ආං අර පැත්තට..''

තිදෙනාම දිගු කතාවකට මුළ පුරමින් පිල්කණ්ඩිය මත වාඩි වුණා.

''ඒක තමයි මාත් මේ තකහනියක්ම ආවෙ... අපටත් රෑ නින්දක් නැහැ. හරි මහන්සියි...මොනවත් තියෙනවද කන්න එහෙම...?''

ඊයේ රෑට හදාපු රොටී ඇති. ඉන්න මං ගේන්නං'' මේ අතර හදිස්සියේ යමක් මතක් වූ කලෙක මෙන් ගෙය තුළට එබී, පැඳුර මත දිගාවී කිරි සිහින දකිමින් සුව නින්දේ පසුවන සිඟිති පුතු අසලට ගොස් මඳකට පසු යළිත් පිල්කණ්ඩිය මත වාඩිවී රොටියෙන් සප්පායම් වූයේ කඩිනමිනි. ඒ ඔහුගේ සන්තානය තුළ පොදි ගසාගෙන ආ විස්මිත පුවත ඔවුන් ඉදිරියේ දිග හරින්නට යුහුසුළු වෙමිනි.

''ඒක නෙවේ...අක්කණ්ඩි, සායිදා..., ඊයේ රෑ අපට වෙච්ච සිද්ධිය නං...? මේ බලන්න මතක් වෙන කොටත්...''

ඔහු සිය ලොම් කබායේ වැලමිට දක්වා අත් මෑත් කොට ඔවුන් වෙත දිගු කරමින් ඒ අමුතුම අත්දැකීම විස්තර කරන්නට විය. කාන්තාවන් දෙදෙනා ඒ පුවත අසන්නට දෙසවන් පමණක් නොව එළියට පනින්නට ආසන්න දෑසින් හා අයාගත් මුවින් යුතුව සූදානම් වූහ.



අපි ඊයේ රෑ බැටළුවො ටික පිට්ටනියට දාලා ගාල් කරල කඩුලු වහල වෙනද වගේ හාන්සිවෙලා ටිකක් කතා කර කර ඉන්නකොට නින්ද ගියා.

අමාස්...., එයාගෙ පුත්තු දෙන්න... මම...., අපි හතර දෙනාම නිදි... ඔන්න රෑ මැද්දෙදී අපට ඇහෙන්න ගත්තා හරිම මිහිරි ගීත නාදයක්... ඒවගෙ මිහිරි නාදයක් නං ජීවිතේට අහල නැහැ...'' ඔයාලට ඇහිල තියෙන්නෙත් ඒකම තමයි.''

සොයුරියන් දෙදෙනාගේ දෑස් එකිනෙකාගේ දෑස් හා ගැටිණ. ''ඉතිං... ඉතිං..'' එකවර දෙදෙනාගේ ම මුවින් පිටවිය.

''ඉතිං අපි ඇහැරලා බලනකොට උඩ ආකාසෙ එහාට, මෙහාට පාවෙවී, පාවෙවී ලස්සන තටු තියෙන සුරංගනාවියො වාගෙ කට්ටියක් ගායනා කරනව. ඒ වගේම විශාල එළියක් ආකාසෙ පුරාම රැස් දහරා විහිදෙනව හරියට දවල් වගේ.''

''ඉතිං මල්ලි...?'' සොහොයුරියගේ නොඉවසිලිමත් හඬයි ඒ.'

''ඊට පස්සෙ... මෙන්න.. ඒ සුරංගනාවියො එක එක්කෙනා අපේ පිට්ටනියට පාත් වෙන්න ගත්ත. පාත් වෙලා අපි කට්ටිය ළඟට එක එක්කෙනා එනව. අම්මෝ.. එයාලගෙ දිස්නෙ...''

''මොන...ව...?'' සාරදාගේ වෙව්ලන තොල් අතරින් පිටවෙයි.

''අපි ඉතිං බයේ ගැහෙන්න ගත්ත. අර කොල්ලො දෙන්න..? ඌං වෙව්ලනව.''

''අපේ ඇඳුම් දාඩියෙන් තෙත් වෙලා ගියා.'' පස්සෙ ඒ ගොල්ලො අපිත් එක්ක කතා කළානෙ.''

''ඈ... මොනවා...? මොනවද කතා කළේ. ඒ ගොල්ලො.''

ආඩම්බර මන්දස්මිතයකින් ඔහුගේ මුහුණ සැරසෙනු සාරදා දුටුවාය.

''එයාල කිවුව... ඇයි ඔයාලා මේ බය වෙලා ගැහෙන්නෙ. බයවෙන්න එපා. සුබාරංචියක් කියන්නයි අපි ආවෙ..?''

''සුබාරංචියක්..? මේ අපට... ඔයාල කවුද? අපි නං දුප්පත් එඬේර කොල්ලො. අනේ ඔය සුබාරංචිය වෙන කෙනෙකුට කියන්න බැරිද? වෙව්ල වෙව්ල කිව්වා.''

''නෑ..නෑ.. ඔයාලට තමයි ඉස්සෙල්ලම මේ ආරංචිය අපි කියන්නෙ. ඔයාලට ගැලවුම්කාරයෙක් ඉපදිලා. ගිහිං බලන්න.''

''මොන...ව? ගැලවුම් කාරයෙක්....? ඒ කියන්නෙ ?''

''ගිහිං බලන්නකෝ...'' කරුණාවන්ත හඬකින් එහෙම කියල උඩට ගියා. ගිහිං ආයෙමත් එහාට මෙහාට පාවෙවී ගායනා කළා.

''හා....නේ... ඉතිං...''

''ඉතිං අපි ගියා, ගියා, ගියා. අහසෙ දිග..... තරුවක් අපිට පාර පෙන්නන්න වගේ අපිට ඉස්සරහින් යනව. යනකොට... බෙත්ලෙහෙමෙ.. ඈත විශාල පිට්ටනියකට සේන්දු උනා.''

''ඒ පිට්ටනියෙ හැමතැනම හරක් රංචු ගැහිල වැතිරිලා නිදාගෙන හිටිය. ඒ හරක් රංචු අතරින් අපි ඉස්සරහට ගියා. දැං අපිට පේනව ඒ පිට්ටනිය ඉවර වෙන තැන කෙළවරේ පුංචි මඩුවක්. අපිට ඉහලින් ගිය තරුව ඒ මඩුව ළඟ නැවතුනා. අපි බයෙන් බයෙන් ඒ මඩුව ළඟට කිට්ටු කළා.''

''අම්මෝ... ඉතිං...?'' බිරිඳ නොඉවසිලිමත් වෙයි.

''ඒ මඩුවෙ... ඒ මඩුවෙ... හරකුන්ට කෑම දාන ඔරුවෙ.. පිදුරු ගොඩක් උඩ ලස්සන බබෙක්. අම්මයි, තාත්තයි දෙන්න දෙපැත්තෙ හිටගෙන ඉන්නව. හැම තැනම ගොම ගොඩවල්. හනේ මේ මොන පුදුමයක් ද? අපිට හිතාගන්න බැහැ මේ දෙන්නට... මේ මහ පොළවෙ වෙන තැනක් තිබුනෙම නැද්ද. අපිට හරිම ප්‍රශ්නයක්.''

''හැබැයි ඒ බබානං එසේ මෙසේ කෙනෙක් නං නෙවේ. රාජකුමාරයෙක් ද, දේව කුමාරයෙක් ද.. අපිට හිතාගන්න බැහැ. කොහොම උනත් ඉස්සෙල්ලම අපි තමයි ගිහිං වන්දනා කළේ. අම්මෝ... ඒක අපිට ලැබුන පුදුම වාසනාවක්නෙ.''

''ඉතිං දැං ඔයා ආවෙ ඔය විස්තරේ කියන්නම වෙන්නැති නේද?''

''ඔව්... අපි දැහිං දැකපු දේ ඔයාලට කියලා සතුට බෙදා ගන්නකං ඉවසුමක් නැතුවයි හිටියෙ. මේ කතාව අහල පහළ හැමෝටමත් කියන්න. ආ... ඒක නෙවෙයි, දැං ඒ දරු පැටියටයි.. මහ දෙන්නටයි කන්න බොන්නවත්, අඳින්නවත් කිසිම දෙයක් නැහැනෙ. අනාථ පවුලක්නෙ. දරුව හීතලෙ ගැහෙනව.''

''ආ...ඉතිං ඔයා මොනව හරි අරගෙන යන්න... අපේ පුතාට හම්බ වෙච්ච දේවල් තියෙනවනෙ නේද අක්කෙ .....'' හුන් තැනින් නැගිටිමින් පිළිවදන් දුන්නේ හරිම සතුටකිනි.

''ඔව්... මල්ලි, අර ඔයාගෙ බැටළු ගාලෙ අයිතිකාරය තෑගි දීපු ලස්සන, විල්ලුද සලුවක් එහෙම තියෙනවනෙ. අපිට මොනවද ඒව...''

''ඇයි මේ සුවඳ පැං කෙණ්ඩියකුත් තියෙන්නෙ තව මේ මිදියුෂ බෝතලේ'' සායිදා ගෙතුළ සිට කතාවට එක්වූවාය.

''ගෝධූම පිටි ටිකකුත් තියෙනව. ඒකෙන් රොටී ටිකක් හදල දෙන්නං. මේ ඔලිව් තෙල් බෝතලෙත් ගන්න.''

''හා.. එහෙනං.. මං ඉර හැරෙන වෙලාවට මෙහෙං පිටත් වෙන්නං''

මී පැණි සමඟ රොටියකින් දිවා ආහාරය සඳහා සප්පායම්වූ ආනුස් දින පහළොවක් වයසැති තම සිඟිති පුතු සිඹ රැකියාව සඳහා පිටත් විය. ඒ යන අතරතුර දී තම එඬේර මිතුරකු වන මලශාක්ගේ ඉල්ලීම හදිසියේම වාගේ මතකයට නැගිණ.

''උඹ එන ගමං අපේ ගෙදරටත් ගොඩ වෙලා වරෙං, මං ගෙදර ගියෙත් නැහැනේ කාලෙකිං...''

අඩි පාර දිගේ ඉක්මන් ගමනින් පාතබන අතරතුර මල්ශාක්ගේ නිවස දිස්වෙද්දී ගමන බාල වූයේ නිතැතිනි. අඩිපාර සිට ගේ දෙසට පියනගද්දී, කේඩෑරී වී තිබුන තිරිඟු ඉපල් ''සර සර'' හඬ

නංවමින් ඔහුගේ ගතේ හැපිණ. ඒ අතරින් නිවසේ වසා තිබූ පැළලි දොරට තට්ටු කරමින් ''මාමේ.. නායිම් මාමේ...'' දෙතුන් වරක් හඬ නැගුවද ප්‍රතිචාරයක් නොඇසිණ.

''ම්... කවු...ද..? කෙදිරිළි හඬක් නැගුණි.

''ආ..නැන්දේ... කෝ... මාමා...?

කැස්සක හඬකුත් ඔහුගේ සවන් සොයා ආවේය. දොර පැලෑල්ල විවර කරමින් ඇතුල්වූ ඔහුගේ ඇස් අදහාගත නොහැකි විය. නැන්දාගේ මුවින් දෝරෙ ගලන්නට වූවේ දුක් කන්දරාවක කතාවකි.

''බලන්ඩකො දීනාම් පුතේ...''

''මේ මිනිහා ලෙඩ වෙලා දැං දවස් ගාණක්. අපිට කන්ඩත් නැහැ. කෝ..අපේ එකා... අපි ඉන්නවද, මලා ද කියලවත් බලන එකක් යැ. කුෂ්ඨ රෝගයක් හැදිල මගේ මේ ඇඟම වණ වෙලා. මේ පේන්නැද්ද? බේතක් හේතක් ගන්නවත් තියෙන එකක් යැ.... මිනිහට උණ.. වෙව්ලනව.''

දීනාම් වහා ක්‍රියාත්මක විය. තම උර මත එල්ලාගෙන තිබූ පොට්ටනිය මැස්ස උඩ තබා ලිහා දැමීය. විල්ලුද රෙද්දක් ගෙන දිගහැර නායිම් මාමාගේ වෙව්ලන සිරුර මත දිග හැරියේය. සුවඳ හමන ඔලිව් තෙල් බඳුන ගෙන නැන්දාගේ කුෂ්ඨ මත ආලේප කළේය. පසුව ගැනීම සඳහා ඉතිරිය පසෙකින් තැබීය. රොටී ගෙන මී පැණි තවරා ඔවුනට පිළිගන්වා එයින් සා පවස නිවා ගන්නා ආකාරය බලා සතුටු සිතින් මඟට පිළිපන්නේ හිස් අතිනි.

යන්තම් බිම් කලුවර වැටෙද්දී සුපුරුදු බෙත්සනුර් තණ බිම වෙත ළඟා විය.

''මොකද බං අත් දෙක වන වනා අවේ..? අපිට කන්නවත් මොකවත් ගෙනාවෙ නැද්ද? ඒ පැණය සිය සගයා මල්සාක්ගෙනි. ඔහුට සියල්ල පැවසූ දීනාම්,

''උඹ හෙට ගෙදර ගිහිං වරෙං. මාං ළමයි දෙන්නත් එක්ක උඹේ බැටළු රංචුවක් බලාගන්නං. ඒක නෙවෙයි අපි යමුද ආයෙත්... අර කුමාරය බලන්න යි යෝජනා කළේය.

''සත්තු ටික ගාල්කරල යමු. සිව් දෙනාට යළිත් පෙර දින රාත්‍රියේ ගමන් කළ මාර්ගයේ සළකුණු ඔස්සේ යමින් ගව මඩුව වෙත ළඟා වූහ. පළමුවෙන් ඇතුළු වූයේ දීනාම් ය. දෙනෙතට හසුවූ දසුනින් විස්මයට පත්වූ දීනාම්.... ''මොනව...? මේ මොන පුදුමයක් ද? අර නායිම් මාම ට පොරවපු විල්ලුව සලුව..? අර කුමාරය පොරවගෙන සැපට ඉන්න හැටි....ම්... මේක කොහොමද මෙතනට ආවේ...?

''ඒ විතරක්ද? ඊයේ රාත්‍රියෙ අපි එනකොට හරකුන්ගේ මුත්‍රා, ගොම, ඒවයින් ආපු දුර්ගන්ධය... දැං කෝ..?'' සුවඳින් පිරිලා.. නායිම් මාමට දීල ආපු සුවඳ පැන් බෝතලේ සුවඳමයි එන්නේ...''




ඔහු නාස් පුඩු එහාට මෙහාට හරවමින් ඒ සුවඳ ආඝ්‍රාණය කර ගත්තේය. ආ අර දෙන්න මොනවද අර කන්නෙ? මේ මොන පුදුමයක් ද? මේව කොහොමද මෙතන්ට ආවෙ..?''

තෘෂ්ණාවෙන් මුක්ත වීමේ අනුස් තුළ ජනිතවූ ශ්‍රද්ධාවෙන් නිමැවුණු කඳුලු දහරාවන්ට අනුස් නම් වූ ඒ එඬේර තරුණයාගේ දෙනෙත් මඩල උල්පතක්ම විය. ඒ ප්‍රසාදජනක සංතෘෂ්ඨියට සිය බිරිඳ හා සොහොයුරියද මනසින් යා කර ගත්තේය.

ජසින්තා සපරමාදු

පහන් නරු



ඔබගේ යාච්ඤාව නිසා මේ දේවල් අහිමි වේ...!

- උඩඟුව
- අහංකාරය
- තන්හාව
- ඊර්ෂ්‍යාව
- කෝපය
- පාපයේ වහල්කම
- අධෛර්යය

මේ දේවල් හිමි වේ...!

- දේව සම්බන්ධතාවය
- දේව ප්‍රසාදය
- දේව ප්‍රේමය
- ශක්තිය
- සුව සහනය
- දේව ගරු බිය

තරුෂි මහීෂා ජයසිංහ
කොහිලේගෙදර ශු. විඛායෙල් අග්‍රදූතතුමන්ගේ දේවස්ථානය

රෑට රෑට ඇවිදිල්ලා




රෑට රෑට ඇවිදිල්ලා
පුංචි සිත් සතුටු කරලා
කාටත් හොරෙන් යන්න ගිහිල්ලා
පුංචි අපේ නත්තල් සීයා

සෙල්ලම් බඩු
ටොපි චොකලට් ගෙනේ
ලොකු කුඩා සැමට
සතුට ගෙනේ
නත්තල් සිරිය ගෙට ගෙනේ
නත්තල් සීයා යන්න ගියේ

අනේ නැද්දේ මාමේ
මේ අහන්නකෝ
නත්තල් සීයාට
ගරු කරන්නකෝ
නත්තල් සීයාව
වෙළඳ බඩුවක් නොකරන්නකෝ
අපේ නත්තල් සීයා
අපට දෙන්නකෝ

ඩබ්ලිව්. මිකෙලා ලිවේරා
සා. ආනා දහම් පාසල - කට්ටිමහන
ර ශ්‍රේණිය



දැන්වීම් තීරුව

මයිකල් කැනේෂියස් සූර්යබණ්ඩාර



දින යන්න යන්න
ඔබේ ගුණ
තව තව වැඩිවෙනවා
ස්වාමිනී, මොහුගේ
ආත්මය
ඔබවහන්සේගේ
රාජ්‍යයට කැඳවා
ගත මැනව.
දුක, වේදනාව,
පාළුව, තනිකම
සදහටම උරුම වූ

දයාබර බිරිඳ හා දූ දරු සැම

නාලවලානේ විසූ

විනිෆ්‍රීඩා පෙරේරා මහත්මිය



උපත : 1935.12.27
විපත : 2025.12.23

දෙවිදුන් තැනූ මනරම් ලොවෙහි දෙවිදුන් තුරුලේ සිට ජේසුගේ ශ්‍රී මුහුණේ ආලෝකය දකිමින් සැමදා අප වෙනුවෙන් මැදහත් වන්නට මොක් සුව පතන්නේ.

මනුසත් බව ජීවිතයෙන් විදහා පෑවා දුටුවන් සමඟ නිති සිනහව පැතුවා දෙව්මව් තුරුලේ නිති ඔබ සැතපේවා...

ඔබට අදරැති දූ-පුතුන් සහ මුණුබුරන් සහ මිනිබිරියන් ඇතුළු සැම දෙනාය.

දැන්වීම් පිටුව

ඔබගේ ආදරණීයයන්ගේ,

උපන් දින/විවාහ සංවත්සර/සුබ පැතුම් හා
වෙළඳ දැන්වීම් පළ කිරීම සඳහා විමසන්න...

සංස්කාරක පියතුමා: 071 039 2087

සිඩ්නි: 071-3233306

ජසින්තා: 071-8168935

පිටුවක් රු.3000/=

පිටු 1/2 රු.1500/=

පිටු 1/4 රු.750/=

සිව් දෙසින්



කුරුණෑගල රදගුරු පදවියට අයත් බිංගිරිය ක්‍රිස්තු රජාණන්ගේ දෙවි මැදුරේ දරුවන් එකොලොස් දෙනෙක් 2025 නොවැම්බර් 09 වන දින ප්‍රථම වතාවට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම බිංගිරිය මීසම් සේවක ගරු ජූඩ් දසනායක පියතුමා විසින් සිදු කරන ලද අතර, දරුවන් සුදානම් කිරීම ගරු ශ්‍යාමා ප්‍රියන්ති පැවිදි සොයුරිය සහ අනුෂ්කා නිෂාදි ගුරු මහත්මිය විසින් කරන ලදී.

ඩබ්.පී. මල්ෂා රෝෂිණී
වාර්තාකරණය

කුලියාපිටිය ශාන්ත ජෝශප් දේවස්ථානයේ පැවති මහා ධර්ම විවේකය



කුලියාපිටිය ශාන්ත ජෝශප් කුලියාපිටිය ශාන්ත ජෝශප් දේවස්ථානයේ මීසම් සේවක ගරු ප්ලැසිඩස් ද සිල්වා පියතුමන්ගේ ආරාධනය මත 2025.09.09 වන දින සිට 2025.09.21 වෙනි දින දක්වා අප මීසම තුළ මහා ධර්ම විවේකයක් පවත්වන ලදී.

නිර්මල මරිය නිකායික දේශනාවාදී සංඝය වන වෙන්නප්පුව නාසරෙත් ගෘහයේ නි.ම.නි. පියතුමන්ලා විසින් මෙම ධර්ම විවේකය මෙහෙයවන ලදී.

පුරා සති දෙකක් පුරාවට අප මීසමේ රැඳුනු පියතුමන්ලා අප මීසමේ ගෙවල් බැහැදකිමින්, ගෙවල් ආශිර්වාද කරමින් මෙම ධර්ම විවේකය ආරම්භ කරන ලදී .

නිර්මල මරිය නිකාය ගරු නිලූෂන් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා සහ ගරු සමීර ප්‍රනාන්දු නි.ම.නි.පියතුමන්ලාගේ මෙහෙයවීම යටතේ අප සැමත් සමඟ සතියක් පුරා ධර්ම රාත්‍රිය පවත්වන ලදී.

ජීවිතය ,පාපය,ගැලවීම මනස්ථාපනය මාතෘකා යටතේ දින 04ක් සැමට දෙවිදුන් වෙත ලඟාවීමට අවශ්‍ය සියලුම දේ වටහා දෙමින්, බැතිමතුන්ගේ සිත් දෙවිදුන් කෙරේ නැඹුරු කිරීමට දේශනාවාදී පියවරුන් පියවර ගන්නා ලදී.

මනස්ථාපනය දිනයේදී සියළුම දෙනාට පාපෝච්චාරනය ලබා දුන් අතර,රාත්‍රී 1100ත් පසුවන තුරුම නි.ම.නි. පියතුමන්ලා ඇතුළු පුජාප්‍රසාදීන් වහන්සේලා 08 දෙනෙකු මෙම සක්‍රමේන්තුව දානය කලහ.

අප ජීවිත ගත කිරීමේදී යක්ෂයා, ලෝකයා මාංෂයා යන බල වේගයන්ට හසුනොවී, දේව ආදරය කරුණාව ආශිර්වාදය මැද දෙවි මව්න්ගේ පිහිට යදිමින්, එදිනෙදා පැමිණෙන දුක්වේදනා දරා ගනිමින්, පාප පරීක්ෂා වලින් මිදී.අප සැම දෙවිදුන් වෙත ලගාවිය යුතු බවද වටහා දෙන ලදී.

ධර්ම විවේකයෙන් ලත් ආලෝකය නොනිමී දැල්වෙන පිනිස පවුලක් ලෙස ඉරුදින දිව්‍ය පූජාවට සහභාගිවීමටද,විටින් විට පාපෝච්චාරනය තුලින් දෙවිදුන්ට සමීපවීමටද, දිනපතා පවුල් යැදුම හා පෞද්ගලිකව යැදුම් කිරීමට අමතක නොකරන ලෙසද,සමාව දීම, පරිත්‍යාගය, කැපවීම තුලින් ප්‍රේමයේ ජීවිතයක් ගත කලයුතු බවද වටහා දෙන ලදී .

රෝගීන් ආසිරි ගන්වන දිනයේදී රෝගීන් 300කට අධික පිරිසක් සහ අනිකුත් බැතිමතුන්ද සමග 500 කට අධික පිරිසක් ශුද්ධවූ තෙලයෙන් ආලේප කර දේවාශිර්වාද දානය කරන ලදී.

ධර්ම විවේකය කාලය තුල තරුණ දූ පුතුන්ට සහ අනකුත් දරුවන්ට ද දේශනා තුලින් ඔවුන් දෙවිදුන් වෙත යොමු කිරීමට පියවර ගන්නා ලදී.

අවසන් දිනයේදී පවුල් මෙහෙය "අප පවුල දේව ආදරයේ පිළිඹිබුවකි" යන තේමාව

ඊළඟ පිටුවට...







ඇතුගල්පුර පදවි ජනසන්නිවේදන පර්ෂදය මගින් සංවිධානය කළ ලෝක සන්නිවේදන දිනය සැමරීම මල්පිටිය ශු.සෙබස්තියන් මුනිදුන්ගේ දේවස්ථානයේදී පසුගියදා පවත්වන ලදී.

මෙහිදී පැවති දිව්‍ය පූජාවට හා මාධ්‍ය වැඩමුළුවට මල්පිටිය, කොහිලේගෙදර, උඩුපිටිය යන දේවස්ථාන වල 6 වසර සිට ඉහළ දහම් පාසල් දරුවන් හා දහම් ගුරුභවතුන් හා දෙමාපියන්, ජනසන්නිවේදන පර්ෂදයේ සාමාජික සාමාජිකාවන් සහභාගි වූහ.

වත්මන් ජනසන්නිවේදන පර්ෂදයේ අධ්‍යක්ෂ ගරු නවින් ලක්ෂාන් පෙරේරා පූජාප්‍රසාදීන් වහන්සේගේ ආරාධනයෙන් පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු තරංග ඩිලෙක්ෂික පූජාප්‍රසාදීන් වහන්සේ, වර්බූම් රූපවාහිනී සේවයේ නිවේදක හා වැඩසටහන් අධ්‍යක්ෂ චතුර පෙරේරා, චරිත් ජීවන්ත යන මහත්වරුන් විසින් දරුවන්ගේ අධ්‍යාත්මික පෝෂණය සඳහා වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.

වාර්තාව හා සේයා:
රෝෂන් සුමේද - කොහිලේගෙදර දේවස්ථානය

පසු පිටෙන්...

යටතේ පියාට, මවට, දූ පුතුන්ට ඔවුන්ගේ පවුල තුල ආදරය,දයාව,සෙනෙහස,පරිත්‍යාගය, කැපවීම යන සියළුදේ පහදා දෙමින්,ජේසුගේ දේව මාතාවන්ගේ ආදරය මත දිවි ගෙවීමට උත්සුක වන ලෙසද පහදා දෙන ලදී.

මව්වරුන්, පියවරුන්, තරුණ දූ පුතුන් සහ අනිකුත් දරුවන් වෙන් වෙන් වශයෙන් ඉටි පහන් දල්වා ඔවුන් ආසිරි ගන්වන ලදහ.

මෙම ධර්ම විවේකය කුලියාපිටිය දේවස්ථානයේ සත්පහන් ශාලාවේ සහ ඉරුදින දේවස්ථානයේ ඉදිරිපිට පවත්වන ලද අතර,මීසම් සේවක ගරු ප්ලැසිඩස් ද සිල්වා පියතුමා, මීසම් සහායක ගරු රමේෂ් ලසන්ත පියතුමන්ලාගේත්, සුරදූතික කන්‍යාරාමයේ කන්‍යා සහෝදරියන්ගේත්, දූත සේවා මණ්ඩලයේ ගරු ලේකම්, උප ලේකම් මහතුන්ගේත්, භාණ්ඩාගාරික මහත්මියගේත්,දිව්‍ය හෘදයේ සහෝදරත්වය, මරිය හමුදාව, වින්සන්ද පෝල් සමිතිය දායකත්වයෙන් සාර්ථක කර ගැනීමට සහාය වූහ.

ඡායාරූප හා සටහන
ඩී.කේ ශාන්ති සහ නිර්මාල්
විනිත්‍රිඩා හපුවලාන



පොල්ගහඅගාර නිර්මල ආරෝග්‍ය දේවමාතාවන්ගේ දෙවිමැඳුරේ වාර්ෂික මංගල්‍යය පදවි අනු නායක අති ගරු පියල් ජානක ප්‍රනාන්දු පූජාප්‍රසාදීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවැත්විය.

ලංසගේ මඩු කුමාර



කට්ටිමහන දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පසුගිය දා පදවි එඬේරාණන් වන අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා රදගුරු හිමිපාණන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් පැවැති අවස්ථාව.



මල්පිටිය මීසමේ දරුවන් 14 දෙනෙකු පසුගිය දා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත් අවස්ථාව ඡායාරූපයෙන් දැක්වේ. මීසම් සේවක ගරු මනුර ශිරෝන් පූජාප්‍රසාදීන්වහන්සේගේ ආරාධනයෙන් ගරු ජයන්ත වික්‍රමසිංහ පූජාප්‍රසාදීන්වහන්සේ විසින් දිව්‍ය පූජාවේ ප්‍රධාන දේශනය සිදු කල අතර, සැල්වටෝරියානු නිකායේ ගරු නීටා අබේරත්න කන්‍යා සොහොයුරියද මෙම අවස්ථාවට සහභාගි වූවාය. මල්පිටිය දේවස්ථානයේ රමාලි ප්‍රනාන්දු, කොහිලේගෙදර දේවස්ථානයේ පද්මිණි ජයසිංහ, උඩුපිටිය දේවස්ථානයේ නිරෝෂා යන ගුරු මහත්මීන් විසින් දරුවන් මේ සඳහා පුහුණු කරන ලදී.

වාර්තාව හා සේයා:
රෝෂන් සුමේද - කොහිලේගෙදර දේවස්ථානය



කුරුණෑගල කතෝලික රදගුරු පදවියේ කුලියාපිටිය මීසමට අයත් ඉලුක්හේන ශාන්ත තෙරේසා මුනිවරියට කැප කළ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පදවි එඩේරාණන් වන අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා හිමිපාණන් වහන්සේ ඇතුළු මීසම් සේවක අති ගරු ප්ලැසිඩස් සිල්වා පූජාප්‍රසාදීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කෙරිණි.

ලංසගේ මඩුකුමාර



කුරුණෑගල රදගුරු පදවියේ මල්පිටිය මීසමේ කොහිලේගෙදර ශු.මිඛායෙල් අග්‍රදූතතුමන්ගේ දේවස්ථානයේ 140 වෙනි වාර්ෂික මංගල්‍යය කුරුණෑගල රදගුරු පදවි එඩේරාණන් වන අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්, රදගුරු ලේකම් ගරු හිමිෂ්ක රොෂාන් පූජාප්‍රසාදීන්වහන්සේගේ සහභාගිත්වයෙන් සහ මීසම් සේවක ගරු මනුර ශිරෝන් පූජාප්‍රසාදීන්වහන්සේගේ මගපෙන්වීම සමග පසුගිය දා සිදු කෙරිණි. පෙර දින සන්ධ්‍යා මෙහෙය සිදු කරන ලද්දේ පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු තරංග ඩිලෙක්ෂික පූජාප්‍රසාදීන් වහන්සේ විසිනි. පූජාප්‍රසාදීන් වහන්සේලා කීප දෙනෙකුද එම අවස්ථාවට සහභාගි වූහ.

වාර්තාව හා සේයා:
රෝෂන් සුමේද - කොහිලේගෙදර දේවස්ථානය.

හෙට්ටිපොල දිව්‍ය හෘදය දේවස්ථානයේ පසන් ගායනා මෙහෙයක්



හෙට්ටිපොල මීසම් සේවක කුලියාපිටිය ශාන්ත ජෝශප් පිරිමි විද්‍යාලයේ විදුහල්පති ගරු සිඩ්නි රොෂාන් ලියනගේ පියතුමාගේ නවතම සංකල්පයක් මත දේවස්ථානයේ TeamF3 තරුණ සහෝදර කැළ විසින් සංවිධානය කරනු ලැබූ ''පසන් ගී සුයාමය'' පසුගියදා හෙට්ටිපොල දිව්‍ය හෘදය දේවස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණි.

චතාරික සමය තුළ ක්‍රිස්තු දුක් ප්‍රාප්තිය සහ දේවමාතාවන් විඳි දුක මෙනෙහි කිරීම අරමුණු කර ගනිමින් මෙය සංවිධානය කෙරිණි. පසුව ගරු පියතුමාණෝ දරුවන් සමඟ මෙසේ කැමරාවට මුහුණ දුන්හ.

''බලාපොරොත්තුවේ තාරුණ්‍යය'' ජාතික කතෝලික තරුණ ඉරු දින



ජාතික කතෝලික තරුණ ඉරු දින විශේෂ කොටගෙන හෙට්ටිපොල, මඩඉන්න, කොස්වත්ත දේවස්ථානවල තරුණ තරුණියන්ගේ සහයෝගිතාව වර්ධනය කිරීමේ අරමුණින් විශේෂ වැඩසටහනක් පසුගියදා පැවැත්විණි. තරුණ දූ පුතුන් ගේ අධ්‍යාත්මික පෝෂණය හා සහයෝගීතාව වැඩිදියුණු කිරීම සඳහා මෙම විශේෂ වැඩසටහන පැවැත්වූ අතර හෙට්ටිපොල දේවස්ථාන Team F3 කණ්ඩායම තරුණ දරුවන් වෙනුවෙන් දූදරු, මාපිය සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමේ විශේෂාංග කීපයක් ද එක්කර තිබිණි.

සියලු දෙනාට දේව ආදරය අත්දකින්නට සලස්වමින් අර්ථාන්විත ලෙස සියලු වැඩ කටයුතු සැලසුම් කළේ හෙට්ටිපොල මීසම් සේවක කුලි/ශාන්ත ජෝශප් පිරිමි විද්‍යාලයීය ගරු විදුහල්පති ගරු සිඩ්නි රොෂාන් ලියනගේ පියතුමාය.

මෙම අවස්ථාව සාර්ථකව සිදු කිරීම සඳහා කැපවීමෙන් වැඩ කරන ඇතුගල්පුර පදවි තරුණ තරුණ කටයුතු අධ්‍යක්ෂ කටුපොත මීසම් සේවක ගරු ජූඩ් ලසන්ත ලියනගේ පූජාප්‍රාසාදීන් වහන්සේද සහභාගි විය.

කුරුණෑගල පදවි සිරිහද සහෝදරයත්වයේ වන්දනා චාරිකාව



ඇතුගල්පුර පදවියේ කුරුණෑගල, හෙට්ටිපොල, දුනකදෙණිය, කුලියාපිටිය, නාලවලාන කලාප ඒකරාශි කර ගනිමින් සිරිහද සහෝදරත්වයන්ගේ එකමුතුවෙන් පසුගියදා වාර්ෂික වන්දනා චාරිකාව, පන්නල දී සාර්ථකව නිමා කෙරිණි. දිව්‍ය පූජාව, භාවනාත්මක මෙනෙහි කිරීම, පෞද්ගලික යැදුම් මගින් විශේෂාකාරයෙන් දේව වචනය බෙදා ගැනීමට හැකි විය.

දෙව් පියාණන්ගේ අමිල වරප්‍රසාදය තුළ සැදැහැවත් පිරිස අධ්‍යාත්මිකව පෝෂණය කරමින් පූර්ණ අනුශාසකත්වය සහ මඟපෙන්වීම ලබා දුන්නේ පදවි සිරිහද උපාධ්‍ය ගරු උපුල් සිල්වා පියතුමන් විසිනි.

හෙට්ටිපොලින් 2025 ජුබිලි වසරේ වන්දනා ගමනක්



ඇතුගල්පුර පදවියේ හෙට්ටිපොල මීසමේ හෙට්ටිපොල, කොස්වත්ත,මඩඉන්න දේවස්ථානවල සැදැහැවත් ජනතාව පසුගියදා වන්දනා චාරිකාවක නිරත වූහ.මීසම් පවුලක් ලෙස එකමුතුකම, සහයෝගිතාව, වර්ධනය කර ගැනීමේ අරමුණින් මන්නාරම මරද මඩු මාතාවන්ගේ සිද්ධස්ථානය කරා මෙම චාරිකාව සූදානම් කෙරිණි. මේ සඳහා පූර්ණ අනුශාසකත්වය ලබා දුන්නේ හෙට්ටිපොල මීසම් සේවක කුලි/ශාන්ත ජෝශප් පිරිමි විද්‍යාලයීය විදුහල්පති ගරු සිඩ්නි රොෂාන් ලියනගේ පියතුමා විසිනි.

දහම් පාසල් ක්‍රීඩා උත්සවය



ඇතුගල්පුර පදවියේ හෙට්ටිපොල මීසමේ හෙට්ටිපොල, කොස්වත්ත, මඩඉන්න දේවස්ථානවලට අයත් සියලුම දහම් පාසල් දරුවන්ගේ එකමුතුකම, සහයෝගිතා වර්ධනය සහ අධ්‍යාත්මික පෝෂණය මුල් කර ගනිමින් මෙම ක්‍රීඩා උත්සවය පවත්වන ලදී. දහම් ගුරුවරු සහ දෙමාපියන්ගේ නොමද උත්සාහය සහ කැපවීම විශේෂයෙන් දක්නට ලැබුණි. දරුවන්ගේ ක්‍රීඩා සහ අගනා නර්තනයන්ගෙන් උත්සවය තව තවත් අලංකාරවත් විය. පැමිණි සියලු දෙනාට රසවත් කෑම වේලකින් සංග්‍රහ කළ අතර අවසානයේ තෑගි බෙදාදීම සිදු කරන ලදී.

හෙට්ටිපොල මීසම් සේවක කුලි/ශාන්ත ජෝශප් පිරිමි විද්‍යාලයේ විදුහල්පති ගරු සිඩ්නි රොෂාන් ලියනගේ පියතුමන්ගේ මඟපෙන්වීම අනුව සියලු වැඩ කටයුතු සාර්ථකව නිමා කෙරිණි.



හෙට්ටිපොල මරි මව් ප්‍රතිමාව නිවෙස් කරා

පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යයට සූදානමක් ලෙස හෙට්ටිපොල දිව්‍ය හෘදය දේවස්ථානයට අයත් සෑම කොට්ඨාශයකම නිවෙස් කරා දෙව් මව් ප්‍රතිමාව රැගෙන යාම ඔක්තෝබර් මාසයේ දී ඉතා සාර්ථකව සිදු විය.

සියලුම බැතිමතුන් එක්ව යාච්ඤා කිරීම හා ජපමාලය උච්ඡාරණය කරමින් භක්ති අභ්‍යාසවල යෙදිනි.

හෙට්ටිපොල මීසම් සේවක ගරු සිඩ්නි රොෂාන් ලියනගේ පියතුමන් ගේ මඟපෙන්වීමෙන් හා අධීක්ෂණයෙන් යුතුව මෙය සිදුවන අතර දැනට රෝගීව දිව්‍ය පූජාවට පැමිණීමට නොහැකි අය සිටින නිවෙස් වල දිව්‍ය පූජාවන් කොට්ඨාශ මට්ටමින් පැවැත්වීම මෙහි විශේෂත්වයයි.

කේ.වී. රමණී මංගලිකා
හෙට්ටිපොල

ගවේෂණය

නත්තල් දිව්‍ය පූජාවේ හැඳින්වීම

ආරම්භයේ පටන් දෙවියන් වහන්සේ විවිධ කාලවලදී නොයෙක් ආකාරයෙන් විවිධ පුද්ගලයන් හට විවිධාකාරයේ අනාවරණය වුණා. එලෙස අනාවරණ වූ ත්‍රිත්වීක දෙවියන් වහන්සේ තමන් වහන්සේම මාංශගත මිනිසාට වඩාත් සමීප වන්නට තීරණය කරනවා. ඒ දේව පුත්‍රයාණන් වහන්සේගේ මිනිසත් උපතේ මංගල්‍යයේ අද දවසේ දී විශ්ව ශුද්ධ වූ සභාව ඉමහත් ප්‍රීතියෙන් සමරනු ලබනවා. අද දවසේ දේව වචනය තුළ අපිට මතක් කරනු ලබන්නේ මනුෂ්‍යයාට හිමි ගෞරවය අප ජීවත් කළ යුතු බවයි. දේව පුත්‍රයාණන් මනුභව ගැනීම තුළ ඒ ශුද්ධ වූ බව අපට අවධාරණය කරනු ලබනවා. සාමය කුමාරයාණන් මෙලොවට ගෙනා සැබෑ සාමය ජීවත් කරවන්නට අප වෙත ලැබී ඇති කැඳවීම තුළ මේ උතුම් නත්තලේ නියමාර්ථය මිනිසුන් වෙත ගෙන යන්නට අවශ්‍ය වරම් වරප්‍රසාද මේ දිව්‍ය පූජා යාගයේ දී අපි සැම දෙනා ඉති සිතින් ප්‍රාර්ථනා කරමින් බැහැපත් සිතින් මේ උතුම් දිව්‍යයාගයට සහභාගී වෙමු.

නත්තල් දින දිව්‍ය පූජාවේ විශ්වාසකයින්ගේ යැදුම්

1) ශුද්ධ වූ සභා මාතාවන් වෙනුවෙන් යාඥා කරමු.

කිතු උපතේ අසිරියෙන් ප්‍රබෝධමත්ව මුළු ලොව පුරා පැතිර පවත්නා විශ්වීය ශුද්ධ වූ සභාව දහමින් පෝෂණය කරන්නට වෙහෙසෙන්නා වූ සියලු ගිහි පැවිදි පූජක ආශිර්වාද කොට ආරක්ෂා කොට ශුද්ධාත්මයන් වහන්සේගේ මඟ පෙන්වීම තුළ ඔවුන් සවිමත් කරන පිණිස.

2) දුක් විඳින සැමදෙනා වෙනුවෙන් යාඥා කරමු.

ආර්ථික ගැටලු සමාජය ගැටළු සහ විවිධ ලෙඩ රෝග පීඩාදිය නිසා පීඩාවට පත්ව සිටින සැමට අවශ්‍ය කායික මානසික සුව සහනය සහ දේවාශීර්වාදය බහුලව දානය කොට කිතු උපතේ අසිරියෙන් ඔවුන්ගේ හදවත් ප්‍රීතියෙන් පුරවාලන පිණිස.

3) අප පවුල් වෙනුවෙන් යාඥා කරමු.

අසිරිමත් කිතු උපත සමරන්නා වූ අද දින අප පවුල්වල දෙමාපියන් දරුවන් සියලු නපුරෙන් මුදවා ශුද්ධ වූ කතෝලික පවුල් ලෙස පිවත් වන්නට ශුද්ධ වූ පවුලේ ආශිර්වාදය බහුලව දානය කරන පිණිස.

4) නූපන් බිළිඳුන් සහ ගර්භනී මව්වරුන් වෙනුවෙන් යාඥා කරමු.

අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් සලකුණක් හා දෙවියන් වහන්සේගේ ආශිර්වාදයක් ලෙස දරු උපතක් බලාපොරොත්තු වන්නා වූ සියලුම යුවල් වලට සහ දරුවන් ප්‍රසූත කරන්නට බලාපොරොත්තු වන ගර්භනී මව්වරුන් ආශිර්වාද කොට ආරක්ෂා කොට නිරුපද්‍රිතව නිරෝගී දරු සම්පත් මෙලොවට බිහි කරන්නට ඔවුන්ට වරම් වරප්‍රසාද දානය කරන පිණිස.

නත්තලේ ඉතිහාස කතාව



කොහොමද? කවද්ද? ඇයි? දෙසැම්බර් මාසේ 24 වෙනිදා නත්තල... එහෙම නැත්තන් ජේසුස් වහන්සේගේ උපත සමරන්න පටන්ගත්තේ. මුල් යුගයේ කිතුණුවන්ට දේව පුත්‍රයාගේ උපත පිළිබඳ ලොකු අවබෝධයක් තිබුණේ නෑ.

ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලේමන්ට් මුනිතුමා ක්‍රිස්තු වර්ෂ 200 ගණන් වල ලියපු ලියවිල්ලක තියෙනවා ජේසුස් වහන්සේ උපන් දිනය පිළිබඳ ගොඩක් මත තියෙනවා කියලා. දේශයේ ජේසුස් වහන්සේගේ උපන්දිනය විදිහට සැලකුවේ ජනවාරි මාසේ 6 වෙනිදා. නව ගිවිසුමේ හරි අදහසක් මේ දිනය පිළිබඳ කෙළින්ම ඉඟි නොකලත් ලූක්තුමන් කියනවා දේව දූතයෝ ජේසුස් වහන්සේගේ උපත එඩේරුන්ට දැනුම් දෙද්දී ඔවුන් බැටළුවන් බලාගෙන තණ පිට්ටනිවල හිටියයි කියලා. ඒ නිසා ජේසුස් වහන්සේ ඉපදුනේ සීතල කාලෙක නෙවෙයි කියලනම් පැහැදිලියි.

රෝමයේ සංස්කෘතික උත්සවයක් තිබුණා සැටනේලියා කියලා, මේ උත්සවය පවත්වන්නේ කෘෂිකර්මයට අදිපති සැටර්න් හෙවත් සෙනසුරු දෙවියන් වෙනුවෙන්. මේ සැටනේලියා උත්සවේ දවස් 3/7 අතර කාලයක් මහත් උත්සවශ්‍රියෙන් පවත්වපු එකක්. මේ කාලයේ වහලුන් පවා එක මේසේ හාම්පුතුන් එකක් එකට කනවා බොනවා සුදු කෙලිනවා, නටනවා කිසිම කෙනෙක්ට කිසිම වැඩක් කරන්න මේ කාලයේ තහනම් වුණා. අවසර තිබුණේ ප්‍රීති උත්සව පවත්වන්න විතරයි. මේ සැටැනේලියා උත්සවය ශතවර්ෂ ගණනාවක් පුරා ක්‍රිස්තු පූර්ව 200 ක්‍රිස්තු වර්ෂ 200 අතර කාලේ රෝම අධිරාජ්‍යයයේ මේ ආකාරයට පැවැත්වුණු බව සඳහන් වෙනවා.

ක්‍රිස්තු වර්ෂ 4 /5 ශතවර්ෂවල කිතුණු ආගමේ නවෝදය සිදු වෙද්දී මේ සැටනේලියා රෝම අධිරාජ්‍යය පුරා ඇට මිදුළුවලට කිදා බැහැලා තිබුණේ. ක්‍රිස්තු වර්ෂ 274 අවුරේලියස් අධිරාජ්‍යයා දෙසැම්බර් 25 වෙනිදට සූර්ය දෙවියන්ගේ උපන්දිනය හෙවත් Sol Invites සමරන්න නියම කරන්නේ මේ අතරේ. මේ සඳහා හේතු වුණේ දෙසැම්බර් 25 ක්‍රිස්තියානිකාරයෝ එදාට ජේසුස් වහන්සේගේ උපත සමරාවි කියලා තිබුණු බව ය. සමහරු මේ කාලේ ජේසුස් වහන්සේ ඉපදුනේ මාර්තු මාසේ 25 උන්වහන්සේගේ මාංශ ගතවීමේ ඉදල මාස නවයකට පස්සේ දෙසැම්බර් 25 වෙනිදා කියන අදහසක් බොහෝ ප්‍රබලව දැරුවා. මේ වගේ ගැටීම් මැද්දේ මිත්‍යා දෘෂ්ටික දෙවිකෙනෙක්ගේ මංගල්‍යයක් සමරන මිනිසුන්ව වලක්වන්න ඕන නිසා, මේ දවසට ජේසුස් වහන්සේගේ උපත සමරන්න පටන්ගත්තා කියන කාරණාව අදටත් ප්‍රසිද්ධයි වගේම හැමෝම පිළිගන්න කාරණාවක්.

දැන් අපි දන්නවනේ ජේසුස් වහන්සේ ඉපදුන හරිම දවස දෙසැම්බර් 25 නෙවෙයි කියලා. ඉතිං මේ කතාව මෙහෙම යද්දී අපි දැන් බලමු ජේසුස් වහන්සේ ඉපදුන හරි දවස ගණනය කරගන්නේ කොහොමද කියලා. හරිම දවස හොයා ගන්න පටන් ගන්න හොඳම කෙනා තමයි ස්නාවක ජොහාන් මුනිතුමා, මේක හිතළුවක් කෙවෙයි. බයිබලයේම තියෙන සාක්ෂි සාදක පදනම් කරගෙන තමයි මේ දිනය හොයාගන්න යන්නේ.

දේව වචනයට අනුව ජේසුස් වහන්සේ ඉපදෙන්නේ ස්නාවක ජුවාම් මුනිතුමාගේ උපතින් මාස 6 කට පස්සේ. එතකොට ස්නාවක ජෝහාන් මුනිතුමා ඉපදුනු දිනය කවද්ද කියලා කලින්ම හොයලා බලමු.

මේ ලිපිය ජේසු බිළිඳුන්ගේ උපත සිද්ද වුණු දවස ගැන බයිබලයේ තියෙන ඉගි හතක් ඔස්සේ කරණ සොයා බැලීමක් ලෙසයි ගලාගෙන යන්නේ.

(පළමු ඉගිය) සංඝණනය

ඇයි සංඝණනයක් අවශ්‍ය වෙන්නේ,

1) ජන ගහනය පාලනය කරන්න.

2) බදු ගෙවිය යුතු අය හඳුනාගන්න.

ඔගස්ටස් සීසර් තමා ලෝකයේම පාලකයා කියලා හිතාගත හිටපු මනුස්සයෙක්. මේ ආකාරයට දෙවියන් වහන්සේ තමන්ගේ කතාව ලෝකෝත්තර රජ කෙනෙකුගේ මාර්ගයෙන් ක්‍රියාවට නංවනවා. සංඝණනයක් කියන්නේ රෝම අධිරාජ්‍යයයේ බලයේ සලකුණක් වෙනත් විදිහකින් කිව්වොත් බිම් මට්ටමේම කෙනෙක්ටත් තමන් අධිරාජ්‍යයට යටත් කියලා මේ තුළින් දැනගන්නට සලස්වනු ලැබුවා.

මේ සංඝණනයට දහස් ගණන් මිනිස්සුන්ට තම තමන්ගේ වංශයට අයත් නගරයට එන්න සිද්ධ වුණා. ජෝසප්තුමන් අයිති වුණේ දාවින්ගේ වංශයට නිසා ඔහුට බෙත්ලෙහෙම බලා 80km විතර දුරක් නාසරෙතයේ ඉදලා එන්න සිද්ද වෙනවා. එසේ විශාල දුරක් සීත කාලේ දහස් ගණනක් මිනිස්සු දුෂ්කර මාර්ගවල යති. බොහෝ ප්‍රාථමික ප්‍රවාහන මාධ්‍ය උපයෝගී කරගෙන ගමන් කිරීම ප්‍රායෝගික වුණේ නෑ.

එනිසා සීසර් මේ සංඝණනය පවත්වන්න බොහෝදුරට ඉඩ තිබුණේ යහපත් කාලගුණයක් තියෙන කාලෙක, බොහෝවිට ඒ මැයි මාසේ අග හෝ ජුනි මාසේ මුල් කාලේ දවසක වෙන්න පුළුවන්.

මේ කාලේ කාලගුණය යහපත් නිසාත් ජුදා අස්වනු මංගල්‍යය යෙදෙන නිසාත් දුර ගමන් පිටත් වීම ප්‍රායෝගිකයි. සංඝනණය තුළින් අපි දකින්නේ දෙවිදුන් ඉතිහාසයේ සිදුවීම් ඔහුගේ අරමුණු වෙනුවෙන් පාවිච්චි කරණ ආකාරයයි.

ජේසුස් වහන්සේ ඉපදුනේ මිනිස්සුන්ට ඕන තැන නෙවෙයි දෙවිදුන් අභිෂේක කල ස්ථානයේ යි.

(දෙවෙනි ඉඟිය) සෙකරියස් තුමා

සෙකරියස් තමන් දේව මාලිගාවේ සේවය කරමින් ඉද්දි තමයි දේව දූතයෙක් පෙනිලා එලිසබෙත්තුමිය ගැබ් ගත් බව ඔහුට දන්වන්නේ.

''සෙකරියස්ගේ පේරුවේ අයට දෙවියන් වහන්සේ ඉදිරියෙහි පූජක කටයුතු කරන අවස්ථාව පැමිණි විට, 9 පූජක නිල පිළිවෙලින් සම්දාණන් වහන්සේගේ ශුද්ධ ස්ථානයට පිවිස සුවඳ දුම් පූජා කිරීමේ වාරය, දාදු දැමීමෙන්, සෙකරියස්ට පැවරිණි. 10 සුවඳ දුම් පූජා පවත්වන වේලෙහි මුළු පිරිස පිටත යාච්ඤා කරමින් උන්හ. 11 එවිට දුම් පූජාසනයට දකුණු පසින් සම්දාණන් වහන්සේගේ දූතයෙක් ඔහුට දර්ශනය විය. 12 සෙකරියස් ඔහු දැක කැළඹී බියපත් විය. 13 දේව දූතයා ඔහුට කතා කොට, සෙකරියස්, බිය නොවන්න. මන්ද, ඔබේ යාච්ඤාව අසනු ලැබී ය. ඔබේ බිරිඳ වන එලිසබෙත් ඔබගෙන් පුතෙකු ලබන්නී ය. ඔහුට ජොහාන් යයි නම් තබන්න.'' **ලූක් *සුබ ආරංචිය 1 පරිච්ඡේදය 8-13 වගන්ති***

දේවදූතයා ප්‍රකාශ කරපු පරිදි එලිසබෙත්තුමිය ගැබ් ගෙන ඉන්න බව පූජක රාජකාරී අවසන් වෙලා ගෙදර එන සෙකරියස්තුමන් දකිනවා.

ඉතිහාසය ගත වාර්තාවන්ට අනුව ජුදා පුජකයින් පේරු 24 කට බේදිලා තමයි දේව මාලිගාවේ රාජකාරීවලට යොදවලා තිබුණේ.

''7 පළමු වන පස ඇටය වැටුණේ ජෙහෝයාරිබ්ට ය, දෙවන එක ජෙදායාට ය, 8 තුන් වන එක හාරීම්ට ය, හතර වැනි එක සෙයොරීම්ට ය, 9 පස්වැනි එක මල්කියාට ය, හය වැනි එක මියාමින්ටය, 10 හත් වැනි එක හක්කොශ්ට ය, අටවැනි එක අබීයා ට ය, 11 නව වැනි එක ජේෂුවාට ය, 12 එකොළොස් වැනි එක එලියාෂිබ්ට ය, දොළොස් වැනි එක ජාකීම්ට ය, 13 දහතුන් වැනි එක හුප්පාට ය, දසසතර වැනි එක ජෙෂෙබෙයාබ්ට

ය, 14 පහළොස් වැනි එක බිල්ගාට ය, දහසය වැනි එක ඉම්මෙර්ට ය, 15 දහහත් වැනි එක හෙසීර්ට ය, දහඅට වැනි එක හප්පිස්ශෙෂ්ට ය, 16 දහනව වැනි එක පෙතහියාට ය, විසි වැනි එක ජෙහෙස්කෙල්ට ය, 17 විසිඑක් වැනි එක ජාකීන්ට ය, විසිදෙ වැනි එක ගාමුල්ට ය, 18 විසිතුන් වැනි එක දෙලායාට ය, විසිහතර වෙනි එක මයශියාට ය.'' ***(වංශාවලියේ පළමු වන පොත - 24 වන පරිච්ඡේද වගන්ති 7/18)***

ඒ විදිහට එක කණ්ඩායමක් සබන් දිනයක පටන් අරගෙන ඊළඟ සබන් දවස දක්වා සතියක් සේවය කරන්න නියමිත වුණා. සතිය බැගින් වසරකට දෙපාරක් ඔවුන් දේව මාලිගාවේ සේවයේ යෙදුනා නමුත් ප්‍රදාන ජුදා මංගල්‍ය නිවාඩුවක් යෙදුනොත් ඔවුන් සති දෙකක් සේවය කල යුතු වුණා. සෙකරියා අයත් වුණේ මේ අතරින් අටවෙනි පේරුව වුණු අබියාගේ පේරුවට.

ජේසුස් වහන්සේ ඉපදුනා ය කියලා කියන්නේ ක්‍රිස්තු පූර්ව 5 වෙනි වර්ෂයේ නිසා මේ වසරේ අප්‍රේල් 8/15 පළවෙනි කණ්ඩායම සේවය කරා අප්‍රේල් 22/29 නුමුහුන් පුප මංගල්‍යය.

මේ ආකාරයට ගත වෙද්දී ජුනි 3/10 අබියාගේ පුජක පේරුවට අයිති දවස් නමුත් ඊළඟ සතිය පෙන්තකොස්ත මංගල්‍යය නිසා සේකරියස්ට සති දෙකක් එක දිගටම සේවය කරන්න සිදු වුනා.

''ඔහු පිට වී ආ කල ඔවුන් සමඟ කතා කිරීමට අපොහොසත් විය. ඔහු පූජා ස්ථානයෙහි යම් කිසි දර්ශයක් දක්නට ඇතැයි ඔවුහු තේරුම් ගත්හ. ඔහු ද අතින් සංඥා කරමින් ගොළුගැහී සිටියේ ය. 23 සේවා කාලය නිම වූ පසු ඔහු සිය නිවෙසට ගියේ ය.'' ***(ලූක් සුබ ආරංචිය 1 පරිච්ඡේදය වන 23/24 වගන්ති)***

අපි ස්නාවක ජුවාම් තුමා සති 10 කට පස්සේ ඉපදුනා කියලා හිතුවොත් ඔහු ඉපදෙන්නේ ආසන්න වශයෙන් මාර්තු 24 ත් අප්‍රේල් 7 වෙනිදාත් අතරේ කියලා අනුමාන කරන්න පුළුවන්.

(තුන්වන ඉඟිය) කූඩාරම් මංගල්‍යය

ඊශ්‍රායෙලයේ දින දර්ශනය උත්සව වලින් පිරිලා තිබුණු එකක්. මේ හැම උත්සවයක් ම අධ්‍යාත්මික වැදගත්කමකින් පිරුණු මංගල්‍යත්සවයන් වුණා. ගැලවීමේ ඉතිහාසය පුරා විශ්ෂයෙන් නික්ම යාමේ ගමනේ දී මේ ජනතාව ජීවත් වුනේ තාවකාලික කුඩාරම්වල මේ කුඩාරම් tabernacle ලෙසත් හඳුන්වනු ලැබුවා. මේ මංගල්‍යය යෙදුනේ සාමාන්‍යයෙන් සැප්තැම්බර් / ඔක්තෝබර් අතර කාලයේ දේව පුත්‍රයා මිනිස්සු අතර ජීවත් වන්නට පැමිණීමේ මේ උත්සව කාලයේ සිදුවීම කොතරම් වැදගත් ද?

(හතරවන ඉඟිය) කාලගුණය

ලූක් 2 පරිච්ඡේදයේ 8-9 වගන්ති වල සඳහන් වෙනවා දේවදූතයෝ සම්දුන්ගේ උපත ගැන ආරංචිය එඬේරුන්ට කියද්දී ඔවුන් එළිමහනේ බැටළු පට්ටි රකිමින් උන්නු බව, සීතල දෙසැම්බරේ මධ්‍යම රාත්‍රියේ එලිමහනේ ඉන්නවා කියන එක වෙන්න පුළුවන් දෙයක් නෙවෙයි. වැස්ස, හිම පතනය හා සීතල පිරි මේ කාලයේ බැටළුවන් ආවරණ වල ගාල් කරල පිදුරු කවමින් එඬේරුන් ඒ සත්තු බලාගත්තා. මේ සිදුවීම නිසා යහපත් රාත්‍රී කාලයක් තිබ්බ වසන්ත හෝ ගිම්හාන සෘතු වල සිද්ධ වෙන්න ගොඩක් ඉඩ තියෙනවා.

(පස්වන ඉඟිය) බෙත්ලෙහෙමේ තාරකාව

මේ තරුව ස්භාවික සංසිද්ධියක්, දිව්‍යමය සංසිද්ධියක් හෝ මේ දෙකම වෙන්න පුළුවන්. බෙත්ලෙහෙමේ තාරකාව අහසේ සලකුණක් විතරක් නෙවෙයි ජනතාවට පණිවිඩයක් ගෙනාව.

පොදුවේ ගත්තහම මේ සිදුවීම ගොඩක් අසාමාන්‍යය යි. මේ කාලේ ජෝතිර්වේදියෝ වල්ගා තරුවක් දර්ශනය වෙන එක යහපත් සැලකුනකට වඩා සලකනු ලැබුවේ අසාමාන්‍ය අසුබ සිදුවීමක් ලෙසයි. ඒ නිසා මේ පිළිබඳව හොයා බලපු විද්වතුන් කියනවා මේ සිදුවීමට මූලික වුණේ ග්‍රහලෝක දෙකක් එක පෙළට පිහිටීමක් කියලා. මේ ග්‍රහලෝක

දෙක වුණේ බ්‍රහස්පති හා සෙනසුරු ග්‍රහයන් දෙදෙනා බවත් මෙහෙම සිදුවීමක් ක්‍රිස්තු පූර්ව 7 දී පමණ සිදුවෙලා තියෙන බවටත් ඉතිහාසගත තොරතුරු පිරික්සීමේ දී හොයාගෙන තියෙනවා. සාමාන්‍යයෙන් මෙවන් සිදුවීමක් මාසයකටත් දින හතක් අතර කාලයක් පුරා පවතින්න පුළුවන්.

(හයවෙනි ඉඟිය) බිළිඳුන් මැරීම

හයවෙනි ඉඟිය වන්නේ පිලාත් රජු විසින් බිළිඳුන් මැරීමට නියම කිරීමයි. ඉතිහාසගත වාර්තාවලට අනුව මහා හේරෝද් රජු උපත ලබන්නේ ක්‍රිස්තු පූර්ව හැත්තෑ දෙකේ දී එලෙසම ඔහු ක්‍රිස්තු පූර්ව හතරෙදි මරණයට පත් වෙනවා.

ඔහුගේ රාජ්‍ය කාලය ලෙස සඳහන් වන්නේ ක්‍රිස්තු පූර්ව 37-4 අතර කාලය. තව සමහරු කියනවා ඔහු ක්‍රිස්තු පූර්ව 36 යේ ඉඳලා 1 වෙනකම් රජකම් කළා කියලා. හෙරෝද් රජ්ජුරුවන්ට හම්බවෙන්නට තාරකාව පසුපස ආ රජතුන් කට්ටුව ජෙරුසලමේ රජමාළිගාවට ප්‍රවිෂ්ඨ වෙනවා. දේව වචනය විමසා බලන රජ්ජුරුවෝ කියනවා බිළිඳා ඉපදුනේ බෙත්ලෙහෙමේ නගරයේ කියලා. ඒ අනුව යන රජතුන් කට්ටුවට ගෙදර ඉඳපු ජේසු බිළිඳාව හම්බවෙනවා.



''එකල හෙරොද් ශාස්ත්‍රවන්තයන් රහසින් කැඳවා, තාරකාව පෙනුණු වේලාව ඔවුන්ගෙන් හොඳින් දැනගෙන, ඔබ ගොස් ඒ ළදරුවා ගැන හරි ලෙස විමසන්න ඔබ විමසා සොයාගත් පසු මාත් ගොස් උන්වහන්සේට නමස්කාර කරනු පිණිස මටත් දන්වන්න කියා ඔවුන් බෙත්ලෙහෙමට යැවී ය. රජුගේ බස් අසා ඔවුහු පිටත් ව ගියහ. පෙරදිග දී ඔවුන් දුටු තාරකාව, ළදරුවා සිටි තැනට අවුත් ඉහලින් නවතිනතුරු ඔවුන්ට පෙරටුවෙන් ගියේ ය. තාරකාව දැක ඔවුහු අතිශයින් ප්‍රීති ප්‍රමෝද වූහ. ඔවුහු ගෙට පිවිස, ළදරුවා සිය මව වූ මරියතුමී හා සමඟ සිටිනු දැක, පසඟ පිහිටුවා වැඳ, සිය කරඬු ඇර රන් ද තුවාරලා ද ගන්ධ රසය ද යන පඬුරු උන් වහන්සේ ට පිදූ හ.''

මතෙව් 2/7-10

මේ වෙද්දී ජුසේ තුමා ගෙදර හිටියේ නෑ සමහර වෙලාවට වැඩකට ගිහිල්ලා වෙන්නට පුළුවන්. ඒ වගේම මේ රජතුන් කට්ටුවට ජෙරුසලමට එන්නට ගත වූ කාලය ආසන්න වශයෙන් අවුරුද්දකුත් දෙකකුත් අතර කාලයක් වෙන්නට පුළුවන් මොකද වර්තමානයේ වගේ ප්‍රධාන මාවත් ප්‍රවාහන පහසුකම් නොතිබුණු කාලයක දීර්ඝ ගමනකට මේ වගේ කාලයක් ගත වෙන්නට පුළුවන් ඒ නිසා තමයි රජ්ජුරුවෝ නියම කරන්නේ අවුරුදු දෙකට අඩු දරුවන් ව මරා දමන්නට කියලා හෙරෝද් රජ්ජුරුවෝ මරණය පාවිච්චි කරනවා ජීවිතය පරාජය කරන්නට නමුත් පරාජය වෙන්නේ හෙරෝද්මයි. ඉතිහාසගත වාර්තාවලට අනුව ඔහු තමන්ගේ පුතුන්ව පවා මරණයට පත් කරනවා රජකම ආරක්ෂා කරගන්නට.

''ඊශ්‍රායෙල් බාල වියේ දී මම ඔහුට ප්‍රේම කෙළෙමි. මා පුත් ඔහු මිසරයෙන් කැඳවා ගතිමි.''

හොසියා 11/1-3

සිහිනයකින් දන්වනු ලැබ ජුසේතුමා තම භාර්යා ව වූ මරියාවන්ද තම දරුවාව ද රැගෙන මිසරයට පලා යනවා ඒ ගිහිල්ලා රජ්ජුරුවන්ගේ මරනය දක්වා සැඟවී ඉන්නවා ආපහු මේ අය එන්නේ රජ්ජුරුවෝ මැරුණට පස්සේ ඒ අනුව බලද්දී පැහැදිලි වෙනවා ජේසුස් වහන්සේගේ උපත සිද්ධ වෙන්නට ඇත්තේ ක්‍රිස්තු පූර්ව 6 ත් 4ත් අතර කාලයේදී කියලා. භූගෝල විද්‍යාත්මකව බලද්දී ජෙරුසලම ඉඳලා මිසරයට ගුවනින් සැතපුම් 433 ක් දුරයි. ඒක ආසන්න වශයෙන් කිලෝ මීටර 696 ක් මේ දුර ගොඩබිමින් බලද්දී ආසන්න වශයෙන් සැතපුම් හත්සිය තිස් දෙකක් ආසන්න වශයෙන් මේ දුර කිලෝමීටර 1178 ක් මේ සාධකත් එක්ක බලද්දි අපිට පැහැදිලි වෙනවා. ඒකට හේතුව වන්නේ ජේසුස් වහන්සේ උපන් කාලයේ මේදුර යන්න අවම වශයෙන් මාස 6

වත් ගියානම් කියලා හිතද්දී ජේසුස් වහන්සේ ක්‍රිස්තු පූර්ව 6-4 අතර කාලයේ දී ඉපදෙන්නට ඇති කියලා.

(හත්වෙනි ඉඟිය) ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ සේවය

හත්වෙනි ඉඟිය සපයන්නේ ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ සේවය මගින් මේ පිළිබඳව ශු. ලූක් තුමාගේ ශුභාරංචියේ තුන්වෙනි පරිච්ඡේදයේ 23 වන වගන්තියේ සඳහන් වෙනවා. ජේසුස් වහන්සේ සිය සේවය අරඹන විට අවුරුදු තිහක් පමණ වයස්ව සිටි සේක. උන් වහන්සේ ජෝසෙප්ගේ පුත්‍රයා යයි ඔවුහු සිතූ හ. ජෝසෙප් හේලීගේ පුත්‍රයා ය. ජුදා සම්ප්‍රදායට අනුව පුද්ගලයෙකු වැඩිහිටියෙකු ලෙස පිලි ගන්නේ වයස අවුරුදු තිහේ දී ය. එලෙසම පූජකයෙකු විම සඳහා වයස අවුරුදු 30 සම්පූර්ණ විම අත්‍යවශ්‍ය කරුණකි.

ජේසුස් වහන්සේ ඉපදෙන්නේ ස්නාවක ජොහාන් තුමාට මාස හයකට පස්සේ. ඒ උන් වහන්සේ මව් කුස පිලිසිඳ ගන්නේ මාස හයකට පස්සේ වීම නිසයි. මේ අනුව බලද්දිස්නාවක ශාන්තතුමා පිළිසිඳ ගන්නේ ජූනි මාසේ ක්‍රිස්තු පූර්ව 6 යේ කියලා අපි සැළකුවොත් එහෙම ජේසුස් වහන්සේ මව් කුසේ පිලිසිඳ ගන්නේ ක්‍රිස්තු පූර්ව 6 යේ දෙසැම්බර් මාසේ. එතකොට උන් වහන්සේ ඉපදෙන්නට ඕන ආසන්න වශයෙන් ක්‍රිස්තු පූර්ව පහේ දී සැප්තැම්බර් මාසේ විතර ජෙරුසලමේ තාරකාව පළිබඳ සාක්ෂි බලද්දී අපිට පැහැදිලිව පේනවා. ඒ තාරකාව පායලා තියෙන්නේ ක්‍රිස්තු පූර්ව හයත් පහත් අතර කාලෙදි කියලා. ඒ වගේම අධිරාජ්‍යය විසින් දරුවන් ඝාතනය කරලා තියෙන්නෙත් ක්‍රිස්තු පූර්ව පහේදි එඩේරුන් සීත කාලේ පිට්ටනි වල බැටළුවන් රකින්නේ නැති නිසා උන් වහන්සේ ඉපදුනේ දෙසැම්බර් මාසේ වෙන්නටත් බැහැ අගෝස්තුස් අධිරාජයාගේ සංගණනයත් පුද්ගලයන්ට එහා මෙහා යන්නට පුළුවන් සුදුසු කාලයක දී කළා යැයි අපි හිතුවොත් එහෙම ඒකත් මේ සීතල දෙසැම්බර් කාලය වුණා කියලා පිළිගන්නට බැහැ. ජොහාන්තුමාගේ සුභ ආරංචියට අපි ඇහුම්කන් දෙද්දී අපි දකිනවා වචනය අප අතර ඉපදුනේ කියලා කියනවා. ඒ කියන්නේ උන්වහන්සේගේ උපත සිද්ධ වෙන්නට ඇත්තේ ජුදා මංගල්‍යයක් වන Feast of Tabernacle සමරන කාලයක විය යුතුයි වර්ථමානයේ භාවිත වන ක්‍රිස්තු වර්ෂ ක්‍රිස්තු පූර්ව කැලැන්ඩරය නිර්මාණය කරන්නේ පුජකයෙක් වුණු ඩයිනෝසියස් ඉන්දිකිවස් විසින් ක්‍රිස්තු වර්ෂ 6 වන ශත වර්ෂයේ දී. ඔහු විසින් ජේසුස් වහන්සේ උපත ගණනය කරන්නේ බයිබලය දිහා බලලා නමුත් බොහෝ සාධක තිබුණේ නැහැ. මේ අවස්ථාවේදි ඔහු විසින් ඓතිහාසික සාධක හරි ආකාරව නිර්ණය කරලා තිබුණේ නැහැ. ඒ නිසා ඔහු අතින් වෙච්ච වැරැද්ද පසු කාලීනව තෙරෙද්දී එය ආපසු හැරවිය නොහැකි තරම් විශාල වරදක් බවට පත්වෙලා තිබුණා. නැවත වරක් ක්‍රිස්තු වර්ෂ ක්‍රිස්තු පූර්ව ක්‍රමය වෙනස් කරන්න ගියොත් ඉතිහාසගත ප්‍රශ්නයක් ඇති වන නිසා ඒ එලෙසම පවත්වාගෙන ආවත් වහන්සේගේ උපත බොහෝ ඉතිහාසඥයන් විසින් ක්‍රිස්තු පූර්ව පහේ දී වුනාහි කියලා සඳහන් කරනවා. ඉතිහාසගත තොරතුරුවලට අනුව හෙරොද් රජ්ජුරුවෝ මිය යන්නේ ක්‍රිස්තු පූර්ව හතරවන අවුරුද්දේ දීය. ඒ අනුව බලද්දිත් අපිට පේනවා ක්‍රිස්තු පූර්ව පහේ ජේසුස් වහන්සේ ඉපදෙන්නට අනිවාර්යෙන්ම ඉඩ කඩ තියෙනවා කියලා. ඒකට හේතුව ජේසුස් වහන්සේ තම මව හා පියා එක්ක ඊජිප්තුවේ කාලයක් වාසය කරන නිසා. එලෙස ම විරෝධ රජු අණ කරන්නේ අවුරුදු දෙකට අඩු සියලු දරුවන් මරා දමන්නට කියලා. ඒකට හේතුවත් අනුව බලද්දී අපිට පේනවා හයවන වසරත් හතරවන වසරත් අතර ඉපදෙන්නට ඇති කියලා.

මේ ගවේෂණාත්මක ලිපිය මඟින් හෙළි කරන්නට උත්සාහ දැරුවේ. අද දවසේ අපි දෙසැම්බර් මාසේ නතර සැමරුවත් හරි නත්තල එන්නටර්නේ දෙසැම්බර් මාසේ නොවන බවත් ඒ පසුකාලීන ආදේශකයක් බවයි. උපන් දිනේ කවදා වුණත් ක්‍රිස්තුස් වහන්සේගේ උපතේ ආලෝකය ලෝකයට කළ වූ අනූපමේය මෙහෙය හා ලෝකය ගලවා ගැනීමට උන්වහන්සේගේන් වූ බලපෑම වෙනස් කරන්නට බැහැ.

ගයාන් හිරන්ත පියතුමා

නත්තලේ සැබෑ ආලෝකය

පෘථිවි තලයට ශීත සෘතුව ළඟා වී දින කෙටි වීමත් සමඟ නත්තල් සමය පැමිණෙන්නේ අන්ධකාරයේ උණුසුම් ආලෝකයක් මෙනි. නූතනයේ එය උත්සවශ්‍රියෙන් නැහැවී නේකවිද සැරසිලිවලින් සැරසී සිටියත් පරම්පරා ගණනාවක් පුරා දෝංකාර දුන් ගැඹුරු අධ්‍යාත්මික සත්‍යතාවයක් ඇත. එනම් ලෝකයේ ආලෝකය වන ජේසුස් වහන්සේගේ උපතයි. අවිනිශ්චිතතාවයේ බෙදීම් වලට ලක්ව බලාපොරොත්තු සුන් වූ කාලයක මෙම කිතු උපත තුළින්, අපට ගෙනෙන්නේ කල් පවත්නා බලාපොරොත්තුවක්ද? නොසැලෙන සාමයක් ද? කොන්දේසි විරහිත ප්‍රේමයක් ද? පිළිබඳ ගැඹුරු පණිවිඩයකි. ලොවටම ආලෝකයක් වූ උන්වහන්සේ අඳුරු ලොවක මුල් බැස ගත් පාපය නැමැති අන්ධකාරය ජය ගෙන ඇති බවත් එම දිව්‍ය ප්‍රේමය ලෝකයට ඇතුළු වූයේ බලය හරහා නොව නිහතමානී ගව ඔරුවක් හරහා බවද අපට මතක් කර දෙයි.

ආරම්භයේ සිටම ශු. බයිබලය දෙවියන් වහන්සේගේ පැමිණීමේ සහ සත්‍යයේ සංකේතයක් ලෙස ආලෝකය ඉදිරිපත් කරයි. යෙසායා ග්‍රන්ථයේ 9:2 හි එය මෙලෙස සඳහන් වේ. අන්ධකාරයේ ඇවිදින සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය. මෙම අනාවැකිය ඉටු වූයේ ජේසුස් වහන්සේ උපතේ දී වන අතර ශුද්ධවර ජොහාන්තුමාගේ සුභාරංචියේ 8:12 හිද මෙසේ පවසා ඇත. '' ලෝකයේ ආලෝකය මමය. මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය.'' මේ ආකාරයට ක්‍රිස්තුස් වහන්සේගේ උපතෙහි වැදගත්කම ඓතිහාසික සිදුවීමකට එහා ගිය අධ්‍යාත්මික හෙළිදරව්වකි. බිය ශෝකය හා අයුක්තියෙන් පිරුණු ලෝකයක උන්වහන්සේගේ ආලෝකයේ මඟ පෙන්වීමත් සමඟ ඇති වන නවමු බලාපොරොත්තුව පිළිබඳව ද මෙම කාලයේ දී සිහිපත් කරයි. එදා මරියතුමිය හා ජුසේතුමා කුසදරා සිටි දේව පුත්‍රයාද කැටුව බෙත්ලෙහෙමට යන අවස්ථාවේ දී පවා ඔවුන්ට සැනසීමක් හෝ ආරක්ෂාවක් පිළිබඳ නිශ්චිත භාවයක් නොතිබුණි. එහෙත් ඔවුන් ඇදහිල්ලෙන් ගමන් කලහ. සාමාන්‍ය එමෙන්ම නොසලකා හරින ලද එඩේරුන් තෝරා ගනු ලැබුවේ ක්‍රිස්තුස් වහන්සේගේ උපත පිළිබඳ පළමු නිවේදනය ජන ගත කරන්නටයි. එයින් විද්‍යාමාන වන නත්තලේ බලාපොරොත්තුව නම් දෙවියන් වහන්සේට කිසිවෙකු අමතක නොවන බවත් අප බලාපොරොත්තු සුන්ව සිටින අඳුරුතම අවස්ථාවේදී පවා දෙවියන් වහන්සේ අප සමඟ සිටින බවත් ය.


නත්තලේ පණිවිඩය ඒ හා සමානව කේන්ද්‍රීය වන්නේ සාමයයි. ගැටුම් නොමැතිකමට පමණක් නොව, කිතු සමිඳුන් අපට පිරිනමන ගැඹුරු ආත්මික සාමය අත්දකින්නටත්, මෙම වේගවත් සෝෂාකාරී ලොව තුළ අපේ බිය නිහඬ කර දේව අභිමුඛයේ විවේකය සොයා ගන්නටත් සිත් සාමය අහිමි වූවන් සොයා එය බෙදා හරින්නටත් අපට ඇරයුම් කරයි. උන් වහන්සේගේ සාමය තාවකාලික හෝ නොගැඹුරු නොවන නිසාම අප හදවතේ ඇති සබඳතා පරිවර්තනයක් කරා ගෙන යන්නේ ද මෙම සාමයයි.


සියල්ලටත් වඩා නත්තල යනු ආදරය වැළඳ ගැනීමයි. එය ඉතා බලවන්ත හා නිර්මල ප්‍රේමයක් වන අතර උනවහන්සේ ස්වර්ගයෙන් බැස අප අතර වාසය කිරීමට පැමිණියේ ය. එය ශුද්ධවර ජොහාන් සුභාරංචියේ 3:16 මෙලෙස ප්‍රකාශ කරයි. ''දෙවියන් වහන්සේ ලෝකයාට කෙතරම් ප්‍රේම කල සේක් ද කීවොත් ස්වකීය ඒක ජාතික පුත්‍රයාණන් වුවද ලොවට දෙවා වදාළ සේක.'' මෙම ප්‍රේමය කුසලතාව, ධනය හෝ තත්ත්වය මත පදනම් නොවේ. කරුණාව, දයානුකම්පාව, සමාවදීම හා ත්‍යාගශීලී බව අප ජීවිත තුළින් පිළිඹිබු කිරීමට ද අපව කැඳවයි. කොටු වූ රාමුවක් තුළ සමරන්නට සැරසෙන මෙවර නත්තල ද ඉන් ඔබ්බට ගිය එහි වූ අධ්‍යාත්මික හරය අප ජීවිත හරය කර ගනිමින්, අඳුරු තැනට ආලෝකයක් වන, සංවේදී ආදරණීය ක්‍රිස්තු අනුගාමිකයෙකු වීමට ද, කිතු සමිඳුන් ලොවට ගෙනා සාමය පණිවිඩය තුළ වූ නැවුම් බලාපොරොත්තු ඇති වන සුභ නත්තලක් වේවා!

ක්‍රිෂ්මි නවෝද්‍යා මෙනුසරණි
(ආධුනික සොයුරිය)
දොවිනිකානු කන්‍යාරාමය, මැල්සිරිපුර.




කි.එච්. බෙනුර යේමිත
4 වසර





මිලාන් යොහතන්
6 වසර





ජෙරෝම්
6 වසර



ලූෂේන් ලිවේරා
9 වසර









මෝල්ටාවේ ඩොමිනිකානු පැවිදි සොයුරියන්ගේ
ප්‍රධානත්වයෙන් මීසම් සේවක පියතුමන්ගේ
මග පෙන්වීමෙන් මැල්සිරිපුර මීසමේ පැවති ජීවිතාවබෝධ වැඩසටහන

මැල්සිරිපුර දිව්‍ය හෘදයේ තරුණ සමිතිය මෙවර ඉදිකළ
අඩි 25 ක් උස නත්තල් ගස